

# ශ්‍රී ලංකාවේ ස්ත්‍රී සමලිංගික, ද්වි ලිංගික, ට්‍රාන්ස් පුද්ගලයින් ප්‍රකාශ කරන පරිදි වෙනස්කොට සැලකීම සහ හිංසනය පිළිබඳ අත්දැකීම්

# [ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී සමලිංගික, ද්වි ලිංගික, ට්‍රාන්ස් පුද්ගලයින් ප්‍රකාශ කරන පරිදි වෙනස්කොට සැලකීම සහ හිංසනය පිළිබඳ අත්දැකීම් ]

"මට මතකයි පිරිමි දෙන්නෙක් මාව උරහිසින් තදකරලා අල්ලාගෙන, බිත්තියකට තදකරගෙන බඩට තදින් ගැහුවා. මම කොහොම හරි ඒ ගොල්ලන්ගෙන් බේරිලා, එක්කෙනෙකුගේ මූණට ගහලා එයාගේ තොල පැලුවා. ඊට පස්සේ තමයි ඒ අය මාව දාලා ගියේ. 'ආ, එයානම් නිකම්ම පරාජය බාරගන්න කෙනෙක් නෙමේ' කියමින් ... මා පෙරළා සටන් කරන බව ඒ ගොල්ලෝ දැන ගත්තට පස්සේ මාව දාලා ත්‍රී වීල් එකකට නැගලා පැනලා ගියා" යැයි පැවසුවා ය.

චමිලා සමග කළ සම්මුඛ සාකච්ඡාව,<br>
කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම,<br>
2010 සැප්තැම්බර් 18, ශ්‍රී ලංකාව.

**ශ්‍රී ලංකාවේ ස්ත්‍රී සමලිංගික, ද්වි ලිංගික, ට්‍රාන්ස් පුද්ගලයින් ප්‍රකාශ කරන පරිදි වෙනස්කොට සැලකීම සහ හිංසනය පිළිබඳ අත්දැකීම්**

ප්‍රථම මුද්‍රණය - මාර්තු 2014, කොළඹ, ශ්‍රී ලංකාව.

© කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම

# [ #01 අන්තර්ගතය ]


ස්තුතිය v

පෙරවදන vii

01. හැඳින්වීම 9

02. ක්‍රමවේදය 14

03. පාරිභාෂිත යෙදුම් 18

04. සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ පුද්ගලයින්ගේ තොරතුරු 20

05. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ පසුබිම 24

06. රාජ්‍ය නොවන පාර්ශවයන්ගෙන් සිදුවන හිංසනය සහ වෙනස්කොට සැලකීම 29

a] චිත්තවේගික හිංසනය 29

i වාචික අපයෝජනය 33

ii සංස්කෘතික/ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සම්මතයන් හි බලපැවැත්ම සහ බැඳුණු හිංසනය 36

b] ශාරීරික හිංසනය 36

c] ලිංගික ප්‍රචණ්ඩත්වය 38

d] සමීපතම සහකරුවාගෙන් සිදුවන ප්‍රචණ්ඩත්වය 42

e] රැකියා ස්ථානයේ සිදුවන වෙනස්කොට සැලකීම 45

07. රාජ්‍ය නිලධාරීන් මගින් සිදුවන ප්‍රචණ්ඩත්වය සහ වෙනස්කොට සැලකීම 50

08. සහන ලබාගැනීමේ මාර්ග 53

09. සක්‍රීය ලෙස ප්‍රතිචාර දැක්වීම, මුහුණදීම 56

a] බලපෑමක් සහිත ප්‍රතිචාර 56

b) ඉවසා සිටීමෙන් දක්වන ප්‍රතිචාරය. 60

c) සක්‍රීය/ක්‍රියාකාරී ප්‍රතිචාර 62

| | | |
|---|---|---|
| 10. | ශ්‍රී ලංකාවේ ස්ත්‍රී සමලිංගික, ද්විලිංගික සහ ට්‍රාන්ස් පුද්ගලයින්ට බලපාන නීති | 68 |
| | a) දණ්ඩ නීති සංග්‍රහයේ 365A වගන්තිය - බරපතල අසභ්‍යතාව | 68 |
| | b) 399 වගන්තිය - දණ්ඩ නීති සංග්‍රහය - පුද්ගලාරූඪය මගින් රැවටීම | 70 |
| | c) 1842 අයාල ආඥා පනත | 71 |
| | d) මූලික අයිතිවාසිකම් | 72 |
| | e) ජාත්‍යන්තර ගිවිසුම් | 74 |
| 11. | නිර්දේශ | 75 |
| 12. | ආශ්‍රිත ග්‍රන්ථ | 78 |
| 13. | උප ග්‍රන්ථ | 81 |
| | උප ග්‍රන්ථ A - පුද්ගල තොරතුරු | 82 |
| | උප ග්‍රන්ථ B - පාරිභාෂිත වචන මාලාව | 85 |
| | උප ග්‍රන්ථ C - ලිංගිකත්වය පිළිපඳ මාධ්‍ය තුළින් වාර්තාව වූ ලිපි/ලේඛන | 92 |

# [ ස්තුතිය ]

මෙම පර්යේෂණය සාර්ථක කරගැනීම සඳහා ඉදිරිපත් වී, බලාපොරොත්තු සහිත, අපේක්ෂා සුන් වූ, අභීත සහ සත්‍ය සිදුවීම් ඇතුළත් කතන්දර, අප සමඟ කැමැත්තෙන් බෙදාගත් සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ සියළුම දෙනාට, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායමේ ස්තුතිය පළ කරමු. එමෙන්ම පර්යේෂණය සඳහා දායක වූ, උනන්දුවක් දැක් වූ පාර්ශවයන්ට ද අපගේ කෘතඥතාවය හිමි වේ. මෙම පර්යේෂණය පුරාවටම මගපෙන්වමින් සහ සහයෝගය ලබාදුන් පුරුෂ සමලිංගික සහ ස්ත්‍රී සමලිංගික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර කොමිසමට (International Gay and Lesbian Human Rights Commission - IGLHRC) “කාන්තා ක්‍රියාකාරී කණ්ඩායමේ විශේෂ ස්තුතිය පළ කරන අතරම මෙවැනි පර්යේෂණයක් පිළිබඳව අප තුළ වූ අදහස යථාර්ථයක් කරගැනීමට අපට මූල්‍යමය සහාය ලබාදුන් විශ්ව කාන්තා අරමුදල (Globle Fund for Women), පුරුෂ සමලිංගික සහ ස්ත්‍රී සමලිංගික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර කොමිසම සහ දකුණු ආසියානු කාන්තා අරමුදලට (South Asian Women's Fund) අපගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමු.

ලිංගික නැඹුරුව, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය,
ප්‍රකාශනය සහ අර්ථකථනයන් මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය
සහ වෙනස්කොට සැලකීම්වලින් තොරව සිටීමේ අයිතිය
උදෙසාවන ක්‍රියාකාරිත්වයන්හි දී අපට මඟ පෙන්වමින්
නිරන්තරයෙන් ම නැවුම් අදහස් ලබාදුන්, සුළුතර
ලිංගික අයිතිවාසිකම් පිළිබඳ කතිකාව සමාජගත කිරීමෙහි
ලා පුරෝගාමී ක්‍රියාකාරිනියක වූ ද කාන්තා ක්‍රියාකාරී
කණ්ඩායමේ ප්‍රාරම්භක සාමාජිකාවක වූ ද ආදරණීය

# [ සුනිලා අබේසේකර සහෝදරියට ]

(1952-2013)

මෙම පර්යේෂණ කෘතිය පිළිගන්වන්නෙමු.

# [ පෙරවදන ]

ලිංගික නැඹුරුව පිළිබඳ විශේෂයක් නොකොට පොදුවේ සමානාත්මතාවය සඳහා ඇති අයිතිය, මූලික මානව අයිතිවාසිකමක් බව වැඩි වැඩියෙන් ලෝකයා විසින් අද පිළිගනිමින් සිටී. මෑත ඉතිහාසයේ, ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සම්බන්ධ අයිතීන් පිළිබඳ ගැටළුවල සැලකිය යුතු වැඩිවීමක්, ජාත්‍යන්තර මානව හිමිකම් උද්දේෂණ ක්‍රියාවලිය තුළ දක්නට ලැබේ. 2008 වර්ෂයේ දී යෝජනා කරන ලද ස්ත්‍රී සහ පුරුෂ සමලිංගික, ද්වි ලිංගික සහ ට්‍රාන්ස් පුද්ගලයින්ගේ ලිංගික අයිතීන්ට සහාය දෙන යෝජනාවලිය සඳහා දෑනට අත්සන්කොට ඇත්තේ රටවල් 94 ක් පමණකි.

2011 වර්ෂයේ දී මානව හිමිකම් කවුන්සිලය විසින් ස්ත්‍රී සහ පුරුෂ සමලිංගික, ද්වි ලිංගික සහ ට්‍රාන්ස් පුද්ගලයින්ගේ (LGBT) අයිතිවාසිකම් සම්බන්ධව යෝජනාවලියක් සම්මත කරන ලදී. (දකුණු අප්‍රිකාව විසින් යෝජනා කරන ලද). 2006 වර්ෂයේ දී ඉන්දුනීසියාවේ යෝග්‍යාකර්තා නුවරට රැස්වූ මානව හිමිකම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛයින් වන මේරි රොබින්සන්, අස්මා ජෙහාන්ගිර්, ෆ්‍රිල් අල්ස්ටින්, මැන්ෆ්‍රේඩ් නොවාක් සහ පෝල් හන්ට් විසින් ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යොදාගැනීම පිළිබඳ මූලික සිද්ධාන්ත 29 ක් සකස් කරන ලදී. මෙමගින් පරිපූර්ණ ජාත්‍යන්තර සම්මුතියක් නිර්මාණය කිරීමෙහි ලා අඩිතාලමක් ලබා දී ඇතැයි විශ්වාස කෙරේ.

දඬුවම් ලබාදීම සහ සමහර අවස්ථාවලදී මහජන සහයෝගය ඇතිව LBT සමාජයට මුහුණ පෑමට සිදුවන ප්‍රචණ්ඩත්වය මෙම ප්‍රශ්නයේ දී විශේෂවන එක් පැතිකඩකි. 2011 වර්ෂයේ නොවැම්බර් මස ප්‍රකාශයට පත් වූ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්ගේ වාර්තාව මගින් ලෝකයේ බොහෝ ප්‍රදේශවල ස්ත්‍රී සමලිංගිකයින්, පුරුෂ

සමලිංගිකයින්, ද්විලිංගිකයින් සහ ට්‍රාන්ස් පුද්ගලයින්ට අත්දැකීමට සිදුවන භයානක ප්‍රචණ්ඩත්වය සහ හිංසනය සම්බන්ධයෙන් සවිස්තරව සඳහන් වේ.

ශ්‍රී ලංකාවේ කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම විසින් මෑතකදී නිමාකරන ලද ශ්‍රී ලංකාවේ LBT පුද්ගලයින් මුහුණ දෙන ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ගුණාත්මක පර්යේෂණය තුළ ශාරීරික හිංසනය, ලිංගික ප්‍රචණ්ඩත්වය, චිත්තවේගික ප්‍රචණ්ඩත්වය, සමීපතම සහකරුගෙන් සිදුවන ප්‍රචණ්ඩත්වය සහ රැකියා ස්ථානයේ දී සිදුවන ප්‍රචණ්ඩත්වය පිළිබඳව සිද්ධි අධ්‍යනයන් මගින් විස්තර කර ඇත. එය සත්‍ය වශයෙන්ම කම්පා කරවන වාර්තාවකි. LBT පුද්ගලයින්ගේ මූලික අයිතීන් උල්ලංඝණය කරමින් ඔවුන් අපරාධකරුවන් බවට පත්කරන පවතින නීති රාමුව පිළිබඳ විවේචනයක් ද මෙම වාර්තාවෙ හි අඩංගු වේ.

මෙම අධ්‍යනය, LBT පුද්ගලයින් මුහුණ දෙන වෙනස්කොට සැලකීම සහ හිංසනය පිළිබඳව දැනුවත්භාවයක් ලබාදීම සඳහා ආධාරවනු ඇතැයි මම විශ්වාස කරමි. දැනුවත්භාවය ඇති වූ පසු එය ක්‍රියාවට නැංවිය යුතුය. මෙම වාර්තාවේ සඳහන් නිර්දේශ සම්බන්ධයෙන් ගැඹුරින් සිතා බැලිය යුතුවන අතර මානව අයිතීන් සහ ජනතාවගේ මූලික ගෞරවය පිළිබඳව විශ්වාස කරන පුද්ගලයින් විසින් මෙම න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යා යුතුව ඇත.


## ආචාර්ය රධිකා කුමාරස්වාමි

**කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ හිටපු සහ එක්සත් ජාතීන්ගේ මහලේකම් යටතේ එක් වතාවක් සිටි විශේෂ වාර්තාකරු සහ ළමුන් සහ යුද ගැටුම් සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මහලේකම්ගේ විශේෂ නියෝජිත**

# [ # 01 හැඳින්වීම ]

''මා හිතන විදිහට මට ගොඩාක්ම වෙනස් කොට සැලකුවේ මගේ පවුලේ අය. ඔවුන් මට මානසිකව වාචිකව වෙනස් කොට සැලකුවා. ඔවුන් මා ස්ත්‍රී සමලිංගිකයෙකු ලෙස පිළිනොගත්තා සේම, මා පුරුෂයකු සමග සිටීම ඇරුනුකොට වෙන දෙයක් පිළිගැනීම ප්‍රතික්ෂේප කළා. ඔවුන් උපරිමයෙන්ම මගේ ලිංගිකත්වය පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම සහ වසන් කිරීම කරනු ලැබුවා. මට ඇත්තටම ප්‍රශ්න එන්නේ මගේ පවුලේ අයගෙන්. තවමත් මේවා සිදුවෙමින් පවතිනවා.''

මල්ලිකා : හතලිස් වියැති, ස්ත්‍රී සමලිංගිකයකු ලෙසින් තමාව හඳුන්වා ගනියි.

''මගේ සහකාරියගේ පවුලේ අය විසින් ඇය සුව කිරීමට, ඇයට බලෙන් පෙති සහ බෙහෙත් දී තිබෙනවා. ඔවුන් ඇයව විෂම ලිංගික පුද්ගලයකු කිරීමට දැඩි උත්සාහයක යෙදුණා. දෙවතාවක් ඇයට විදුලිසැර දීමේ ප්‍රතිකාරය ද කරනු ලැබුවා.''

රොෂ්මි : තිස්නව හැවිරිදි ස්ත්‍රී සමලිංගිකයෙකු ලෙසට තමන් හඳුන්වා ගනියි.

1. සංක්‍රාන්ති ලිංගිකයින් හැඳින්වීම සඳහා භාවිතා කරනු ලබයි (ස්ත්‍රී සිට පුරුෂ කරා - ට්‍රාන්ස් පුද්ගලයින්) ඇතුලත් වේ.

පෞද්ගලිකත්වය සහ රහසිගතභාවය සුරැකීම සඳහා නිර්නාමික නම් ගම් භාවිතාකොට ඇත.

2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලය තුළ, ස්ත්‍රී සමලිංගිකයින්, ද්වි ලිංගිකයින් සහ ට්‍රාන්ස් (LBT) පුද්ගලයින්[3] පිළිබඳව උද්දේශන ක්‍රියාකාරකම් හි යෙදෙන සහ සහාය සපයන කොළඹ පිහිටි රාජ්‍ය නොවන සංවිධානයක්වන කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම (WSG) විසින් LBT[2] පුද්ගලයින්ට සුවිශේෂයෙන් මුහුණ දීමට සිදුවන හිංසනයන් සහ වෙනස් කොට සැලකීම පිළිබඳ අත්දැකීම් ලේඛනගත කරන ලදී.

පුරුෂ සහ ස්ත්‍රී සමලිංගික මානව අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර කොමිසමේ (IGLHRC) මූලිකත්වයෙන් රටවල් 5 ක් සම්බන්ධකොට ගෙන ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් වන මෙම පර්යේෂණය, ලිංගික නැඹුරුව, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හෝ ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය අර්ථකතනය සහ ප්‍රකාශනය මත පදනම්ව විෂම ලිංගික සම්මතයට පටහැනි ස්ත්‍රීන් සහ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින්ට එරෙහිව සිදුවන හිංසනයන් පිළිබඳව සාකච්ඡා කිරීමේ ආසියාතික ක්‍රියාකාරකම් යන තේමාව යටතේ මෙම පර්යේෂණය ආරම්භ කරන ලදී. කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, LBT පුද්ගලයන් සමඟ විස්තරාත්මක සම්මුඛ සාකච්ඡා 33 ක් ද, අදාළ පාර්ශවයන් (උදා: නීතිඥයන්, වෛද්‍යවරුන්, මනෝ උපදේශකවරුන්, මාධ්‍ය නියෝජිතයින්, හාම්පුතුන්, ආගමික නායකයින්, අධ්‍යාපන ආයතන නියෝජිතයින්, රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය සේවකයන්) සමග විස්තරාත්මක සම්මුඛ සාකච්ඡා 54 ක් ද පවත්වන ලදී. පහත දැක්වෙන තේමාවන් යටතේ ප්‍රශ්න ව්‍යුහගත කරන ලදී. මානසික හිංසනය, ශාරීරික හිංසනය, ලිංගික හිංසනය, සමීපතම සහකරුවන්ගෙන් සිදුවන හිංසනය, රැකියා ස්ථානයේ දී සිදුවන වෙනස්කොට සැලකීම, රජය මගින් සිදුවන හිංසනය, සහන ලබා ගැනීමේ හැකියාව සහ මැඩපැවැත්වීමේ ක්‍රියාමාර්ග.

මෙම සම්මුඛ සාකච්ඡාව මගින් LBT පුද්ගලයින්ගේ මානව හිමිකම් සම්බන්ධයෙන් මෙතෙක් ශ්‍රී ලංකාවේ වාර්තාගත නොවුණු ඉතාම තීරණාත්මක දර්ශක අනාවරණය විය.

2. මෙම පර්යේෂණය සඳහා අප විසින් පිරිමි සහ ස්ත්‍රී සංක්‍රාන්ති ලිංගිකයන් යොදා ගෙන ඇත. මෙම පුලුල් පදයට ස්ත්‍රී සමලිංගිකයින්. ස්ත්‍රී ද්වි ලිංගිකයින් සහ ට්‍රාන්ස් (ස්ත්‍රී සිට පුරුෂ කරා සංක්‍රාන්ති වූ පුද්ගලයින්) ඇතුලත්වේ. ස්ත්‍රී සමලිංගිකයින්, ද්වි ලිංගිකයින් සහ ට්‍රාන්ස් පුද්ගලයින් හැඳින්වීම සඳහා මෙතැන් සිට මෙම ලියවිල්ලෙහිදී LBT යනුවෙන් භාවිතා කරනු ලබයි.

**ශ්‍රී ලංකාවේ LBT පුද්ගලයින් බොහෝ විට චිත්තවේගී සහ මානසික හිංසනයන්ට ලක්වන්නේ ඔවුන්ගේ ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත තීරණය වන අනන්‍යතාවය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත තීරණය වන අර්ථකතනය සහ ප්‍රකාශනය හේතුකොට ගෙන බව පර්යේෂණයේ ප්‍රධාන සොයාගැනීමකි.** සම්මුඛ සාකච්ඡාවට භාජනය කරන ලද 33 දෙනාගෙන් සියල්ලන්ම පාහේ කිසියම් ආකාරයක චිත්තවේගී සහ මානසික හිංසනයක් අත්දකින ලද අතර එයට වාචික නොවන/නිහඬ නින්දාව,  හෙලිකරන බවට තර්ජනය කිරීම (blackmail) ''ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සම්මතයන් බලෙන් පැටවීම, ආගමික වශයෙන් පහත්කොට සැලකීම, පෞද්ගලිකත්වය ඇහිරීම, සමාජගත වීමට බාධා පැමිණවීම, නොසලකා හැරීම, පවුලේ අය සහ යහළුවන් සමඟ තිබෙන සම්බන්ධතා බිඳ දැමීම සහ හැසිරීම පාලනය කිරීම ඇතුළත් විය.

**දෙවන සොයාගැනීම නම්, සම්මුඛ සාකච්ඡා පවත්වන ලද සියලුදෙනාම පාහේ පිළිගත් පරිදි, චිත්තවේගී හිංසන සිදු කරන ප්‍රධානතම (perpetrators) අපරාධකරුවන් පවුලේ සාමාජිකයින් බවයි.** සමහර සිදුවීම් වලදී, සම්මුඛ සාකච්ඡාවට භාජනය කරන ලද පුද්ගලයින් චිත්තවේගී හිංසනය අත්දකින ලද්දේ පවුලේ සාමාජිකයින්ගෙන් බව හෙළිකිරීමට පසුබට නොවූ අතර පවුලේ සාමාජිකයකු හැඳින්වීමේ දී සහ හිංසනය පිළිබඳව එඩිතරව කතා කිරීමේ දී 'අපරාධකරු' යන පදය ඔවුන් විසින් ඒ සඳහා භාවිතා නොකරන (භාවිතා කිරීමට අකමැති) ලදී. මෙම අකමැත්ත සඳහා හේතු වූ කරුණු පිළිබඳව මෙම පර්යේෂණය අනාවරණය කරන අතර, එය මෙහි එන සොයාගැනීම්වල එක් වැදගත් අංගයක් ද වේ.

මෙම සොයාගැනීම් මගින් පෙනී යන්නේ, ශ්‍රී ලාංකික ස්ත්‍රීන් සාක්ෂරතාවය සහ අධ්‍යාපනය වැනි සංවර්ධන ඉලක්කයන් අතර, ඉහළින් සිටින නමුත්, ඔවුන්ට පීතෘ මූලික ආකල්පවලට යටත් වූ ගතානුගතික සමාජයීය පරිසරයක ජීවත්වීමට තවදුරටත් සිදුවී තිබෙන බව ය. එමෙන්ම ලාංකික සමාජයේ විෂම ලිංගික විවාහයන් උනන්දු කරනවා මෙන්ම වෙන්වීම සහ දික්කසාදය අධෛර්යය කරවන අතර, පවුලෙන් සිදුවන හිංසනය මෙන්ම සහකරුවාගෙන් සිදුවන හිංසනය සඟවා තබයි. මෙම පරිසරය ස්ත්‍රී නිදහස, විශේෂයෙන් ම ලිංගික ස්වාධීනත්වය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය වෙනස්කම් නොසලකා හරින හෝ අධෛර්යයමත් කරන, ස්ත්‍රීන්ට සමාජයට පිවිසීමට ඇති ඉඩකඩ සීමා කිරීම සහ ස්ත්‍රීන්

පාලනය කිරීම සඳහා පවුලේ පෞද්ගලික පරිසරය ප්‍රධාන වශයෙන් යොදාගන්නා අතර එය බොහෝ විට ඔවුන්ට තිබෙන වඩාත් පීඩාකාරී ආයතනය වනු ඇත. LBT පුද්ගලයින්ට වෙනත් ආකාරයක සහායක් ලබාගැනීමට නොහැකිවීම මෙම තත්ත්වය වඩාත් උත්සන්න වීමට හේතු වී තිබේ. (උදාඃ ඔවුන්ට, ඔවුන්ගේ යහළුවන්ගෙන් උදව් ඉල්ලීමට නොහැකි අතර, ආගමික ස්ථාන හෝ පොලීසිය සහ ස්ත්‍රීන්ට සහන සලසන ස්ථාන, ආයතන වැනි රජයේ ආයතන වෙත ළඟාවීමට ද නොහැක.)

චිත්තවේගී හිංසනයට අමතරව, සම්මුඛ සාකච්ඡාවට ලක් වූ පුද්ගලයන්ගෙන් තුනෙන් එකකට වඩා වැඩි පිරිසක් (33 දෙනෙකුගෙන් 26 දෙනෙකු) ශාරීරික හිංසනය අත්විඳ ඇතැයි වාර්තා විය. කරුණු තුනක් පදනම්ව මෙම ව්‍යාපෘතිය මගින් ශාරීරික හිංසනය සම්බන්ධයෙන් වූ අත්දැකීම්වල විස්තර ලබාගන්නා ලදී.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සහ ලිංගික නැඹුරුව පිළිබඳ අනාවරණය වීම (Coming out) සම්බන්ධයෙන් බාහිර සමාජය දක්වන ප්‍රතිචාර, තම තමන්ගේ ලිංගික සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය ප්‍රශ්න කරන සම්බන්ධතාවයක රැඳී සිටීම සම්බන්ධයෙනි. සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ LBT පුද්ගලයින් කුමන හෝ ආකාරයේ ශාරීරික හිසංනයකට ලක්වූවේ දැයි පර්යේෂකයින් විසින් ඔවුන්ගෙන් විශේෂයෙන් ම ප්‍රශ්න කරන ලදී. මෙහිදී, අඩකට වඩා වැඩි පිරිසක් (33 දෙනෙකුගෙන් 18 දෙනෙකු) ශාරීරික හිංසනය අත්විඳ ඇති බව මෙම සම්මුඛ සාකච්ඡා වලින් හෙළිවීම විශේෂ කරුණකි. දෙයාකාරයකින් සිදුවන හිංසනය (ශාරීරික වශයෙන් සහ ලිංගික වශයෙන්) ඔවුන්ගේ ලිංගික නැඹුරුව වූ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ අනන්‍යතාවය මත තීරණය වන අර්ථකතනය සහ ප්‍රකාශනය සමඟ බැඳී පවතී. සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ පුද්ගලයින්ගෙන් විශ්මයට පත්කරවන තරම් ඉහළ ප්‍රමාණයෙන් (33 දෙනෙකුගෙන් 31 දෙනෙකු) ඔවුන්ගේ මානසික සෞඛ්‍ය කෙරෙහි මෙම හිංසනය බලපා ඇති බව වාර්තා කරන ලදී. මෙහි දක්වා ඇති මානසික සෞඛ්‍ය ගැටලු අතර, මානසික අවපීඩනය, සාංකාව, කෝපය, නොරුස්සන බව, හිංසනය පිළිබඳ අත්දැකීම් සහ අනාගතයේ සිදුවිය හැකි හිංසනයන් පිළිබඳව ඇති බිය යනාදිය වීය. සම්මුඛ සාකච්ඡාවන්ට සහභාගි කරගන්නා ලද පුද්ගලයින්ගෙන් තුනෙන් පංගුවක් ම (33 දෙනෙකුගෙන් 20 දෙනෙකු) සමාජයෙන්, යහළුවන්ගෙන් සහ පවුලේ අයගෙන් කොන්වීමේ බිය හේතුකොට ගෙන තමන්ගේ ලිංගික නැඹුරුව

පිළිබඳව අන් අයට හෙළි නොකිරීමට තීරණයකොට තිබුණි. තමන්ටම හිංසා කරගැනීමේ සිද්ධි 20 දෙනෙකු විසින් වාර්තා කරන ලද අතර, සම්මුඛ සාකච්ඡාවට භාජනයවූ පුද්ගලයන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක්, එනම් තුනෙන් පංගුවක් (33 දෙනෙකුගෙන් 11 දෙනෙකු) සියදිවි හානිකර ගැනීමට උත්සාහ කිරීම පිළිබඳව වාර්තා කරන ලදී. ශ්‍රී ලංකාවේ පුවත්පත්වල සියදිවි හානිකරගන්නා ස්ත්‍රී ජෝඩු සම්බන්ධයෙන් වාර්තා පළවී ඇති බව කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම නිරීක්ෂණය කර ඇත.[3]

විවිධ පාර්ශවකරුවන්ගේ (රාජ්‍ය සහ රාජ්‍ය නොවන) සම්මුඛ සාකච්ඡාවලින් වර්තමාන ශ්‍රී ලාංකික සමාජයේ විවිධ පැතිකඩයන් හි තිබෙන්නා වූ සමලිංගිකයින්ට විරුද්ධ ආකල්පය සහ මිත්‍යාවන් හි තීව්‍රතාවය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලැබුණි. වෛද්‍ය, මානසික සෞඛ්‍ය, අධ්‍යාපන, ආගමික සහ මාධ්‍ය යන ක්ෂේත්‍ර සමූහයක් අතරින් මිත්‍ර පාර්ශවයක් වියහැකි පිරිසක් හඳුනාගැනීමට මෙම සම්මුඛ සාකච්ඡා උපකාරී විය. උදාහරණයක් ලෙසට, ...LBT පුද්ගලයින් සමූහයක් සමඟ වැඩකර ඇති ඇය විශේෂයෙන්ම සංක්‍රාන්ති ලිංගික ප්‍රශ්න පිළිබඳ ලංකාවේ මානසික සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන ගැටළු සම්බන්ධයෙන් ට්‍රාන්ස් පුද්ගලයින් සමඟ වැඩ කිරීම සඳහාවන සායනික මනෝ විද්‍යාඥයන්ගේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇති අතර ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත තීරණයවන අනන්‍යතාවය පිළිබඳව අවධාරණය කරයි.[4]

3. 2005 ජූලි මාසයේ දී, ගම්පහ දිස්ත්‍රික්කයේ දීපිකා සහ චානිකා යන 15 හැවිරිදි තරුණියන් දෙදෙනා එකිනෙකා වැළඳගෙන ඉදිරියට පැමිණෙන දුම්රියකට පැන්නේ ය. (22.07.2005 - ලංකාදීප වාර්තා කරයි.) 2002 අගෝස්තු මස දී මාතලේ දිස්ත්‍රික්කයේ 18 හැවිරිදි සුජානි සහ 16 හැවිරිදි අනෝමා රබර් ගසක ගෙලවැල දා ගත්තේ ය. සියදිවි හානි කරගන්නට පෙර ලියන ලද සටහනක මෙසේ තිබුණි. අපට එකට ජීවත්වීමට නොහැකි නිසා අපි එකට මැරෙන්නෙමු. (23.08.2002-දිවයින වාර්තා කරයි.) ; 2001 ඔක්තෝබර් මස දී ගාල්ල දිස්ත්‍රික්කයෙන් 30 හැවිරිදි නන්දනීගේ සහ 21 හැවිරිදි ශානිකාගේ මෘතශරීර; රෙදි කැබැල්ලකින් අත්එකට ගැටගසා තිබිය දී මුහුදු වෙරළට ගසාගෙන අවුත් තිබිණි. මිනීමැරුමක, දූෂණයක හෝ ලිංගික අතවරයක ලක්ෂණ එහි නොතිබුණි. එකිනෙකාට ලියන ලද ආදර හසුන් කිහිපයක් පොලිස් පරීක්ෂණවල දී හමු විය. (05.11.2001-ලංකාදීප වාර්තා කරයි.)

4. මානසික සෞඛ්‍ය සම්බන්ධයෙන් වන වෘත්තිකයෙකු සමග සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 14 ජූලි 2011.

# [ # 02 ක්‍රමවේදය ]

කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම විසින් LBT[5] පුද්ගලයන් 33 දෙනෙකු සමග ප්‍රමාණාත්මක සම්මුඛ සාකච්ඡා පවත්වන ලද අතර, සියලු දෙනාම අපගේ සංවිධාන ජාලය හරහා හඳුනාගත් පුද්ගලයින් විය. මෙම පර්යේෂණය සඳහා පුලුල් පරාසයක් ගැනීමට අපට අවශ්‍යතාවය තිබුණ ද, අපගේ ජාලයෙන් පිටත සිටින LBT පුද්ගලයින් සම්මුඛ සාකච්ඡාවන්ට සහභාගිවීමට කැමැත්තක් නොදැක් වූ නිසා එය ක්‍රියාත්මක කිරීම අසීරු කටයුත්තක් විය. LBT පුද්ගලයින්ට අමතරව උනන්දුව දක්වන විවිධ පාර්ශවයන් 54 දෙනෙකු සමග අප විසින් සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.

LBT පුද්ගලයින් සහ උනන්දුව දක්වන විවිධ පාර්ශවයන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සඳහා ප්‍රශ්නාවලියක් භාවිතා කරන ලද්දෙමු. LBT පුද්ගලයින් සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡා සඳහා පැය දෙකක කාලයක් (දළ වශයෙන්) ගත වූ අතර, උනන්දුවන පාර්ශවයන් සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡා සඳහා පැයක පමණ කාලයක් ගතවිය. සහභාගි වූ පුද්ගලයාගේ භාෂාව, ඥාණය අනුව සම්මුඛ සාකච්ඡා සිංහලෙන් හෝ ඉංග්‍රීසියෙන් පවත්වන ලදී. සම්මුඛ සාකච්ඡාවන්ට මුහුණ දුන් දමිළ ජාතික පුද්ගලයෝ සියලු දෙනාම පාහේ ඉංග්‍රීසි භාෂාවෙන් පිළිතුරු දීමට කැමැත්තක් දැක්වූහ. (දමිළ භාෂාවෙන් සම්මුඛ සාකච්ජා පැවැත්වීමට ද සූදානමක් තිබුණි.)

සම්මුඛ සාකච්ඡාව ආරම්භ කිරීමට පෙර ඒ සඳහා කැමැත්ත දැක්වූ සෑම කෙනෙකුම මෙම පර්යේෂණයේ අරමුණු සහ ඉලක්ක පිළිබඳව දැනුවත් කරන ලද අතර, ඔවුහු සිය කැමැත්ත ප්‍රකාශ

5. ස්ත්‍රී සමලිංගික, ද්වීලිංගික සහ සංක්‍රාන්ති ලිංගික යන පදය මෙහිදී භාවිතයට ගැනුණ ද සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ සමහර පුද්ගලයන් 'ස්ත්‍රී සමලිංගික', 'ද්වීලිංගික' හෝ 'සංක්‍රාන්ති ලිංගික' පුද්ගලයකු ලෙසට තමන්ව හඳුන්වාදීමට අකමැති විය. සම්මුඛ සාකච්ඡාවන්ට භාජනය වූවන්ගේ තොරතුරු සඳහා කරුණාකර #04 කොටස බලන්න.

කිරීමේ පත්‍රිකාව අත්සන් තැබූහ. මෙහිදී නිර්නාමිකභාවය සහ පෞද්ගලිකත්වය පිළිබඳ තහවුරු කළ අතරම, කැමැත්ත ප්‍රකාශ කිරීමේ පත්‍රය මගින් මෙම පර්යේෂණ ව්‍යාපෘතියට ස්වකැමැත්තෙන් ඉදිරිපත් වී සහභාගිවීමේ ස්වභාවය පිළිබඳව ද අවධාරණය කරන ලදී. පිළිතුරු දෙන්නන්ට තමන්ගෙන් අසන ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු ලබානොදී සිටිය හැකි වූ අතර, සම්මුඛ සාකච්ඡාව අතරතුර දී හෝ ඊට පසුව හෝ පැහැදිලි කිරීමකින් තොරව සම්මුඛ සාකච්ඡාවෙන් ඉවත්වීමට තීරණය කිරීමේ අයිතිය ද ඔවුන් සතු විය. සම්මුඛ සාකච්ඡාව පවත්වා මාස 3 ක කාලසීමාවක් ඇතුළත තම සම්මුඛ සාකච්ඡාව අවලංගු කිරීමේ අවස්ථාව ද ඔවුන්ට දී තිබුණි. එම කාලසීමාව ඇතුළත සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ දෙදෙනෙකු විසින් ඔවුන්ගේ සම්මුඛ සාකච්ඡාවන් අවලංගු කරගන්නා ලදී. (එයට හේතු සඳහන්කොට නොමැත.)

ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කෙරෙන මෙම පර්යේෂණ කටයුත්තට තමන් සුදුසු පුද්ගලයකු නොවේ යැයි සමහර පිළිතුරු දෙන්නන් කියා සිටිය ද, ලිංගික නැඹුරුව හේතුවෙන් ඔවුන් ප්‍රචණ්ඩත්වය අත්විඳ ඇති බව සම්මුඛ සාකච්ඡාවේ දී හෙළිදරව් විය. තවද, සැලකිය යුතු සංඛ්‍යාවකට තමන්ගේ දෙමාපියන් හෝ පවුලේ සාමාජිකයින් නිසා චිත්තවේගික සහ මානසික/ප්‍රචණ්ඩත්වයට මුහුණදීමට ඔවුන්ට සිදුවුව ද, මෙලෙස හැසිරෙන තම පවුල්වල සාමාජිකයින් ''අපරාධකරුවන්'' ලෙසට හඳුන්වාදීමට ද ඔවුහු අකමැති වූහ.

පර්යේෂකයින් දෙදෙනෙකු විසින් කරන ලද, උනන්දුවන පාර්ශවයන් සඳහා වූ සම්මුඛ සාකච්ඡා බොහෝ අභියෝගාත්මක විය. සමලිංගිකයින්ට විරුද්ධ හෝ සම්මුඛ සාකච්ඡාවට සහභාගිවීමට අකමැති පුද්ගලයින්ගේ පූර්ව විනිශ්චයන්ට ලක්වීමට පර්යේෂකයින් දෙදෙනාටම සිදුවිය. උනන්දුවක් දක්වන පාර්ශවයන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වන්නේ කවුරුන් ද යන්න තීරණය කිරීමේ දී (ඔවුන්ගේ ආකල්ප පිළිබඳව නොදන සිටීම හේතුවෙන්) උපක්‍රමශීලී අන්දමින් බාහිර පෙනුමෙන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හෝ ලිංගිකත්වය පිළිබඳව කුතුහලයක් ඇති නොවන පුද්ගලයින් අප විසින් පර්යේෂකයින් ලෙසට තෝරාගන්නා ලදී. මෙම උපක්‍රමය කෙසේ වුවත්, උනන්දුවක් දක්වන පාර්ශවයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේ දී පහත දැක්වෙන නුසුදුසු ප්‍රශ්න ඔවුන් දෙදෙනා වෙතම ඉදිරිපත්වී තිබුණි.

> “ ඔබට කොපමණ සල්ලි ලැබෙනවා ද? මෙම පර්යේෂණය සඳහා ඔබට කොපමණ ගෙවනවා ද?''
> ''මෙම පර්යේෂණයට මුදල් දෙන්නේ මොන රට ද?''
> ''ඔයාට දිග කොණ්ඩයක් තියෙන්නේ ඇයි?''
> ''ඔයාට පෙම්වතෙක් ඉන්නවා ද? ”

සම්මුඛ සාකච්ඡා පැවැත් වූ මෙම පර්යේෂකයින් දෙදෙනාට ඔවුන්ගේ අත්දැකීම් සටහන් කරන ලෙසට උපදෙස් දෙන ලදී. උනන්දුවන පාර්ශවයන්ගේ ආකල්ප පිළිබඳව පැහැදිලි පිංතූරයක් ලබාදීම සඳහා ඔවුන් විසින් සටහන් කරගන්නා ලද අත්දැකීම් කිහිපයක් මෙසේ උපුටා දැක්විය හැක.

## උනන්දුවක් දක්වන පාර්ශවය: නීතිඥයා
## පර්යේෂකයාගේ ස්ථානය : නාගරික ප්‍රදේශයක්

''මෙම පර්යේෂණයේ නම දැනගත් පසු ඔහු ඉතාම අසහනයට පත්විය. ඔහුගේ නම සහ අංකය මම ලබාගත්තේ කෙසේ ද යන්න ඔහුට දැනගැනීමට අවශ්‍ය විය. ඔහු පටිගත කිරීමට අකමැති බව කියා සිටියේ ය. මට පෙම්වතෙක් සිටීදැයි ඔහු මගෙන් විමසන ලද අතර, මම නැත යැයි පිළිතුරු දුන්නේ ය. එය පුදුමයක් නොවේ යැයි ඔහු පැවසුවේය. එමගින් ඔහු අදහස් කරන ලද්දේ මෙවැනි අන්දමේ පර්යේෂණවල තවදුරටත් යෙදී සිටියහොත්, පෙම්වතකු සොයාගැනීමට මට අපහසුවන බව ය. සමලිංගිකත්වය අප සමාජයේ වසන් වී තිබෙන්නක් බවත්, අප කුණු අවුස්සා තවත් ප්‍රශ්න ඇතිකරගත හැකි බව තවදුරටත් ඔහු කියා සිටියේය. දික්කසාදවීමේ නඩු විශාල ප්‍රමාණයක ස්වාමිපුරුෂයා සමලිංගික පුරුෂයකුවීම දක්නට ලැබුණ බව කියා සිටි ඔහු අවසානයේ දී සම්මුඛ සාකච්ඡාවක් ලබාදීමට කැමති වූ නමුත් ඔහුගේ මතයන් සහ ආකල්ප සම්මුඛ සාකච්ඡාවෙන් පිට පැවසීමට ඔහුට අවශ්‍ය විය.

**උනන්දුවක් දක්වන පාර්ශවය : වෛද්‍ය නිලධාරිවරයා**
**පර්යේෂකයාගේ ස්ථානය : ග්‍රාමීය ප්‍රදේශයක්**

දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරිවරයා විසින් මා හට දොස් පවරන ලදී. ඒ විශේෂයෙන්ම ඔහු මගේ සහකරුවාගේ මිතුරෙකු වූ බැවිනි. ඔහුගේ මිතුරාගේ සහකාරිය මෙවැනි පර්යේෂණයක් කිරීම පිළිබඳව ඔහු කණගාටුව පළ කරනු ලැබුවේය. මෙවැනි පර්යේෂණ මෙලෙස අපගේ ගම්මානවලට ගෙන ඒම බටහිර සංස්කෘතිය ගමට ගෙන ඒමක් බවත් එය අපගේ සංස්කෘතිය විනාශ කරන බවත් ඔහු වැඩිදුරටත් කියා සිටියේ ය. මා මෙයට පිළිතුරු දුන්නේ මෙය (සමලිංගිකත්වය) රජ සමයේ පටන් පැවැති ඉපැරණි ඉතිහාසයක් සහිත සාමාන්‍ය දෙයක් බව පැවසීමෙනි. එවිට ඔහුගේ පිළිතුර වූයේ එම යුගයේ මා ජීවත්ව නොසිටි බැවින් මා ඒ සම්බන්ධයෙන් හරියටම නොදන්නා බවයි.''

**උනන්දුවක් දක්වන පාර්ශවය: වෛද්‍යවරයා**
**පර්යේෂකයාගේ ස්ථානය: ග්‍රාමීය ප්‍රදේශයක්**

''සමලිංගිකත්වයට කැමැත්තක් දක්වන ළමුන්, ඔවුන්ගේ දෙමාපියන් සහ ගුරුවරුන් විසින් උපදේශනය සඳහා ඔහු වෙත එවන බව වෛද්‍යවරයා කියා සිටියේ ය. උපදේශනය මගින් ඔවුන් නිවැරදි මගට ගත හැකි බව ඔහුගේ අදහස විය. මෙම වෛද්‍යවරයා න්‍යායාත්මක වශයෙන් සමලිංගිකත්වයට එකඟතාවයක් දැක්වුව ද ඒ සඳහා සහයෝගය පළ කිරීමට අකමැති විය.''

# [ # 03 පාරිභාෂිත යෙදුම් ]

පාරිභාෂිත යෙදුම්වලට අදාල ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කිරීමේ දී, ''ලිංගික නැඹුරුව'', ''ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය'', ''ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත තීරණය වන අර්ථකතනය සහ ප්‍රකාශනය'' යන පද ස්වභාෂාවෙන් (සිංහල සහ දෙමළ) භාවිතා කිරීම අභියෝගාත්මක විය. උදාහරණයක් ලෙසට, ''Heteronormative'' යන පදයේ සිංහල තේරුම වාක්‍යයකින් විස්තරවන අතර, (උදා:- විෂම ලිංගික සම්මතය) ඒ සඳහා තනි පදයක් නැත.

මීට සමාන වශයෙන්, Sexual Orientation'' විස්තර කිරීමට අප විසින් යොදාගන්නා ලද සිංහල පදය 'ලිංගික නැඹුරුව' යන්නයි. කෙසේ වෙතත් සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේ දී මෙම පදය භාවිතා කිරීම අතහැරීමට සිදුවූයේ පිළිතුරු සපයන්නන් මෙහි තේරුම පිළිබඳව නොදන සිටීම හේතුවෙනි. විධිමත් වාග් මාලාවක් භාවිතා නොකර පිළිතුරු සපයන්නන් ලිංගික සහ භාවමය සම්බන්ධතා පැවැත්වීමට කැමැත්තක් දක්වන්නේ ගැහැණු, පිරිමි හෝ දෙගොල්ලන් සමඟ ද යන්න ඇසීම වඩාත් ප්‍රයෝජනවත් විය.

Gender Indentity යන යෙදුමෙහි සිංහල පරිවර්තනය ''ස්ත්‍රී -පුරුෂ සමාජභාවය මත පදනම් වූ අනන්‍යතාවය''යන්නයි. සම්මුඛ සාකච්ඡාවලදී මෙම විධිමත් යෙදුම, සිංහල සාමාන්‍ය ව්‍යවහාර භාෂාව සමඟ සමපාත නොවුණු අතර, එහි තේරුම විග්‍රහ නොකර එම පදය භාවිතා කිරීමට නොහැකි විය. මේ පිළිබඳව පැහැදිලි කිරීම සඳහා සමහර පර්යේෂකයින්, තමන් ම උදාහරණයකට ගෙන තමා කාන්තා නොවන/පිරිමි ඇඳුම් ඇඳීමට කැමති ගැහැණු ළමයකු ලෙස දකින්නේ ද යනාදි වශයෙන් පිළිතුරු දෙන්නන්ගෙන් විමසා සිටින ලදී.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මෙන්ම, බටහිර නොවන සන්දර්භයක විෂම ලිංගික සම්මතයට පටහැනි ලිංගික සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය පිළිබඳ කරුණු සෙවීම අභියෝගයක්

වියි. ට්‍රාන්ස් පුද්ගලයින්ගේ අනන්‍යතාවය සම්බන්ධ ගැටළු මෙයට හොඳම උදාහරණයකි. බටහිර සන්දර්භයක 'ට්‍රාන්ස් පුද්ගලයකු යනු උපතින් ස්ත්‍රී ලිංගය හිමිකරගත්, එහෙත් පුරුෂයකු ලෙස තම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය, අර්ථකතනය සහ ප්‍රකාශනය හඳුනාගන්නා පුද්ගලයකුටය; ශල්‍යකර්මයක් සිදුකරගෙන/සිදුකරනොගෙන ඔහු පුරුෂයකු ලෙස තම අනන්‍යතාවය පවත්වාගෙන යයි. කෙසේ නමුත්, ශ්‍රී ලංකාවේ දී පුරුෂයින් ලෙසට "වෙස්වලාගත්"[6] ස්ත්‍රීන් පිළිබඳ පුවත්පත් වාර්තා තිබුණ ද එම සිදුවීම්වල ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අර්ථකතනය සහ ප්‍රකාශනය ට්‍රාන්ස් පුද්ගලයින්ගේ අනන්‍යතාවය මෙන් පැහැදිලි ද යන්න පැවසීමට අපහසු ය. උදාහරණයක් ලෙසට, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම වාර්තාකර ඇති සමහර වාර්තාවන්ට අනුව ඔහු/ඇය පිරිමියකු ලෙසට පෙනී සිට ඇත්තේ එදිනෙදා ජීවිතයේ දී ස්ත්‍රීන් මුහුණදෙන ලිංගික අතවරවලින් මිදී සිටීම සඳහා ය. මෙම තත්ත්වය තවත් සංකීර්ණ වන්නේ ඔවුන් එදිනෙදා ජීවිතය පවත්වාගෙන යාම සඳහා එසේ ජීවත්වන අතර, උපතින් ස්ත්‍රියක වීම සම්බන්ධයෙන් අසන ප්‍රශ්න නිසා ඔවුන් අවදානමට ලක්වීමට ඇති ඉඩකඩ වැඩිය. කෙසේ වෙතත්, පසුගිය අවුරුදු කිහිපයක කාලයක් තුළ විශේෂයෙන් ම වෛද්‍ය වෘත්තිකයින් අතර, සංක්‍රාන්ති ලිංගික ප්‍රශ්න සම්බන්ධයෙන් ඇති දැනුවත්භාවය වැඩි වී ඇත.[7]

6. ලංකාදීප බලන්න; 'පිරිමි ළමයකු අවුරුදු 18 දී සිට ගැහැණු ළමයකු සේ වෙස්වලාගෙන', 2010 අගෝස්තු 31; ලංකාදීප, 'යුද හමුදා නිලධාරියෙකු සේ වෙස්වලාගත් කාන්තාවක් දුරකතන ඇමතුමක් නිසා ඇතිවූ ප්‍රේම සම්බන්ධයකින් පසුව කාන්තාවක් සමග විවාහ වෙයි, 2010 අගෝස්තු 23; දිවයින, 'කෙල්ලෝ, කොලු  කෙල්ලන් ලෙසට වෙස්වලාගෙන, 2009 මැයි 17; ලංකාදීප, 'අවුරුදු 20ක් පිරිමියකු සේ වෙස්වලාගත් පුද්ගලයකු පොලීසියේ දී කාන්තාවක වෙයි', 2009 ජනවාරි 3; ලංකාදීප, 'පිරිමියෙකු සේ වෙස්වලාගත් 16 හැවිරිදි අභිකුණ්ටික තරුණිය මිනීමැරුමකට සැකපිට අත්අඩංගුවට' 2005 මැයි 11; ලංකාදීප 'දඹුල්ල පන්සලේදී පිරිමි ළමයා ගැහැණු ළමයකු වෙයි', 2004 මාර්තු 10; ලංකාදීප, 'යුද හමුදා නිලධාරිනියක ලෙස වෙස්වලාගත් යුද හමුදා නිලධාරියාට හොර හැඳුනුම්පතක් දීම සම්බන්ධයෙන් කොස්තාපල්වරිය අත්අඩංගුවට' 2003 ජනවාරි 18; ඉරිදා ලංකාදීප, 'ගැහැණු වෙස්ගත් පිරිමියකු සම්බන්ධ සිද්ධියක්' 2003 ජූලි 20. b උපග්‍රන්ථය බලන්න.

7. මෙම අධ්‍යයනය මගින් ඉස්මතු කරන ලද ප්‍රචණ්ඩත්වය සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ තොරතුරුවලට පිළියමක් වශයෙන්, ප්‍රතිපත්ති සම්පාදකයින්ට, රජයේ ආයතනවලට, අධ්‍යාපනික ආයතන, පෞද්ගලික අංශයට, සිවිල් සමාජයට සහ අනෙකුත් අදාළ පාර්ශවයන්ට ලබාදීම සඳහා පහත සඳහන් නිර්දේශ හඳුනාගන්නා ලදී.

# [ # 04 සම්මුඛ සාකච්ඡාවට භාජනයවූ පුද්ගලයින් පිළිබඳ තොරතුරු ]

**ලිංගික නැඹුරුව :** කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම මගින් LBT පුද්ගලයින් සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡා 33 න් පුද්ගලයින් 22 ක් තමන් සමලිංගික ස්ත්‍රියක් යැයි හඳුනාගෙන සිටි අතර, ද්වි ලිංගික කාන්තාවන් දෙදෙනෙකු සහ තමා විෂම ලිංගික පුද්ගලයකු ලෙසට සිතා සිටි එක් පුද්ගලයෙක් ද විය. ඉතිරි සම්මුඛ සාකච්ඡාකරුවන් අටදෙනා ඔවුන්ගේ ලිංගික නැඹුරුව, පුරුෂ සමලිංගික, තමන්ගේ ලිංගිකත්වය ප්‍රශ්න කරන, බඟසර රකින හෝ සහතික නොවන පිරිසක් විය. සමහර පිරිසක් ඔවුන් 'කාන්තාවන්ට කැමතියි' යන්න පමණක් කීමට කැමැති වූ අතර, තවත් සමහරු ඔවුන්ගේ ලිංගික නැඹුරුව පිළිබඳව අවධාරණය කරන ලදී.

**ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අර්ථකතනය සහ ප්‍රකාශනය :** ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය යන පදනමට අනුව, සම්මුඛ සාකච්ඡාවට මුහුණ දුන් පුද්ගලයෝ දෙදෙනෙකු තමන් පිරිමින් ලෙසට හැඳින්වූහ. තිදෙනෙකු විසින් ඔවුන් පිරිමි හෝ ගැහැණු ලෙසට හඳුන්වනු නොලැබූ අතර, ඔවුන් 'මැද සිටින' පුද්ගලයින් ලෙසින් හැඳින්වීමට ප්‍රියකරන ලදී. 15 දෙනෙකු විසින් තමන් ස්ත්‍රී ගතිලක්ෂණ (femme) වලින් යුත් කාන්තාවන් ලෙසින් තමන් විසින්ම හඳුන්වන ලදී. මීට අමතරව 13 දෙනෙකු ස්ත්‍රීන් ලෙස තමන් හැඳින්වූවත් ඔවුන් පිරිමි ගතිලක්ෂණ (butch) ඇති අය ලෙසින් තමන් විසින්ම හඳුන්වා දෙන ලදී.

**වයස :** සම්මුඛ සාකච්ඡාකරුවන්ගෙන් 14 දෙනෙකු වයස අවුරුදු 20-29 ත් අතර වයස් කාණ්ඩයට අයත් වූවෝ වෙති. 12 දෙනෙකු වයස අවු. 30-39 ත් අතර විය. 7 දෙනෙකු අවු. 40 ට වඩා වැඩි අයවලුන් වූහ.

**ජනවර්ගය :** ජනවර්ග පදනම අනුව ගත්කල මෙම නියැදියට තෝරා ගන්නා ලද පුද්ගලයින් අතර සිංහල (19); මිශ්‍ර වර්ගවලට අයත් පුද්ගලයින් 9 දෙනෙකු, (සිංහල/බර්ගර් හෝ සිංහල/දෙමළ); බර්ගර් ලෙසට තමන් හඳුනාගත් පුද්ගලයින් 3 දෙනෙකු; සහ දෙමළ ජාතික පුද්ගලයින් දෙදෙනෙකු ද විය. වැඩි ප්‍රයත්නයක් දැරුවද දෙමළ භාෂාවෙන් කරන ලද සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ සංඛ්‍යාව ඉතාම අඩු අගයක් ගනු ලැබීය.

**විශ්වාසය :** සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ පිරිසෙන් අඩකට වඩා වැඩි පිරිසක් (16) බෞද්ධ පවුල් හි උපත ලබා ඇති මුත්, මුළු නියැඳියෙන් ම බෞද්ධාගම අදහනු ලබන්නේ 10 දෙනෙකු පමණි. එයට සමාන ලෙස සම්මුඛ සාකච්ඡාවට භාජනයවූ පිරිසෙන් 13 දෙනෙකු ක්‍රිස්තියානි පවුල්වල උපත ලබා ඇති අතර මෙයින් 8 දෙනෙකු පමණක් ආගම අදහනු ලබන්නෝ වූහ. අනෙකුත් පිරිස අතර හින්දු, අදේවවාදී, අඥෙයවාදී (agnostics) හෝ කිසිදු ආගමක් විශ්වාස නොකරන්නෝ වූහ. මුස්ලිම් ජාතික පුද්ගලයින් සම්බන්ධකර ගැනීමට උත්සාහයක් දැරූව ද එය අසාර්ථක විය.

**අධ්‍යාපනය :** සම්මුඛ සාකච්ඡාවට භාජනයවූ පිරිසෙන් 14 දෙනෙකු තෘතීක අධ්‍යාපනය අවසන් කරන ලද්දෝ වූ අතර 8 දෙනෙකු උපාධිය ද; 11 දෙනෙකු පශ්චාත් උපාධි සුදුසුකම් ද ලබා තිබුණි.

**රැකියාව :** සම්මුඛ සාකච්ඡාවට භාජනයවූ පුද්ගලයින් 33 දෙනාගෙන් 30 දෙනෙකුම විධිමත් ක්ෂේත්‍රයන් හි රැකියා කරන්නෝ ය. මාසික ආදායම අනුව, සම්මුඛ සාකච්ඡාවන්ට බඳුන් වූ 4 දෙනෙකු මාසිකව රුපියල් 27,500 ට අඩු ආදායමක් උපයන්නන් වූ අතර 9 දෙනෙකු මාසිකව රුපියල් 27,500-45,000 අතර ද, 7 දෙනෙකු මාසිකව 45,000-91,000 ට අතර සහ 8 දෙනෙකු මාසිකව 91,000 ට වඩා වැඩි ආදායම් ලැබූවෝ ද වූහ. සම්මුඛ සාකච්ඡාවට භාජනයවූ දෙදෙනෙකුට ස්ථිර ආදායමක් නොතිබුණි.

**උනන්දුව දක්වන පාර්ශවයන් සමඟ සම්මුඛ සාකච්ඡා :** උනන්දුව දක්වන පාර්ශවයන් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡා 51 න් 7 ක් සිදුකරන ලද්දේ රජයේ ආයතනයන් හි වැඩකරන පුද්ගලයින් සමඟ වන අතර මෙයින් 11 දෙනෙක් මානව හිමිකම් වෙනුවෙන් ක්‍රියාකරන්නෝ ද (නීතිඥයින් සහ ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරීන් ඇතුළුව) 7 දෙනෙකු සේවා සපයන්නෝ ද (මානසික සෞඛ්‍ය සහ වෛද්‍ය වෘත්තිකයන් ඇතුලුව) 26 දෙනෙකු

සේවාදායකයෝ ද මාධ්‍ය, ආගමික සහ අධ්‍යාපන ආයතන නියෝජනය කරන්නෝ ද වූහ. කාලය පිළිබඳව පැවැති බාධක හේතුවෙන් සියලුම උනන්දු පාර්ශවයන් සමඟ පැවැති සම්මුඛ සාකච්ඡාවලින් විශ්ලේෂණය කරන ලද්දේ, 30%ක ප්‍රමාණයක් පමණකි. (උදා: උනන්දු පාර්ශවයන් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡා 16 ක්) මෙම සීමාකරණය, මෙහි එන වෙනත් නිගමනවලට බලපෑ හැක. කෙසේ නමුත්, මේ සඳහා ඔවුන් තෝරා ගැනීමේ දී උනන්දු පාර්ශවයන්ගේ හරස්කඩක් හසුකර ගැනීමට හැකිවන ලෙසට අවම වශයෙන් එක් ක්ෂේත්‍රයකින් එක් අයෙකුවත් නියෝජනය වන පරිදි (උදා: අධ්‍යාපනවේදීන්, සේවාදායකයින්, මාධ්‍ය, ආගමික) මෙය සැලසුම් කරන ලදී. සියලුම සම්මුඛ සාකච්ඡා සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වන ලද අතර, දෙමළ ජාතිකයෝ ඉංග්‍රීසි බසින් කතා කිරීමට කැමැත්තක් දක්වූහ.

ලංකාවේ සමලිංගිකත්වය සම්බන්ධව ඇති මිත්‍යා මත සහ ඍණාත්මක සමාජ ආකල්ප පිළිබඳව ඉතා පැහැදිලි චිත්‍රයක් උනන්දු පාර්ශවයන්ගේ සම්මුඛ සාකච්ඡා මගින් ලැබුණු අතර, එමගින් උද්දේශන උපාය මාර්ග සහ සේවා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍යවන ඵලදායී දෘෂ්ටියක් ද ලැබුණේ ය. සමලිංගිකත්වය, ළමා කාමය (peadophillia) සමග සම්බන්ධ කිරීම, තෝරාගනු ලැබූ උනන්දුව දක්වන පාර්ශවයන්ගෙන් ලැබුණු සුලබ පිළිතුරක් වූ අතර, මෙවැනි විශ්වාස මගින් වෘත්තීයමය පුහුණුව උල්ලංඝණය වූ අවස්ථා ද හමුවූහ. වෛද්‍ය ලක්රුවන් නම් වූ වෛද්‍ය වෘත්තිකයා "සමලිංගික පුද්ගලයකුට ඔහු කවුද කියා හඳුන්වා දෙන්න බැරි (ඔහුට, ඔහුගේ ලිංගිකත්වය පිළිබඳව විවෘත වෙන්න බැහැ.) ඔහුව එමගින් පිළිකුලකට ලක්වන නිසා යි. මේ සියලු දේවල් වෙන්නේ රහසේ... (එහි ප්‍රතිඵලයක් වශයෙන්) ඔවුන් (පුරුෂ සමලිංගිකයින්) කුඩා ළමුන් පසුපස ද යනවා" යැයි පැවසුවේය.[8]

තවත් සුලබ ප්‍රතිචාරයක් වූයේ, සමලිංගිකත්වය, එච්.අයි.වී./ඒඩ්ස්/ සමාජ රෝග ආදිය සමග සම්බන්ධ කිරීමය. "දෙවියන් වහන්සේ සියයට සියයක්ම සනාථ කරලා තියෙනවා ගැහැණු සහ පිරිමි අතර, මෙවැනි දෙයක් තිබෙනවා නම්.... සොයාගැනීමට නොහැකි, බෙහෙත් නැති ලෙඩ පැතිරෙනවා කියලා. කුරානයට අනුව, එවැනි දේවල් පිළිගන්න අය මැරෙන්නේ නින්දා සහගතව සහ අපවාද

8. වෛද්‍ය ලක්රුවන් සමග පැවති සම්මුඛ සාකච්ඡාව, වෛද්‍ය වෘත්තිකයා, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 අගෝස්තු 13.

විඳලා" යැයි මොහොමඩ් නම් මුස්ලිම් මව්ලවිතුමෙකු (ඉස්ලාම් ආගමික නායකයකු) විසින් පවසන ලදී.[9]

සමලිංගිකත්වය සුදුසු දෙයක් නොවන බවත්, එය රටේ සංස්කෘතිය සහ ආගමික සංවේදීතාවයට විරුද්ධව ගමන් කරන බවත්, තුන්වන ප්‍රතිචාරය විය. "මැණිකා නම් විදුහල්පතිනියට අනුව" (සිංහල සහ දෙමළ යන සංස්කෘතීන් සහ ආගම් දෙකම සම්බන්ධව) යැයි පැවසීය.[10]

LBT පුද්ගලයින් "කුමන හෝ ආකාරයට ලිංගික හෝ මානසික ආබාධයක් ඇති පුද්ගලයින් ලෙසට සහ සාමාන්‍ය ජීවිතයක් ගතකිරීමට බැරි පුද්ගලයින්, ඔවුන්ට වෙනත් විකල්පයක් නොමැති නිසා ඔවුන් සමලිංගිකයින් ලෙසට හැසිරෙනවා" [11] යැයි දකින්නේ ය.

කෙසේ නමුත්, මෙම අවබෝධය පදනම් කර ගැනීමට ප්‍රධාන සංස්කෘතික මතවාද වලින් උපුටා ගත හැකි දේ ප්‍රමාණයෙන් ඉතාම අල්පය. උදාහරණ වශයෙන්, ශ්‍රී ලාංකිකයින් බහුතරයක් අනුගමනය කරන රටේ රාජ්‍ය ආගම වන බෞද්ධාගමේ බුදුන් විසින් සමලිංගිකත්වයට විරුද්ධව දේශනා කරන ලද්දැයි සඳහන් කිරීම වාර්තාවන ලේඛන හමු නොවේ[12] කියා සිටියහ. විනය පිටකයේ සඳහන් වන පරිදි, භික්ෂූන් සහ භික්ෂුණීන්ට තමන්ගේ ශරීරයේ අවයව සහ ලිංගික අවයව ස්පර්ශ කිරීමට අවසර නැති අතර, එහි සමලිංගික සහ විෂම ලිංගික ක්‍රියා යනුවෙන් වෙනසක් ද නැත. තවද එම තහනම ඇත්තේ ශාසනයට ඇතුලු වී එම ශික්ෂා පදය සමාදන් වූවන්ට පමණි.

9. මොහොමඩ් සමග සම්මුඛ සාකච්ඡාව, මුස්ලිම් මව්ලවි, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 අගෝස්තු 01.

10. මැණිකේ සමග පැවැති සම්මුඛ සාකච්ඡාව, විදුහල්පතිනි, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව -2011 ජූනි 16.

11. සුදත් සමග පැවැති සම්මුඛ සාකච්ඡාව, මාධ්‍ය ආයතනයක් නියෝජනය කරන්නෙකි, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව 2011 අගෝස්තු 9.

12. බෙල්ලන්විල සුදත්ත හිමි සහ සෙසිල් ජේඩන්. Bellanvila Sudaththa Thero and Cecil J. Dunne, http://groundviews.org/2007/08/28/homosexuality-buddhism-and-sri-lankan-society/

# [ # 05 ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ පසුබිම ]

ශ්‍රී ලංකාව ව්‍යවස්ථානුකූල බහු පාක්ෂික ජනරජයක් වන අතර 2010 ජනවාරි මස දී දෙවන වතාවට අවුරුදු 6 ක් සඳහා තේරී පත් වූ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා මගින් පාලනය වේ. දිවයිනේ උතුරු සහ නැගෙනහිර පළාතෙන් ස්වාධීන රාජ්‍යයක් ඉල්ලා සටන් වදිමින් සිටි එල්.ටී.ටී.ඊ. සංවිධානය සමග සිවිල් යුද්ධයක නිරත වෙමින් සිටි ශ්‍රී ලංකා රජය, අවුරුදු 30 කට අධික කාලයක් අභ්‍යන්තර යුද ගැටුමකට මුහුණ දුන්නේ ය. මෙම යුද්ධය විසින් ශ්‍රී ලාංකිකයින් 70,000 කට වැඩි පිරිසකගේ ජීවිත අහිමි කරන ලද අතර, තවත් දහස් ගණනක් අවතැන් කරන ලදී.[13] 2009 මැයි මස දී එල්.ටී.ටී.ඊ. ය පරාජය වීමත් සමග යුද්ධය අවසන් වූ අතර, දෙමළ වැසියෝ 40,000 ක් පමණ මරණයට පත්වූ අතර, 60,000 ට අධික දෙමළ වැසියෝ සංඛ්‍යාවක් තුවාල ලැබූහ. 2010 මැයි මස දී ජනාධිපතිවරයා විසින් පත්කරන ලද උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසම වගකිව යුතු ජාතික යාන්ත්‍රණයක් ලෙසට අර්ථකථනය කර ඇත. කෙසේ නමුත්, උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසම ජාත්‍යන්තර සම්මතයන්ට අනුකූල නොවේ. ඒ විශේෂයෙන් ම, වගවීම සම්බන්ධයෙන් වන අතර, අභ්‍යන්තර ගැටුම් පැවැති සමයේ මානව හිමිකම් උල්ලංඝණය වීම පිළිබඳව ක්‍රමානුකූලව පරීක්ෂණ පැවැත්වීමට නොහැකි වූ නිසා මානව හිමිකම් සම්බන්ධයෙන් ක්‍රියාකරන ජාත්‍යන්තර සහ අන්තර් ආණ්ඩු සංවිධාන විසින් එය ඉතාම දෝෂ සහගත කොමිසමක් ලෙසට හඳුන්වනු ලබයි.[14] පොදුවේ සිදු වූ මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව කටයුතු කිරීමට දේශපාලන අභිමතය නොමැතිවීම උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසමේ අසාර්ථකභාවය දක්වන කරුණකි.

13. http://www.bbc.co.uk/news/world-south-asia-11393458 බලන්න

14. http://www.ohchr.org/Documents/HRBodies/HRCouncil/RegularSession/Session22/A-HRC-22-38_en.pdf and http://www.hrw.org/news/2011/12/16/sri-lanka-report-fails-advance-accountability බලන්න.

යුද්ධයට පසු, ස්ත්‍රීන් ඇතුළු සියලු ජනයාගේ අනන්‍යතාවයන්ට සහ අයිතීන්ට ගරු කරන, එම අයිතීන් පිළිගන්නා සාමකාමී සහ යුක්ති සහගත සමාජයක් ගොඩනැගීමේ අභියෝගයට තවමත් රට මුහුණ දෙමින් සිටී. සිවිල් ජනතාව, මානව හිමිකම් සුරකින්නන්, මාධ්‍යවේදීන් සහ දේශපාලන චරිතවලට එරෙහිව සිදු වූ මානව හිමිකම් උල්ලංඝණය වීම් - නීති විරෝධී ඝාතන, අතුරුදහන්වීම්, අත්තනෝමතික රඳවා තැබීම්, වධදීම් සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තා වී ඇත. එවැනි මානව හිමිකම් උල්ලංඝණයන්, ආරක්ෂක අංශ සහ රජයට සහාය සපයන ආයුධ සන්නද්ධ කණ්ඩායම්වලට ආරෝපනයකර ඇති අතර, තවමත් වාර්තා වෙමින් පවතී.[15] විශේෂයෙන් ම, රජයේ නිලධාරීන් චෝදනා ලැබූ අවස්ථාවන්හි දී චෝදනා ලැබූවන්ගේ සංඛ්‍යාව ඉතාම අඩු අතර වරදකරුවන් වූ සංඛ්‍යාව ඊටත් වඩා අඩු අගයක් දක්වයි. සමස්තයක් වශයෙන් ගත් කළ රට මුහුණපාන දුර්විපාක මෙමගින් දක්වෙන අතර ඒවා නඩු විභාගයට පෙර කරන දීර්ඝ රඳවා තැබීම්, සාධාරණ නඩු විභාගයක් කිරීමට ඉඩ නොදීම, අධිකරණයේ ස්වාධීනත්වය පිරිහීම, යුද අපරාධ සම්බන්ධයෙන් කිසිදු සම්බන්ධයක් නොමැති වුවත් අසාධාරණ ලෙස රඳවා තබා ගැනීම, නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව පරිපාලනයක් නොමැතිවීම සහ දේශපාලන අභිමතයක් නොමැතිවීම යනා දී කරුණු මගින් මෙය විද්‍යාමාන වේ. භාෂණයට ඇති නිදහස, රැස්වීමට ඇති නිදහස, ආශ්‍රය කිරීමට සහ ගමන් කිරීමට ඇති නිදහස ඇතුළු මූලික මානව හිමිකම්වලට බාධා පමුණුවා ඇති ආකාරය වාර්තා මගින් පෙන්වා දෙනු ලැබේ.[16]

සමස්තයක් වශයෙන් ගත්කළ, විපක්ෂව දක්වන ලද ඕනෑම අදහසකට රජය මගින් දක්වන ප්‍රතිචාරය නිග්‍රහ සුලු හෝ නොපිළිගන්නා ස්වරූපයක් ගනු ලැබේ. උදාහරණයක් ලෙසට, 2011 වර්ෂයේ දී සහ ඊට පසුව, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී ශ්‍රී ලංකාව පිළිබඳව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සම්මුතියට අදාල වාර්තාව 2012 මාර්තු මස දී සාකච්ඡාවට

15. US Department of State (2011) Human Rights Report, Sri Lanka [online] Available from: ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව (2011) මානව හිමිකම් වාර්තාව, ශ්‍රී ලංකාව (අන්තර්ජාලය) http://www.state.gov/j/drl/rls/hrrpt/2011/sca/186475.htm බලන්න (පිවිසුන දිනය 2012 ඔක්තෝබර් 11)

16. http://www.ohchr.org/Documents/HRBodies/HRCouncil/RegularSession/Session22/A-HRC-22-38_en.pdf බලන්න

ගැනීමට නියමිත වූ අවස්ථාවේ දී, ශ්‍රී ලාංකික මානව හිමිකම් සුරකින්නන්ට නොනවත්වා තර්ජන එල්ල වූ අතර දැඩි පීඩාවන් ද අත්විඳින්නට සිදුවිය.[17] බොහෝ අවස්ථාවල රජය විවේචනය කරන්නන්, මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් සුරකින්නන් ''කොටි'' (එල්.ටී.ටී.ඊ. යට සහයෝගය දක්වන බව) ත්‍රස්තවාදීන්, බෙදුම්වාදීන් සහ පාවා දෙන්නන් ලෙසට ලේබල් කරනු ලැබේ. මානව හිමිකම් සුරකින්නන්ගේ කාර්යයන්වලට මෙම ප්‍රතිචාර ඉතා තදින් බලපෑවේය. ඔවුන්ට, ඔවුන්ගේ ක්‍රියාකාරකම් රජය ''සංවේදී'' ලෙසට නොදකින ක්‍රියාකාරකම්වලට පමණක් සීමා කිරීමට බලකරන ලදී.[18]

ඉතා පුළුල් පරාසයක පැතිර ඇති මානව හිමිකම් පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් මාධ්‍යවේදීන්ට වාරණයකට මුහුණදීමට සිදුවන අතර බොහෝවිට ජීවිත තර්ජන සහිත අවදානම් තත්ත්වයන්වලට ද මුහුණදීමට සිදුවේ.[19] රඳවා ගැනීම් සම්බන්ධයෙන් ගත් කළ දෙමළ ජාතික පුද්ගලයින් ඉතා විශාල සංඛ්‍යාවක් ඔවුන්ට එරෙහිව ඇති චෝදනාවලට විධිමත් පියවර නොගෙන රිමාන්ඩ් භාරයේ රඳවා ඇත. මීට අමතරව, අදාල බලධාරීන් විසින් තොරතුරු ලබා දී නොමැති නිසා ජනවර්ග සම්බන්ධයෙන් ඇති දත්තයන්ගේ අඩුවක් පවතින අතර රාජ්‍ය නොවන සංවිධානවලට ලබාදිය හැක්කේ අනුමාන කරන ලද දත්ත පමණකි.

...බෞද්ධ භික්ෂූන් කණ්ඩායමක් මෙහෙයවන අන්‍ය ආගම් නොඉවසීමේ අන්තවාදී ක්‍රියාවන් පැතිරයාම ඉතාම සංවේදනාත්මක වර්ධනයක් වී ඇත.[20]

17. සුනිලා අබේසේකර. නිමල්කා ප්‍රනාන්දු, පාක්‍යසෝති සර්වනමුත්තු යන අයගේ ඒකාබද්ධ නිවේදනය, 2012 මාර්තු 23, කොළඹ, ශ්‍රී ලංකාව බලන්න. අන්තර්ජාලයේ http://www.scribd.com/doc/86440203/joint-statement-sunila-abeysekara-nimalka-fernando-and-dr-paikiasothy-saravanamuttu

18. උදාහරණයක් ලෙසට, යුද්ධයට සම්බන්ධ යම් කරුණක් හෝ දෙමළ ජාතිකයන්ට විරුද්ධ පශ්චාත් යුද සමය තුළ වූ මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධ කරුණු රජය විසින් ''සංවේදී'' ප්‍රශ්න යැයි සලකනු ලැබේ.

19. අද දෙරණ (සත්‍ය ප්‍රථමයෙන්) 2012 මාර්තු (අන්තර්ජාලය) http://www.adaderana.lk/news.php?nid=17473&mode=beauti (පිවිසුන දිනය 2012 සැප්තැම්බර් 25)

20. වැඩි විස්තර සඳහා : බලන්න. http://groundviews.org/2013/01/15/bodu-bala-sena-and-buddhisms-militant-face-in-sri-lanka/ and http://groundviews.org/2013/03/19/bodu-bala-sena-a-threat-to-sri-lankas-future/ and http://www.lankastandard.com/2013/01/the-muslims-are-the-new-tamils/

මහජනයාගේ මනසෙහි මනෝමය බියක් ජනිත කිරීමට සහ මුස්ලිම් ජාතිකයින් නොඉවසීම පිළිබඳව මෙම කණ්ඩායමේ තොරතුරු පැතිරවීමට නව මාධ්‍ය ක්‍රම වන 'ටුවිටර්' සහ 'ෆේස්බුක්' යොදාගනු ලබයි. 2011 දී අවසන් වරට පවත්වන ලද සංගණනය මගින් මුස්ලිම් ජාතිකයින්ගේ උපත් සංඛ්‍යාවේ කැපීපෙනෙන වර්ධනයක් ඇති බවත්, ඒ පිළිබඳව ක්‍රියා කළයුතු යැයි බහුතරයක් දෙනා අනුමාන කරන කරුණකි. ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලට විශාල වශයෙන් ඉලක්ක වී ඇත්තේ සුළු ජාතිකයන් සහ සුළු ආගම් වුවද රජය මගින් පතුරුවනු ලබන සිංහල බෞද්ධ සංකල්පයට සහාය දීමේ තත්ත්වය ඔවුහු ප්‍රයෝජනයට ගත්තෝ ය. ඔවුන් මුස්ලිම් ජාතිකයින්ට එරෙහිව, ද්වේශ සහගත ලෙස සිංහල ජාතිය ව්‍යාප්ත කිරීමට ගන්නා උත්සාහයන්හි දී සිංහල පුරුෂයකුට ස්ත්‍රීන් පස්දෙනෙකු සමග විවාහවීමට අවසර දෙන ලෙසට ශ්‍රී ලංකාවේ නීතිය වෙනස් විය යුතුයැයි ඉල්ලා ඇත.[21] මුස්ලිම් ජාතිකයින්, සිංහල ජාතිකයින් අභිබවා යනු ඇතැයි සිතන මෙම මනෝ–විකාරමය බිය තත්ත්වය නිසා ස්වකැමැත්තෙන් සහ ස්ථිර පවුල් සැලසුම් ක්‍රම, වෛද්‍යමය හේතුවක් හැරුණුකොට නතර කරන ලෙසට රජයේ රෝහල්වලට නිවේදනයක් නිකුත් කිරීම දක්වා වර්ධනය වී ඇත. උපත් පාලනය, ලිංගික සෞඛ්‍ය සහ පවුල් සැලසුම්කරණය සම්බන්ධයෙන් වැඩකරන රාජ්‍ය නොවන සංවිධානවලට එම ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වීම නවත්වන ලෙසට රජය උපදෙස් දී ඇතැයි වාර්තා වී ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන සංශෝධනයේ අඩංගු වගන්තියක් මගින් පොලිස් කොමිසම. මානව හිමිකම් කොමිසම සහ අධිකරණයේ ස්වාධීනත්වය අනතුරුදායක තත්ත්වයකට පත්කරන ලද අතර එමගින්, මෙම රජයේ ආයතන සඳහා පුද්ගලයින් පත්කිරීමේ බලය ජනාධිපතිවරයා වෙත ලැබුණි. ඒ සිදු වූවේ කෙසේද යත් මෙයට පෙර ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනයෙන් (පනතෙහි 2 වන වගන්තිය) කියා සිටියේ මානව හිමිකම් කොමිසමට සාමාජිකයන් පත්කරනු ලබන්නේ ව්‍යවස්ථාදායක නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් බවයි. 2010 සැප්තැම්බර් 9 වන දින සිට බලගන්වන ලද 18 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පිහිටුවනු ලැබූ පාර්ලිමේන්තු උපදේශක සභාව, අගමැති, කතානායක, විපක්ෂ නායක, අගමැති විසින් නම් කරන ලද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු

21. වැඩි විස්තර සඳහා :http://dbsjeyaraj.com/dbsj/archives/15219 බලන්න.

සහ විපක්ෂ නායක විසින් නම්කරන ලද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකුගෙන් සමන්විත ය. මෙහි දී මානව හිමිකම් කොමිසමට පුද්ගලයන් පත් කිරීමේ දී ජනාධිපතිවරයාට ඇත්තේ ''පාර්ලිමේන්තු උපදේශක සභාවේ නිර්දේශ පිළිබඳව සලකා බැලීමට'' (අනුමැතිය ගැනීමට නොව) පමණි.

සමස්තයක් වශයෙන් මෙම දුර්විපාකයන් හි තත්ත්වය සහ අධිකරණයේ ස්වාධීනත්වය නොමැති වීම සමලිංගික, LBT පුද්ගලයින් සහ සමස්තයක් වශයෙන් සුළුතර ලිංගික ප්‍රජාව තව තවත් අසරණ සහ අදෘශ්‍යමාන කරවන්නකි. ඔවුන්ගේ ලිංගිකත්වය, වෙනත් අවාසි සහගත සාමාජිකත්වය සමග අන්තර් ඡේදනය වීමත් සමග ඔවුන්ගේ අසරණභාවය සහ අදෘශ්‍යමාන තත්ත්වය තවත් වැඩි වේ. උදාහරණයක් වශයෙන් LBT අයිතීන් වෙනුවෙන් වැඩකරන සංවිධාන අතරින් දෙමළ ජාතියට අයත් LBT පුද්ගලයින්ගේ සාමාජිකත්වය අඩු බව වාර්තා කරනු ලැබේ. කෙටියෙන් කියතොත්, රට මුහුණදෙන මානව හිමිකම් අර්බුදය විසින් සංකීර්ණ වාතාවරණයක් නිර්මාණය වී ඇති බැවින් සුළුතර ලිංගික ප්‍රජාවට ඔවුන්ගේ අයිතිවාසිකම් ලබාගැනීම සඳහා වැඩ කිරීම වඩාත් අපහසු වී ඇත.[22]

22. අනෙකුත් දකුණු ආසියාතික රටවල්වල මෙන් ශ්‍රී ලංකාවේ දේශපාලකයන් සහ අනෙකුත් ප්‍රසිද්ධ පුද්ගලයින්, වැඩිහිටියන්ගේ කැමැත්ත ඇතිව පෞද්ගලික පරිසරයක සිදුවන ලිංගික ක්‍රියාකාරකම් අපරාධයක් ලෙසට පෙන්වීම තවදුරටත් සාධාරණීකරණය කිරීම සඳහා සමලිංගික සම්බන්ධතා බටහිර සංකල්පයක් ලෙසට සලකා බැහැර කරනු ලැබේ. උදාහරණයක් ලෙසට 2003 අගෝස්තු මස ශ්‍රී ලංකා රජය ආසියානු ෆැසිපික් කලාපයේ ඒඩ්ස් පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ සත්කාරකයා විය. මෙම වැඩසටහන සඳහා සත්කාරක රටවීමට ගන්නා ලද මූලිකත්වයට අමතරව මෙහි ලිංගිකත්වය, ලිංගික සෞඛ්‍ය සහ සුළුතර ලිංගික ප්‍රජාවගේ අයිතිවාසිකම් පිළිබඳ සැසිවාර බොහොමයක් පවත්වන ලදී. සමුළුව අවසානයේ දී මෙම සමුළුවේ වාර්තාකරුවා විසින් සහභාගිවන්නන්ට ලබාගැනීමට කොණ්ඩම් නොමැතිවීම පිළිබඳව නගන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන්, සෞඛ්‍ය ඇමතිවරයා විසින් දෙන ලද පිළිතුර වූයේ ''මම කැමැති නැහැ, මිනිස්සු හිතනවාට මම මේ සියලුදෙනාම මෙහි ගෙනාවේ ලංකාවේ සමලිංගිකත්වය සහ ස්ත්‍රී සමලිංගිකත්වය ප්‍රවර්ධනය කිරීමට යි කියලා. ශ්‍රී ලංකාවේ ලස්සන ගැහැණු සහ කඩවසම් පිරිමි ඕනෑතරම් ඉන්නවා. දකුණු ආසියාතික මිනිස්සු තනි ලිංගික සහකරුවෙකු සමග හොඳ ලිංගික හැසිරීමක යෙදෙනවා. බටහිර ලෝකයේ ජනයා කැලෑවල ජීවත්වන කාලේ අපි ශිෂ්ට සම්පන්න ජීවිතයක් ගත කළා.'' ප්‍රනාන්දු ඇම්. (2008) "Vagrant Voice" Himal South Asia, 21 වෙළුම (3) බලන්න. (අන්තර්ජාලය) http://www.himalmag.com/Vagrant-voices_nw2138.html

# [ # 06 රාජ්‍ය නොවන පාර්ශවයන්ගෙන් සිදුවන හිංසනය සහ වෙනස්කොට සැලකීම ]

## a. චිත්තවේගික[23] හිංසනය – imotional violance [24]

මෙම පර්යේෂණ සඳහා සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ සියළුම LBT පුද්ගලයින් චිත්තවේගික හිංසනය අත්විඳ ඇත. මෙහි හැඳින්වීමේ සඳහන් කරන ලද පරිදි, සහන ලබාගත හැකි මාර්ග නොමැති නිසා LBT පුද්ගලයින්ට මෙම හිංසනය වඩාත් ප්‍රබල ලෙසට අත්විඳීමට සිදුවේ. ලාංකික සම්ප්‍රදායට අනුව විවාහ වීමට පෙර තමුන්ගේ පවුලේ අය සමග ජීවත්වීමේ ප්‍රවනතාවය (සමහර අවස්ථාවල දී විවාහයෙන් පසු ද) දැනටමත් චිත්තවේගික හිංසනය අත්විඳින LBT පුද්ගලයින්ගේ පීඩනය වැඩි කිරීමට හේතුවක් විය හැකිය. එමනිසා ඔවුන් ගෙදරින් පිටව යාමට 'හේතුවක්' ලෙසට රැකියාව හෝ අධ්‍යාපනය යොදාගැනීම අසාමාන්‍ය නොවේ. (මේ පිළිබඳව වැඩි විස්තර දැනගැනීම සඳහා 'ක්‍රියාකාරී/ක්‍රියකාරීන්ගේ පිළිතුරු' කොටස බලන්න.)

23. චිත්තවේගික යනු ඃ බය, තරහ, කෝපය හෝ සතුට යනාදී හැඟීම් ප්‍රකාශ කරන ආකාරය යි.

24. චිත්තවේගික හිංසනය යනු : බොහෝවිට මානසික සහ ශාරීරික අපයෝජනය සමග මිශ්‍රව භාවිතා වන පදයකි. සම්මුඛ සාකච්ඡාවන්ට බඳුන් වූ ඇතැම් පිරිස් තම අධ්‍යාත්මයට හෝ අභිමතයට ඇතිවන හිංසනයක් ලෙස එය හැඳින්වීම ප්‍රිය කරයි. මෙහි දී වැදගත් වන්නේ අත්දුටු චර්යාව හෝ ක්‍රියාව තමාට චිත්තවේගිකව/අධ්‍යාත්මිකව ප්‍රචණ්ඩකාරී අත්දැකීමක් වූවා ද යන්නය. මෙම පර්යේෂණයේ සඳහන්වන චිත්තවේගික හිංසනය සිදුකරනු ලබන චර්යා සහ ක්‍රියා නම් ; වාචික අපචාර; (නින්දා, සමච්චලයට ලක් කිරීම, අසභ්‍ය වචනයෙන් බැණ වැදීම, පහත් කිරීම, අවතක්සේරුවට පත් කිරීමේ ප්‍රකාශන, අසාමාන්‍ය යැයි හංවඩු ගැසීම) තර්ජන; (තමාට හෝ අන් අයට හානි කරන බවට, අත්හරින බවට, බැහැර කරන බවට, සිරගත කරන බවට, වෙනත් අයට හෙළිකරන ආදී) පාලනය කිරීමේ ක්‍රියාමාර්ග; (උදාරහණ වශයෙන් පවුලේ අය/අසල්වාසීන්/යහළුවන් සමග කාලය ගතකිරීම සීමා කිරීම, පෞද්ගලිකත්වය ඇහිරීම) නිශ්ශබ්ද සතුරුකම්; (උදාහරණ වශයෙන්ඃ නිග්‍රහ කිරීමට වාචික නොවන චර්යා භාවිතය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සහ ප්‍රකාශනය නොපිළිගැනීම සහ/හෝ ප්‍රතික්ෂේප කිරීම) අතහැර දැමීම (උදාහරණ වශයෙන් : මුදල් දීම, නැවැත්වීම, මානුෂීය සම්බන්ධතා අවහිර කිරීම) ය.

චිත්තවේගික හිංසනය සිදුවීමට විවිධ ප්‍රතික්‍රියා හේතු වේ. කෙසේ නමුත්, පුද්ගලයකුගේ ලිංගික නැඹුරුව හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හෝ එම පුද්ගලයා විසින් 'තමන් පිළිබඳව කරන හෙළිකිරීම' (ඔහුගේ/ඇයගේ ලිංගිකත්වය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය පිළිබඳ හෙළිකිරීම පිළිබඳ දැනගැනීම සහ චිත්තවේගී හිංසනයන් සිදුවීම එකට බැඳී තිබෙන්නක් බව පොදුවේ දක්නට ලැබුණු සාධකයකි.

සිද්ධීන් කීපයක දී, සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ පුද්ගලයා ස්ත්‍රියකවීම සහ ඇයගේ ලිංගික නැඹුරුව පිළිබඳව අපරාධකරු දැනගෙන සිටීම හිංසනයට සාධක වී තිබුණි.

චිත්තවේගික හිංසනය සිදුකරන අපරාධකරුවන් විවිධ ය. බොහෝ විට අපරාධය සිදුකරන්නා ප්‍රතිචාරය දක් වූ පුද්ගලයාගේ පවුලේ සමාජිකයින් හෝ ප්‍රතිචාර දක් වූ පුද්ගලයාගේ සහකරුවාගේ පවුලේ සාමාජිකයින් ය. සමහර සිද්ධීන්වල දී හිංසනය සිදුකරන ලද අපරාධකරුවන් වූයේ පෙර සහකරු, වර්තමාන සහකරුගේ පෙර සහකරුවකු හෝ සම වයසේ මිතුරන් ය. සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ පුද්ගලයින් සුළු පිරිසක් ආගන්තුකයන් අතින් හිංසනයට ලක්වී හෝ හිංසනයට පත් කරතැයි තර්ජන එල්ල වී ඇති පුද්ගලයෝ වූහ.

LBT පුද්ගලයින් කරදර, නින්දා, බලය සහ පාලනය සමග චිත්තවේගික හිංසනය අත්දකින ආකාරයන් බොහෝමයක් ඇත.

පෞද්ගලිකත්වය ඇහිරීම; (හතරෙන් තුනකට වඩා වැඩි-ප්‍රතිචාර දක් වූ 33 දෙනාගෙන් 26 දෙනෙකු විසින් වාර්තා කළ පරිදි) වාචික නොවන හෝ නිශ්ශබ්ද නිග්‍රහ කිරීම (silence) හෝ සතුරුකම් (අඩකට වඩා වැඩි පිරිසක් - ප්‍රතිචාර දක් වූ 19 දෙනෙකු විසින් වාර්තා කරන ලදී) සහ චිත්තවේගික අවමන් සහගත තර්ජනයන් (Emotional blackmail) මෙම හිංසනයේ (අඩකට වඩා වැඩි - ප්‍රතිචාර දක් වූ 19 දෙනෙකු විසින් වාර්තා කර තිබුණි) ප්‍රධාන ලක්ෂණ වේ.

අඩකට වඩා වැඩි පිරිසක් (ප්‍රතිචාර දක් වූ 18 දෙනෙකු විසින් ඔවුන්ගේ දුරකථන ඇමතුම් සහ ලිපි පරීක්ෂාවට ලක්කිරීම වැනි සමජගත වීමට ඇති බාධාවන්; ඔවුන්ගේ ලිංගිකත්වය සැක කරන අවස්ථාවන්හි දී ඔවුන්ට පිටතට යාමට ඉඩ නොදීම, ඔවුන් පසුපස

යාම සහ ඔවුන්ගේ ලිංගික නැඹුරුව හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය නිසා නිවස තුළ සිරකර තැබීම වැනි අත්දැකීම් අත්විඳ ඇති බවට වාර්තා කරන ලදී. දළ වශයෙන් 1/3 ට (13 දෙනෙකු ඔවුන්ගේ සමලිංගික සම්බන්ධතාවය නවතන ලෙසට බලකර ඇති අතර, නිහඬ සතුරුකම්වලට ලක් වූ බවට විශ්වාස කරයි. (උදාහරණ වශයෙන්ඃ ඔවුහු කාමරයේ සිටින විට, නොසිටිනවා මෙන් ඔවුන්ට සැලකීම සහ/හෝ ප්‍රථම පුරුෂයෙන් ඔවුන්ට ආමන්ත්‍රණය කිරීම)

සම වයසේ මිතුරන්ගෙන්, ගුරුවරුන්ගෙන්, රැකියා ස්ථානයේ පුද්ගලයින්ගෙන්, පාලකවරුන්ගෙන් සහ රජයේ පුද්ගලයින්ගෙන් වන චිත්තවේගී අපයෝජනයට අමතරව තම මිතුරන්ගෙන් සිදුවන උසුළු, විසුළු, වාචික හිංසනය සමච්චල් කිරීම දක්වා යෑම ඉතා ඉහල අගයක් දක්වන බව සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ පුද්ගලයින්ගෙන් වාර්තා විය.

DKS, අවුරුදු 28 ක් වයසැති, ස්ත්‍රී සමලිංගිකයෙකු වන අතර, කොළඹ නගරයට නුදුරින්, ඇයගේ මෘදු පිරිමි පෙනුමැති සහකාරිය සමග වාසය කරයි. ආගමික ස්ථානයක දී ඇයට අත්විඳීමට සිදු වූ නිග්‍රහයන් සහ උකුසු ඇස්වලට ලක්වීමක් පිළිබඳව ඇය අප සමග පැවසුවා ය. ''මම පල්ලි යනවා. මම එතන හිටගෙන කල්පනා කළා... දන්නවානේ, මේ ඔක්කොම මිනිස්සු අපි දිහා බලාගෙන ඉන්නවා. ඒ ගොල්ලෝ හොඳටම දන්නවා අපි සමලිංගික ජෝඩුවක් හෝ අපි සාමාන්‍ය නොවන අය කියලා. මට හොඳටම විශ්වාසයි සමහර අය හිතන්න ඇති, 'මේ අය මොන එකකට මෙහාට ආවද' කියලා''යැයි ඇය පැවසීය.[25]

සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ එක් පුද්ගලයකු ඇයට, ඇයගේ පෙර සහකාරියගේ මව්පියන්ගෙන් එල්ලවුන වාචික නොවන හෝ නිශ්ශබ්ද නිග්‍රහයක් පිළිබඳව කියා සිටියා ය. 39 හැවිරිදි චාන්දනී, කොළඹ වාසය කරන අතර ඇය, තමා මෘදු පෙනුමැති සමලිංගික කාන්තාවක් ලෙස හඳුන්වයි. ඇයගේ පෙර සහකාරියගේ දෙමාපියන් ඇය ඔවුන්ගේ දියණිය 'නරක් කරනවා' යැයි සිතූ බවත් ඇයව අදෘශ්‍යමාන ලෙසට සලකා ප්‍රතිචාර දක්වූ බවත් කියා සිටියා ය.

25. DKS සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2010 සැප්තැම්බර් 18.

''මෙය මට බොහෝ අවස්ථාවන්වලදී සිදුවෙලා තියනවා... ඒ දෙමව්පියන් සමග මම රාත්‍රි කෑම කාලත් තියනවා. ඒත් ඔවුන් මාව පිළිගැනීම ප්‍රතික්ෂේප කළා.''[26]

21 හැවිරිදි ධම්මි, සිංහල බෞද්ධ වන අතර, කොළඹ නගරයට නුදුරින් වාසය කරයි. ඇයගේ ලිංගික නැඹුරුව හඳුන්වාදීමට ඇය නිශ්චිත වචනයක් භාවිතා කිරීමට අකමැතිය; ඒ වෙනුවට ඇය 'දෙවිදියටම සිටීම' ට කැමැති අතර ඇයගේ ස්ත්‍රි-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය 'මැද මාවතේ' තිබෙන්නක් ලෙසට විග්‍රහ කරයි. ධම්මිගේ සහෝදරයා ඇය සමලිංගික කාන්තාවක් යැයි දැනගත් පසු ඇය චිත්තවේගාත්මකව පාලනය කිරීමට හෝ කප්පම් ගැනීමට ක්‍රියා කළ ආකාරය පිළිබඳව ඇය පැවසුවා ය. ''ඔහු මට මගේ යෙහෙළිය සමග තිබෙන සම්බන්ධය නැවැත්තුවේ නැති නම් එයා මාත් සමග කතා කරන්නේ නෑ කියලාත් අපේ අම්මට මේ ගැන කියනවා කියලාත් මට තර්ජනය කළා'' යැයි ඇය තවදුරටත් කියා සිටියා ය.[27]

චමිලා 36 වන වියේ පසුවන අතර ඇගේ දෙමාපියන් සමග කොළඹ නගරයට නුදුරින් වාසය කරයි. ඇය ස්ත්‍රී සමලිංගික පුද්ගලයෙකු ලෙසට තමාව හඳුන්වා ගන්නා අතර, පිරිමි ඇඳුම් ඇඳීම ප්‍රිය කරයි. මව විසින් ඇයගේ ස්ත්‍රී සමලිංගිකත්වය 'සුව කිරීම' සඳහා මනෝ වෛද්‍ය වෘත්තිකයකු වෙතට ඇයව රැගෙන ගිය ආකාරය පිළිබඳව ඇය සඳහන් කළාය. ''එයා කිව්වා (අම්මා) මගේ ඔලුව කැක්කුම සුවකිරීමට මා වෛද්‍යවරයකු ළඟට රැගෙන යනවා කියලා. මම බැලුවා මේ ඔලුව කැක්කුම මොකක් ද කියලා... මම මුකුත් කිව්වේ නෑ. නමුත් මට පස්සේ තේරුණා එයා මාව අරගෙන ගිහින් තියෙන්නේ මනෝ වෛද්‍යවරයෙකු ළඟට කියලා'' යැයි ඇය කියා සිටියා ය.[28]

26. චාන්දනී සමග පැවැති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2010 නොවැම්බර් 17.

27. ධම්මි සමග පැවැති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 ජනවාරි 19.

28. චමිලා සමග පැවැති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 අගෝස්තු 08.

## i. වාචික අපයෝජනය (Verbal Abuse)

වාචික අපයෝජනය, එකපිට එක එල්ල කරන අපහාස මගින් පහත් කොට සැලකීම සහ අවමන් කිරීමේ ක්‍රම, අපහාසාත්මක ප්‍රකාශ සහ ද්වේශ සහගත කතා බහ, සියලු වයස් කණ්ඩායම්වල පුද්ගලයින් අත්විඳින ලද පොදු අත්දැකීමක් වූ අතර වාචික අපරාධ කරන අපරාධකරුවන්, පවුලේ සාමාජිකයින්ගේ සිට අසල්වාසීන් දක්වාත් වෙනස් වූ අතර, LBT ප්‍රජාවේ අනෙකුත් සාමාජිකයින්, පෙර සහකරුවන්, සේවාදායකයින් සහ අනාගත සේවාදායකයින් විය.

කුමා, 47 හැවිරිදි වන අතර කොළඹ නගරයට නුදුරින් වාසය කරයි. ඇය ස්ත්‍රී සමලිංගික පුද්ගලයෙකු ලෙසින් තමා හඳුන්වා ගන්නා ලද අතර, පිරිමි ඇඳුම් ඇඳීමට කැමැති බව පවසයි. ඇයගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය පුරුෂ අර්ථකතනය සහ ප්‍රකාශනය හේතුවෙන් ඇයට මහා මාර්ගයේ අත්විඳීමට සිදු වූ වාචික හිංසනයන් පිළිබඳව ඇය පැවසුවා ය. ''එක දවසක් මම ගෑණු ළමයෙකුගේ අතින් අල්ලාගෙන කොටුවේ ඇවිදගෙන ගියා. ඒ ඇත්තටම ඇය මගේ යාළුවා නිසාත් ඇයව සෙනඟ අතර අතරමං වෙයි කියන බයට. මට ඇහුනා එක තරුණයකු කියනවා 'ඒයි මචං ගොඩක් කාලෙකින් මම ආප්පයක්[29] කෑවේ නෑ. අදවත් එකක් කන්න පුළුවන් වෙයි'' කියලා යැයි ඇය පැවසුවා ය.[30]

චාන්දනී සහ ඇයගේ සහකාරියට අසල්වාසීන් කිහිපදෙනෙකුගෙන් එල්ල වුණු වාචික අපයෝජන සිද්ධියක් පිළිබඳව ඇය පවසා සිටියා ය. ''මම මේ ළමයා එක්ක යාළුවෙලා හිටියේ. මම එයාගේ ගෙදරට ගියා, එතකොට ගොඩක් රෑ වෙලා. වෙලාව රෑ 11 ට හෝ 12 ට ඇති. ඉතින් අපි ගෙට ඇතුල් වුනා. අපි ගේට්ටුව වැහුව ගමන්ම තරුණයෝ කට්ටියක් පාර උඩ ඉඳලා ඇවිල්ලා ගේට්ටුවට ගහන්න පටන් ගත්තා ආප්ප, ආප්ප කියලා.''[31] යැයි කීවා ය.

29. ආප්ප - ස්ත්‍රී සමලිංගිකයන් හැඳින්වීමට අපහාසාත්මකව භාවිතා කරනු ලබන පදයකි.

30. කුමා සමග පැවැති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 මැයි 10.

31. චාන්දනී සමග පැවැති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2010 නොවැම්බර් 17.

මෙම සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ සමහර පිරිස් කියා සිටියේ, ඔවුන්ගේ ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය අර්ථකතනය හෝ ප්‍රකාශනය මත වන ලිංගික නැඹුරුව හේතුවෙන් ''රෝගී'' පුද්ගලයින් සහ ''ප්‍රතිකාර'' අවශ්‍ය පුද්ගලයින් ලෙසට ඔවුන්ව තේරුම් ගන්නා ලද බවයි.

උදාහරණයක් ලෙසට, 34 හැවිරිදි ස්කිනර්, කොළඹ නගරයේ ජීවත් වෙයි. ජීව විද්‍යාත්මකව ස්ත්‍රියක වන ඔහු, ඔහුගේ ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය 'සාමාන්‍ය පිරිමි' යන වචන දෙක යොදාගෙන විග්‍රහ කරයි. ''කවුරුහරි මම වෙනස් යැයි සිතුවොත්, ඒ ගොල්ලෝ එක එක නම් කියනවා. මට පොන්නයා[32] කියලා කියනවා. එහෙම නැත්නම්, 'මේ පිරිමියෙක් ද? ගැහැණියක් ද?' '' කියලා අහනවා[33] යැයි පැවසුවේ ය. ඔහුගේ මව, ඔහු බලෙන්ම ආගමික/වෛද්‍ය පුද්ගලයන් ළඟට රැගෙන ගොස් ඇත. ''ශ්‍රී ලංකාවේ බෞද්ධයන් 90% ක් ම වාගේ හින්දු භක්තිකයන්. ඒ ගොල්ලෝ කෝන්දර වගේ දේවල් අරගෙන සාස්තරකාරයෝ හොයාගෙන හැම තැනම යනවා. දන්නවානේ- මේ සාස්තරකාරයෝ ගැන. ඒ පුද්ගලයාම හෝ වෙනත් කෙනෙකු හෝ එතනම අයුර්වේද බෙහෙත් දෙනවා. ගිය මාසෙත් මාව එවැනි තැනකට අරගෙන ගියා'' යැයි  ඔහු පැවසීය.

අවසාන වශයෙන්, සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ පුද්ගලයින් හතරදෙනෙකු කියා සිටියේ, ඔවුන්ගේ ලිංගික නැඹුරුව හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාව, ඔවුන්ගේ කැමැත්තකින් තොරව, යහළුවන්ට, පවුලේ අයට, මහජනයාට (උදා: මාධ්‍ය තුළින්) අධ්‍යාපන ආයතනයන් හි අනෙකුත් සිසුන්ට, එකට රැකියාවේ යෙදෙන්නන්ට සහ තවත් නොදන්නා පුද්ගලයින්ට ආනාවරණය කරන ලද නිසා රැකියා ලබාගැනීමේ දී, පවුලේ සහාය ලබාගැනීම, නිවාස ලබාගැනීම ඇතුළු අනෙකුත් බොහෝ කරුණුවල දී ඔවුන් අසරණ තත්ත්වයට පත්වූ බවයි.

32. ස්ත්‍රියක මෙන් හැසිරීම් හෝ පෙනුමක් සහිත පිරිමියෙකු හැඳින්වීමට යොදන අපහාසාත්මක පදයකි.

33. ස්කිනර් සමග සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 ඔක්තෝබර් 7.

සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ පුද්ගලයින් 21 දෙනෙකුට ශාරීරික හානි සිදුකරන බවට වාචිකව තර්ජන කර ඇති අතර මෙය ඔවුන්ට හෝ ඔවුන්ගේ සහකරුවන් හෝ ඔවුන්ට සමීප පුද්ගලයින් වෙත සිදුකොට ඇත. මෙවැනි සිද්ධීන් පහළොවක දී, කම්මුලට ගැසීම සහ පහරදීම් වැනි ශාරීරික හිංසන මෙන්ම වාචික තර්ජන පිළිබඳ කරුණු ද අනාවරණය විය.

විසිනව හැවිරිදි දෙමළ ද්විලිංගික ස්ත්‍රියක වන අනූ, අපට කියා සිටියේ ඇයට තර්ජනයකර ඇති පුද්ගලයින්, "(මගේ) යහළුවන් ගේ (පුමංගහරණය castration) වෘෂණ කෝෂ කපාදමන බව මිනිස්සු කියනවා. අපට හොකී පොලුවලින් ගසා, ගිනි තියනවා වගේ දේවල් ඒගොල්ලෝ අපිට කියලා තියනවා." [34]

චමිලාගේ සහකාරියගේ පවුලේ අය, ඇයට හමු වී නොමැති බවත්, ඇයට ඍජුවම කිසිත් කියා නැති බවත් ඇය කීවා ය. නමුත් "ඔවුන් ඇයට (මගේ සහකාරියට) කියලා තිබුණා, ඒගොල්ලන්ට මාව මුණගැහුනොත් මට කම්මුලට ගහනවා කියලා." [35]

1999 ජූලි මස දී කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ස්ත්‍රී සමලිංගිකයින් සඳහා සමුළුවක් පවත්වන්නට යන බව නිවේදනය කිරීමත් සමග එය මහජනයාගේ බලවත් විරෝධයට ලක් විය. එක් විරෝධතාවයක්, පුවත්පතක කතෘට යවන ලද ලිපියක් මගින් සිදුවූ අතර, එය 'ද අයිලන්ඩ්' නම් ඉංග්‍රීසි පුවත්පතේ පළ විය. එය කොතරම් දුර දිග ගියේදැයි කියතොත් මෙම සමුළුවට සහභාගිවන කාන්තාවන්, දූෂණයට වරදකරුවන් වූ අපරාධකරුවන් කණ්ඩායමක් යොදවා දූෂණය කරවන බවට පුවත් පැතිර ගියේ ය. මෙම පුවත්පතට විරුද්ධව පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලද අතර, ශ්‍රී ලංකාවේ පුවත්පත් මණ්ඩලය එම පුවත්පත වෙනුවෙන් පෙනී සිට ස්ත්‍රී සමලිංගිකත්වය "පරපීඩක (sadistic and salacious) කාමුකත්වය සහ කාමුක" දෙයක් ලෙසට හෙළා දකින ලදී.[36]

34. අනූ සමඟ සම්මුඛ සාකච්ජාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 මැයි 13.

35. ස්කිනර් සමඟ සම්මුඛ සාකච්ජාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 ඔක්තෝබර් 8. ප්‍රනාන්දු එම්. (2008) 'Vagrantvoices', හිමාල් දකුණු ආසියාන, තගාලව 21(3). http://himalmag.com/component/content/article/1010-vagrant-voices.html(accessedFeb2013)

## ii. සංස්කෘතික/ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සම්මතයන් හි බලපැවැත්වීම මත ඇතිකරනු ලබන හිංසනය
(Violence of cultural norm/gender norm enforcement)

සම්මුඛ සාකච්ඡාවට ලක් වූ පුද්ගලයින් 33 දෙනාගෙන් 12 දෙනෙකු පෙන්වා දුන් පරිදි  බුච්[37] සමලිංගිකයින් සහ ට්‍රාන්ස් පුද්ගලයින්ට සංස්කෘතිය මගින් බලාපොරොත්තුවන ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සම්මතයන්ට අනුව  විවෘතවීමට බලකිරීම, සම්මත ආකාරයට ඇඳුම් ඇඳීමට සිදුවීම සහ සම්මත ආකාරයට කොණ්ඩය සැකසීමට, ජීවත්වීමට සහ පෙනී සිටීමට සිදුවීම හේතුවෙන් නිරන්තර පීඩනයකට ලක්වන අතර, මේ සියලු අත්දැකීම් මනෝමය සහ මානසික හිංසනය ලෙසට අත්විඳ ඇත. සම්මුඛ සාකච්ඡාවලට මුහුණ දුන් මෙම පුද්ගලයින් කියා සිටියේ පොදු වැසිකිලි භාවිතයේ දී ඔවුන්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සහ අර්ථකතනය පිළිබඳව ප්‍රශ්න කරන ලද බවයි. මෙලෙස සංස්කෘතික සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සම්මතයන් රැකගැනීමට සිදුවීම ද ඔවුහු අත්විඳින ලද හිංසනයන් බව කියා සිටියහ. ඒ හා සමාන ලෙස, සම්මුඛ සාකච්ඡාවන්ට භාජනය වූ ඇතැම් පුද්ගලයින්ට ඔවුන්ගේ කීර්තිය ආරක්‍ෂා කරගැනීම සඳහා 'සමලිංගික පිරිමින් ලෙස වැඩිපුර නොපෙන්වීමට හෝ නොවී සිටීමට' සහ ඔවුන්ගේ තත්ත්වය රහසක් ලෙසට තබාගැනීමට බල කරන ලද පරිසරයක් විය. තවත් සමහර සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ පුද්ගලයින්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අර්ථකතනය සහ ප්‍රකාශනය ''කාන්තා පෙනුමක් නැතිවීම'' යන කරුණ පදනම්ව රැකියාවන්වලට නොගැනීම, රැකියාවේ උසස්වීම් අහිමිවීම සහ හැඳුනුම්පතේ ඇති රුව ඔවුන්ගේ රුව සමග නොගැලපීම යනාදිය හේතුවෙන් රැකියාව අහිමිවීම සම්බන්ධ සිදුවීම් ඔවුන් විසින් වාර්තා කරන ලදී.

## b. ශාරීරික හිංසනය (Physical Violence)

සම්මුඛ සාකච්ඡා විශ්ලේෂණය කිරීම මගින් ඉතා වැදගත් සොයාගැනීම් කිහිපයක් ස්ථාපනය කිරීමට හැකි විය. පවුල සහ ගෘහස්ථ අවකාශය යන ප්‍රධාන සාධක දෙක මගින්, ප්‍රථමයෙන් LBT පුද්ගලයින්, ඔවුන්ට එරෙහිව සිදුවන ශාරීරික හිංසනයේ

37. බුච් (butch) කරුණාකර පාරිභාෂිත වදන් මාලාව බලන්න.

ආකාරය හෝ හැඩය නිශ්චය කරන ලද අතර, දෙවනුව ඔවුන් එම හිංසනය වාර්තා කරනවාද? නැද්ද? යන කාරණය පිළිබඳව කියා සිටින ලදී. (හිංසනය වාර්තා කිරීම පිළිබඳව වැඩි විස්තර සඳහා, iv කොටසෙහි එන සහන මාර්ගවලට පිවිසීම බලන්න.)

සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ 33 දෙනාගෙන්, 12 දෙනෙකු විසින් ඔවුන්ගේ ජීවිතයේ අත්විඳින ශාරීරික හිංසනය සම්බන්ධයෙන් ප්‍රකාශ කරන ලදී.[38] සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ පුද්ගලයින් 33 දෙනාගෙන් 26 දෙනෙකු පහරදීම් සම්බන්ධයෙන් කියා සිටියේ ය. මෙම පහරදීමේ වාර්තා 26 න් 12 ක් ම සුළු සිදුවීම් වූ අතර, 14 ක් දරුණු සිදුවීම් විය.

පවුලේ ළඟම ඥාතීන්, ආගන්තුකයින්, සමවයසේ මිතුරන්, සහකරුවන්, පෙරසහකරුවන් සහ අසල්වාසීන් වැරදිකරුවන් අතර විය. සැලකිය යුතු ප්‍රමාණයකින් එනම් එවැනි සිදුවීම් 12 ක්ම සහකරු විසින් සිදුකරන ලද හිංසනයන් සම්බන්ධයෙන් වන සිදුවීම් බව හඳුන්වා ගන්නා ලදී.

DKS ඇයගේ සහකාරිය සමග රාත්‍රී සමාජ ශාලාවක නටමින් සිටින අතරතුර මුහුණ දුන් සිදුවීමක් මතක් කර සිටියා ය. ''දන්නවානේ මිනිස්සු කොහොමත් අපි දිහා බලාගෙන ඉන්නවා, අපි එතන නටනකොට.... මේ කොල්ලා, ඇත්තටම, ආවා, ඇවිල්ලා මගේ කකුල පාගලා හැප්පෙන්න ආවා.... මම හිතන්නේ එයා ඒක කළේ හිතලමයි කියලා මොකද, මම කොල්ලෙක් වගේ පේන කෙල්ලක් සමග නටමින් හිටියා, ඒකට එයා අකමැත්තෙන් හිටියේ.... මම හිතන්නේ එයාට රණ්ඩුවක් ඇති කරන්න ඕන වුනා, මොකද මගේ සහකාරිය පුරුෂ සමලිංගික පුද්ගලයකු ලෙස පෙනුන නිසා'' යැයි ඇය කියා සිටියා ය.[39]

තිස්හතර හැවිරිදි සැන්ඩ්‍රා, තමා ස්ත්‍රී සමලිංගික පුද්ගලයකු ලෙසට හඳුන්වා ගන්නා අතර, 'පිරිමි ගති ඇති කාන්තාවක' ලෙසට තමන්ව දකී. ඇය, තවත් තරුණියක සමග නටමින් සිටින නිසා ප්‍රසිද්ධ රාත්‍රී සමාජ ශාලාවක, රථගාලක දී නොදන්නා පුද්ගලයින් කණ්ඩායමක් සමග ගැටුමක් ඇති වූ ආකාරය පිළිබඳව ඇය විස්තර කළාය.

38. සම්මුඛ සාකච්ඡා අතරතුර, දැනට ශාරීරික හිංසනය අත්විඳින පීඩනයක/කරදරයක සිටින පුද්ගලයකු සිටි විට, කාන්තා ක්‍රියාකාරී කමිටුව, සම්මුඛ සාකච්ඡා මෙහෙයවන්නට උපදෙස් ලබා දී තිබුණේ මෙම වින්දිතයන්ට තම පීඩාවන් සඳහා ප්‍රතිකාර හෝ සහනයක් ලබාගත හැකි වෛද්‍යවරයකුගේ සම්බන්ධතාවය ඔවුන් වෙත ගොඩනගා දෙන ලෙසට ය.

39. DKS සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කමිටුව, ශ්‍රී ලංකාව, 2010 සැප්තැම්බර් 18.

'මට මතකයි පිරිමි දෙන්නෙක් මාව උරහිසින් තදකරලා අල්ලාගෙන, බිත්තියකට තදකරගෙන බඩට තදින් ගැහුවා. මම කොහොම හරි ඒ ගොල්ලන්ගෙන් බේරිලා, එක්කෙනෙකුගේ මූණට ගහලා එයාගේ තොල පැලුවා. ඊට පස්සේ තමයි ඒ අය මාව දාලා ගියේ. ''ආ, එයානම් නිකම්ම පරාජය බාරගන්න කෙනෙක් නෙමේ'' කියමින් ... මා පෙරළා සටන් කරන බව ඒ ගොල්ලෝ දැන ගත්තට පස්සේ මාව දාලා ත්‍රී වීල් එකකට නැගලා පැනලා ගියා' යැයි පැවසුවා ය.

චමිලා අප සමඟ කියා සිටියේ, ඇයට වයස අවුරුදු 25 දී ඇය ස්ත්‍රී සමලිංගිකයෙකු බව තම පියා දැනගත් පසු, ඔහු තමාට තදින්ම පහර දුන් බව ය.

## C. ලිංගික ප්‍රචණ්ඩත්වය (Sexual Violence)

සම්මුඛ සාකච්ඡා දත්තවලට අනුව, සම්මුඛ සාකච්ඡාවන්ට ලක් වූ 33 දෙනෙකුගෙන් 18 දෙනෙකු කියා සිටියේ තමන් කවර අන්දමක හෝ ලිංගික ප්‍රචණ්ඩත්වයකට ලක්ව ඇති බවයි. ලිංගික ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රී දූෂණයේ සිට ලිංගික අපයෝජනය දක්වා ව්‍යාප්ත වේ. තම පවුලේ සාමාජිකයින්, යහළුවන්, සේවා දායකයින් හෝ උසස් නිලධාරීන්. නොහඳුනන පුද්ගලයින් සහ තමා සමඟ රැකියාවේ නියුතු පිරිස් අපරාධකරුවෝ වූහ.

යමෙකුට තමන් ලිංගික දූෂණයට ලක්කරන බවට තර්ජන එල්ල කිරීම මගින්, එම පුද්ගලයාට තමන්ගේ ශරීරය පිළිබඳ අනාරක්ෂිත බවක් හැඟෙන අතර, තමන්ගේ ශරීරය තමා පිළිබඳව වන ඉතාම සමීප හැඟීම සහ ප්‍රධානතම දෙය වේ. උදාහරණයක් ලෙස, 39 හැවිරිදි රොෂ්මි ස්ත්‍රී සමලිංගිකයකු යැයි හඳුන්වා ගන්නා අතර, දැනට තම සහකාරිය සමග කොළඹට නුදුරින් පදිංචිව සිටී. මොවුන් දෙදෙනා උතුරු මැද පළාතේ ජීවත්වන කාලයේ දී ''අසල්වැසියන් සමග සුහදව සිටිය ද අප සමලිංගිකයින් බව දැනගත් පසු ඔවුන් පවා අපට කියා සිටියේ බලහත්කාරයෙන් අපව දූෂණය කරන බව'' යැයි ඇය කියා සිටියා ය.[40] මෙම තර්ජන ක්‍රියාත්මක නොවූවද, රොෂ්මි සහ ඇයගේ සහකාරිය ඉතා බයෙන් ජීවත් වූ බවත්, අවසානයේ දී එම පළාත අතහැර කොළඹ පදිංචියට ඒමට සිදු වූ බව තවදුරටත් ඇය ප්‍රකාශ කළා ය.

40. රොෂ්මි සමග කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2012 ජනවාරි 06.

ස්ත්‍රියකගේ කලින් පෙම්වතා. ඇයගේ අතීත ස්ත්‍රී සමලිංගික අත්දැකීම්, ඇය නැවත නැවත දූෂණය කිරීමට සහ එය සාධාරණීකරණය කරගැනීමට යොදාගෙන ඇත. 28 හැවිරිදි ක්‍රිස්ටි (ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත තීරණය වන අර්ථකතනයේ සහ ප්‍රකාශනයේ දී ද්වි ලිංගිකයෙකු ලෙස තමා හඳුන්වා ඇත) කියා සිටියේ තමන්ගේ පෙම්වතා, ඔහු සමග ලිංගිකව හැසිරෙන ලෙසට සමහර අවස්ථාවල දී තමන්ට තර්ජනය කළ බවයි.

"ඔහු හැම මොහොතක ම ලිංගිකව හැසුරුණා. මට දැනුනේ මාව දූෂණය කරන බවයි. ඔහු මට තර්ජනය කරමින් ලිංගිකව හැසිරුණා. සමහර අවස්ථාවල දී මම එය ප්‍රතික්ෂේප කළ විට, ඔහු මට බලකරමින් 'ඇයි?' දැයි කියා විමසනවා. මම ප්‍රතික්ෂේප කළ සමහර අවස්ථාවල දී ඔහු කියා සිටියේ, 'ඔයා මට දැන් කැමැති නැහැ', 'ඔයා මට දැන් ආදරේ නැහැ', 'නමුත් මට ඕනෑ' යනුවෙනුයි. සමහර අවස්ථාවල දී ඔහු මට කියා සිටියා, මම මගේ පෙම්වතිය සමග සිටින බව මවාගන්නා ලෙසත්, ඔහු මා හා හැසිරෙන හැටි ඇය දන්නා හෝ බලා සිටින බව හිතන ලෙසත්." [41]

ශ්‍රී ලංකාවේ නීතියට අනුව අඹුසැමියන් අතර සිදුවන ලිංගික දූෂණ, අපරාධ ගණයට අයත් නොවන අතර, එමනිසා සමීප සම්බන්ධතාවයක දී සිදුවන ලිංගික දූෂණය, නොහඳුනන පුද්ගලයකු අතින් සිදුවන ලිංගික දූෂණය තරම් බරපතලව පිළිනොගනී.

මෙම අවස්ථාවේ දී, ක්‍රිස්ටි ස්ත්‍රීන් සමග පෙර පැවැත් වූ සමලිංගික බැඳීම් ඉතා පහසුවෙන් තමන්ට වාසි ලබාගැනීම සඳහා යොදාගැනීමට ඇගේ පෙම්වතා විසින් කටයුතු කළ අතර පුරුෂවාදී දෘෂ්ටියකින් මෙන්ම ඔහු තුළ තිබූ, ස්ත්‍රීන් දෙදෙනෙකු එකට සිටිනවා දැකීමේ මානසික විකෘතිභාවයක් සහිත ආශාව ද සම්පූර්ණ කරගන්නා ලදී. ශාරීරික ප්‍රචණ්ඩත්වය මෙන්ම මෙහිදී පැහැදිලි වන තවත් කරුණක් නම් (ඇයගේ සම්මුඛ සාකච්ඡා අනුව) ඔහු තුළ වූ පුරුෂාධිපත්‍යයික හැසිරීම් සහ විෂමලිංගික ක්‍රියාවන්, ඇය පාලනය කිරීම සඳහා ඔහු විසින් යොදාගත් බවයි. ඇයගේ අත්දැකීම් ඔහුගේ අවශ්‍යතා ඉටුකිරීමට සහ ඔහුගේ ආශාවන් සන්තර්පනය කිරීමට යොදාගත් බව මෙහි දී අප අමතක නොකළ යුතුය.

41. ක්‍රිෂ්ටි සමග කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 පෙබරවාරි 16.

H ට වයස 23 ක් වන අතර ඇය, 'සමලිංගික තරුණයෙකු' ලෙස තමාව හඳුනාගෙන ඇත. ඇයගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත තීරණය වන අර්ථකතනය සහ ප්‍රකාශනය පුරුෂ වේ. රාත්‍රී සමාජ ශාලාවක සිට තම නිවස වෙත යන අතරමග දී මුහුණ දුන් අනවශ්‍ය ලිංගික ස්පර්ශයක් සම්බන්ධ සිද්ධියක් පිළිබඳව H අප සමග පැවසුවා ය.

"මම 'අමුසියම්' (amuseum) හි උත්සවයකට [42] සහභාගී වී, ත්‍රීරෝද රථයකින් නිවස බලා යමින් සිටියා. ත්‍රී රෝද රථ රියදුරා මා සමග කතා කිරීමට පටන් ගත්තා. සාමාන්‍යයෙන් මම පිරිමි ළමයෙකු වගේ පේන නිසා මට කරදරයක් වෙන්නේ නෑ. නමුත් මේ වේලාවේ, මම හිතන විදියට, මේ පුද්ගලයා මම ගැණු ළමයෙකු බව වටහා ගන්නට ඇති. (නමුත් ඔහුට එය සැකහැර දැනගැනීමට අවශ්‍ය වුනා, මම ගැණු ළමයෙකු වගේ නොපෙනෙන නිසා) ඒ නිසා, ඔහු අමුතු විදියට හැසිරුණා. මම ඔහුට රුපියල් 500 ක් දුන්නා. මගේ නිවස පිහිටා තිබුණේ 'ඇමුසියම්' එක අසලමයි. පයින් ගමන් කළ හැකි දුරක. ත්‍රීවීල් ගාස්තුව වන්නේ රුපියල් 100 ක් විතර. සමහර විට ඔහු මා සමලිංගික තරුණයෙකු ලෙසට හිතන්නට ඇති ඒ නිසා ඔහු අමුතු විදිහට හැසිරුණා. ඔහු මට කීවා 'මල්ලි කටට ගන්නවාද?, එතකොට දෙන්නම් කියලා කිව්වා. මම කිව්වා රුපියල් 500 ක් අරගෙන යන්න කියලා. එතකොට ඔහු මාව අතින් ඇද, මගේ ඇඟ අතගාන්න පටන් ගත්තා. මම එතනින් පැනලා දිව්වා." [43]

සම්ප්‍රදායිකව පිරිමි හෝ ගැහැණු යන ස්ත්‍රී පුරුෂ යන ලිංගික වශයෙන් වෙනස් වූ කොට්ඨාශ දෙකට අයත් නොවන පුද්ගලයින් වෙත පවතින හිංසනයට ගොදුරුවීමේ අවදානම පිළිබඳව මෙම සිදුවීම කියාපායි. ඇයගේ පෙරළිකාර ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ඉදිරිපත් කිරීමට අමතරව H ට ආරක්ෂාකාරී හැඟීමක් ඇතිවන්නේ තමන් ලෙස හෝ අනෙකා ලෙස පෙනී සිටීමේ සිතුවිල්ලත් සමගය. බොහෝවිට පිරිමියෙකු ලෙස H ගේ ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අස්ථාවරභාවය මෙහිදී ප්‍රධානව පෙනුන බැවින් මෙය උපහාසාත්මක සිදුවීමක් ලෙසට පෙනුන ද එය එසේ නොවන්නේ මෙම අවස්ථාව ඇය ලිංගික අපයෝජනයකට ලක් කිරීමට යොදාගත් අවස්ථාවක් බැවිනි. ත්‍රීරෝද රථ රියදුරාගේ

42. ඇමුසියම් (Amuseum) යනු කොළඹ නගරයේ පිහිටි සුප්‍රසිද්ධ රාත්‍රී සමාජ ශාලාවකි.

43. H සමග කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 පෙබරවාරි 12.

අභිමතය වූයේ කුමක්ද යන්න හරියටම පැහැදිලි නැත. (වාණිජ හෝ ලිංගික අරමුණක් හෝ අරමුණු දෙකම) නමුත් ඔහුගේ ක්‍රියාකලාපය පැහැදිලි වශයෙන් ම අවස්ථාවාදීය. 'පුරුෂ' හෝ 'ස්ත්‍රී' පමණක් වශයෙන් පමණක් පැහැදිලිව බාණ්ඩ දෙකකට බෙදීමට අවශ්‍ය යැයි සිතන සමාජීය සන්දර්භයක දී මෙම සිදුවීම ස්ත්‍රී – පුරුෂ සමාජභාවය පිළිබඳ ව්‍යාකූලත්වය (වාසි ලබා ගැනීමට) නිසා සිදුවන අපහරණයට ලක්වීම කියාපාන සිදුවීමකි. මෙම කොටස් දෙකටම අයත් නොවන හෝ අයත්වන පුද්ගලයින් සෑමවිටම ඔවුන්ට මුහුණපෑමට සිදුවන අවදානම් සහගත තත්ත්වයන් සහ එවැනි තත්ත්වයන්ගෙන් ගැලවීමට ඇති ඉතාම සීමිත ඉඩකඩ හෝ ඉඩකඩක් නොමැතිවීම පිළිබඳව දැනටමත් දැනුවත් ය.

කොළඹට ආසන්න නගරයක ජීවත්වන 32 හැවිරිදි ස්ත්‍රී සමලිංගිකයෙකු වන ඉන්ද්‍රාණි ට මේ හා සමාන සිදුවීමකට මුහුණ දීමට සිදුවිය. ඉන්ද්‍රාණි ඇයගේ ස්ත්‍රී – පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය 'මැද මාවතේ'' පවතින දෙයක් ලෙසට හඳුන්වයි. ස්ත්‍රී හෝ පුරුෂ නොවන ඇයගේ ස්ත්‍රී – පුරුෂ සමාජභාවය පිළිගැනීමට ඇති අකමැත්ත හේතුවෙන් ඇය අත්දකින ලද ලිංගික ප්‍රචණ්ඩත්වයක් පිළිබඳ සිදුවීමක් ඇය අප සමග පැවසුවා ය.

ඉන්ද්‍රාණි : එක දවසක් මිනිහෙක් ඇවිත් මගේ පියයුරු මිරිකුවා. අපි හිටියේ සැණකෙළි භූමියක. ඇත ඉදන් පිරිමි ළමයින් කට්ටියක් අපට විහිළු කරමින් සිටියා. අපි හිටියේ යාළුවෝ ගොඩාක් එක්ක. (මෙම සිදුවීම සිදුවන අවස්ථාවේදී) නමුත් ඒක කළේ කවුද කියලා මම හැරිලා බැලුවත් මට අඳුනා ගන්න බැරි වුණා. අපි හිටියේ ලොකු සෙනඟක් මැද්දේ.

[ සම්මුඛ සාකච්ඡාව මෙහෙයවන්නා : ඔයා හිතනවද ඒක වුනේ ඔයා වෙනස් විදියට පෙනුන නිසා කියලා?

ඉන්ද්‍රාණි : ඔව්! ඒ ගොල්ලන්ට අපිව පේන්න බැහැ. අපි කලිසම් අඳලා සපත්තු දානවා සහ අපි සිගරට් බොනවා. ]

H ගේ සිදුවීමේදී මෙන් ඉන්ද්‍රාණි ද ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වුනේ ඇයගේ ස්ත්‍රී – පුරුෂ සමාජභාවීය ප්‍රකාශනය 'ගැහැණු ' හෝ 'පිරිමි' නොවූ බැවිනි.

ඇයගේ ස්ත්‍රී – පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය තහවුරු කිරීමට නොකැමැති මෙන්ම ඇය සහ ඇයගේ යහළුවන් නිරීක්ෂණය

කරනවා යැයි යන පණිවිඩය දීමට කැමැති ආගන්තුකයෝ විසින් ඇය ලිංගිකව ස්පර්ශ කරන ලදී.

ලිංගික ප්‍රචණ්ඩත්වයට H ට මුහුණදීමට සිදුවූයේ ඇය තමාගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තහවුරු නොකිරීම හේතුවෙනි.

එසේම ක්‍රිස්ටි තමන් පිළිබඳව ඇගේ නැන්දාට හෙළිකරන ලද විට ඇයට මුහුණපෑමට සිදුවූ ලිංගික ප්‍රචණ්ඩත්වයක් සම්බන්ධයෙන් තොරතුරු අප සමග පැවසුවා ය. ''(මගේ නැන්දා) එයා මේ පිළිබඳව කුතුහලයකින් සිටියේ. මම එයාට ඒක කිව්වහම එයා ''ආ ! හොඳයි, මම ඔයාගේ පෙම්වතිය කියලා හිතන්න. ඔයා දැන් මොකද කරන්න යන්නේ?'' කියලා කිව්වා. මම එයාගෙන් ඇහුවා ''මොනවද ඔයා මේ කියන්නේ?'' කියලා. එවිට ඇය කිව්වා ''ඔයා සිප ගන්නවා ද? සිප ගන්නේ කොහොම ද?'' කියලා. ඒ සමගම එයා මාව සිපගන්න හැදුවා. මම ''අනේ එපා'' කියලා කීවත් එයා මගේ අත අරගෙන එයාගේ රහස් ප්‍රදේශයේ තියාගෙන ''ඔයා මට කරන්න යන දේ පෙන්වන්න'' කියලා කිව්වා.

### d. සමීපතම සහකරුවාගෙන් සිදුවන ප්‍රචණ්ඩත්වය (Intimate Partner Violence)

තමාට සමීපතම සහකරුවාගෙන් සිදුවන ප්‍රචණ්ඩත්වය, චිත්තවේගික, ශාරීරික සහ ලිංගික ලෙසට වර්ග කළ හැකි වේ. සමලිංගිකත්වය සහ සංක්‍රාන්ති ලිංගිකත්වය පිළිබඳ ශ්‍රී ලංකාව තුළ ඇත්තේ අපකීර්ති සහගත හැඟීමක් බැවින්, LBT සම්බන්ධතා තුළ සමීපතම සහකරුවාගෙන් සිදුවන හිංසනය පිළිබඳව සොයා ගැනීම ඉතා අපහසු ය. එක් අයකුගේ සහකරුවා අපයෝජනයේ යෙදුනද, ඒ සඳහා උදව් ඉල්ලීම කළ නොහැක්කකි. ද්වි ලිංගික පුද්ගලයකු විරුද්ධ ලිංගිකයකු සමග සිටින විට ඔහුගේ සමලිංගික අත්දැකීම් එයට විරුද්ධව යොදාගත හැක. සම්මුඛ සාකච්ඡාවට ලක්වූ සාමාජිකයින් 33 දෙනෙකුගෙන් 26 දෙනෙකුම කියා සිටියේ, ඔවුන් තම සමීපතම සහකරුවා/සහකාරියගෙන් ලිංගික ප්‍රචණ්ඩත්වයකට ලක්ව ඇති බවයි. එම 26 දෙනාගෙන් 11 දෙනෙකුම තම සහකරුගෙන් චිත්තවේගික, ශාරීරික හා/හෝ ලිංගික ප්‍රචණ්ඩත්ව අත්දැකීමකට මුහුණ දී ඇති බව කියා සිටියේ ය.

කිහිපදෙනෙකු, සමීපතම සහකරුවාගෙන් සිදුවන හිංසනය එක්වරක් අත්විඳීමත් සමගම ඔවුන් අතහැර ගොස් ඇත. 36

හැවිරිදි අචිනි, කොළඹට නුදුරින් ජීවත්වන සමලිංගික ස්ත්‍රියක් වශයෙන් තමාව හඳුනාගන්නෙකි. තම සමලිංගික සහකාරිය සමග තිබූ සමබන්ධතාවය බිඳවැටීමත් සමග ඇය මහත් ලෙස ශාරීරික ප්‍රචණ්ඩත්වයකට ලක් වූ බවත් පැය කිහිපයක් ඇයව කාමරයක සිරකොට තැබූ බවත් ඇය අප සමග කියා සිටියා ය.

"මම හිටියේ කාමරයක (ඇය) ඇතුළට පැමිණ දොරගුලු දැම්මා. මට එළියට යන්න බැරි වෙන්න. ඒ මම එයා සමග කතා නොකළ නිසා... එයා කාමරය වැසුවේ මට එළියට යන්න බැරිවෙන්න යි. එයා මාව ඇඳ උඩට තල්ලු කළා... එයා ඒ වෙලාවේ බුද්ධිමත් විදියට හැසිරුනේ නෑ. ඒ වගේම මට තේරුණ විදිහට ඇය හුගක් බීලා හිටියේ. ඒ නිසා මම පැහැදිලි කළා, අපි පහුවදා උදේ කතා කරමු කියලා්.. නමුත් එයා ඒක පිළිගත්තේ නැහැ." [44]

තවත් අයට, ප්‍රචණ්ඩත්වය යනු බොහෝ කල් සිට අත්විඳින්නක්. උදාහරණයක් ලෙස, සැන්ඩ්‍රා, ඇගේ තුන් අවුරුදු සම්බන්ධතාවය තුළ දී මුහුණ දුන් ශාරීරික සහ මානසික ප්‍රචණ්ඩත්වයන් පිළිබඳව අපට කියා සිටියා ය.

''ඇය ඉතාමත් ඊර්ෂ්‍යා සහගතයි. ඒ වගේම යටත් කරගෙන සිටියේ. ඒ කියන්නේ, මට කිසිවකු දෙස බැලීමටවත් ඉඩ දුන්නේ නෑ... කිසිවකු මා දෙස බැලුවොත්... මට කම්මුල් පාරක් ලැබෙනවා.... එය නිවසේ දී හෝ කාර්යාලයේ දී... කරදරයකින් ඉන්න අවස්ථාවක දී... හෝ සිදු වූවා. මා නිවසට පැමිණීමට විනාඩි 5 ක් හෝ ප්‍රමාද වුවත් එයා මට බැණ වැදුනා... වල්කමේ යනවා කියලා. එයා ගොඩක් ප්‍රචණ්ඩ වෙනවා... යම් යම් දේවල් වලින් මට දමා ගහනවා... මාව හූරනවා... හපනවා... එයා ඔලුවෙන් ගහලා මගේ නහයත් කැඩුවා... නමුත් මම එම සම්බන්ධතාවය වසර තුනහමාරක් පවත්වාගෙන ගියා.''[45]

තවත් අයට ප්‍රචණ්ඩත්වයට, හිංසාවට පත්වීමට සිදුව ඇත්තේ ඔවුන්ගේ සහකරුවන් දීර්ඝ කාලයක් පුරාවට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටින නිසා ය. කොළඹට නුදුරින් පදිංචිව සිටින 59 හැවිරිදි කමලා කියා සිටින්නේ, ඇයගේ ලිංගික නැඹුරුව වූයේ

44. අචිනි සමග කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 අප්‍රේල් 4.

45. සැන්ඩ්‍රා සමග කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2010 සැප්තැම්බර් 18.

විෂම ලිංගික බවේ සිට ස්ත්‍රී සමලිංගික බවට පත්වීම දක්වා බවයි. ඇයගේ දෙවන සම්බන්ධතාවය පිළිබඳව ඇය අපට පැවසූ අතර, එය ඉතාමත් හිරිහැරකාරී වූ බව කියා සිටියාය. ඇය නැවත මතක් කර සිටියේ "මම මෝඩයෙක් වගේ විශ්වාස කළා, බේබදුකම ආදරය මගින් යටපත්කොට සුව කළහැකි දෙයක් බව... නමුත්... මම කොතෙක් උත්සාහ කළත් බීමත්කම නැවැත්වීමට බැරි වුනා... ඉතිං... ඒ පුද්ගලයා ඉතාමත් ප්‍රචණ්ඩකාරී බේබදු පුද්ගලයෙක්... එයා මට අනතුරු කිරීමට හැදුවා. ඒ වගේම එයාටත් අනතුරු කරගන්න හැදුවා. වටා පිටාවේ අයටත් කරදර කළා.. ඒක ඉතාමත් විනාශකාරී සිදුවීමක් වුනා." [46]

ක්‍රිස්ටි තමන් ද්වි ලිංගික බව දන සිටි තරුණයෙකු සමග පැවැත් වූ ඇසුරක් පිළිබඳ අත්දැකීම අපට කියා සිටියා ය.

"දවසක් මම කාන්තාවන් පමණක් එන රාත්‍රී උත්සවයකට ගොස් ගෙදර ආවා. ඔහු මගෙන් ඇසූ පළමු ප්‍රශ්නය වුනේ "කාත් එක්කද නිදා ගත්තේ?" කියලා. එතකොට මම ඇහුවා මොකක් ගැනද ඔය කියන්නේ කියලා. එවිට එයා කිව්වා 'ඔයා හිටියේ ඔයාගේ යාළුවන් එක්ක. කිසිම පිරිමියෙකුට ඒ සමාජ ශාලාවට එන්න බැහැ කියලා ඔයා දන්නවා. ඉතිං, ඔයා කාත් එක්ක ද නිදාගත්තේ' මම කිව්වා කා සමගවත් එවැනි දෙයක් නොකළ බව. එවිට ඔහු මට කම්මුල් පාරක් ගැහුවා. එය අපේ සම්බන්ධකමේ අවසානය වුනා. ඒක මගේ මුහුණ පුරා වැදුණු තද පහරක්. ඊට පස්සේ එයා මගේ හුස්ම හිරකිරීමට පවා තැත් කළා." [47]

2005 වර්ෂයේ, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනතේ 23 වන වගන්තියට අනුව, එකට වාසය කරන සහකරුවන්ට එම පනත මගින් පිහිටක් ලැබිය හැකි නමුත්, ඉහත සඳහන් කළ සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ කිසිදු පුද්ගලයෙකු, ඔවුන්ට සමලිංගික සම්බන්ධතාවයක් ඇති බැවින් ද දණ්ඩ නීති සංග්‍රහයේ 365 A වගන්තියට අනුකූලව, වැඩිහිටි කැමැත්ත ඇතිව සිදුකරන සමලිංගික ක්‍රියා අපරාධයක් ලෙස අර්ථකතනය කළහැකි බැවින් ද, තමන් මුහුණ දුන් කිසිඳු සිදුවීමක් පොලීසියට වාර්තාකොට නැත. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත, 365 A වගන්තියට

46. කමලා සමග කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 මැයි 31.
47. ක්‍රිස්ටි සමග කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 පෙබරවාරි 16.

එරෙහිව පරීක්ෂාකර නැත. 365 A වගන්තියෙන් විෂම ලිංගිකයින් ආවරණය වුවද ඓතිහාසික වශයෙන් 365 A මගින් ඉලක්ක කරන ලද්දේ පුරුෂයින් සමග ලිංගිකව හැසිරෙන පුරුෂයින් ය. එනම් පුරුෂ සමලිංගිකත්වයට එරෙහිවය. මෙම නීතියේ අඩංගු භාෂාව ස්ත්‍රී සමලිංගිකත්වය ද අපරාධයක් බවට පත්කිරීම සඳහා වෙනස් කරනු ලැබුවාට පසු, සමලිංගික සම්බන්ධතාවයන් පවත්වන එහෙත් ප්‍රචණ්ඩත්වය අත්විඳින ස්ත්‍රීන්ට, කිසියම් ආකාරයකට නීතිමය වශයෙන් රැකවරණයක් සොයා වෙනත් ආකාරයකින් පැමිණිලි කිරීමට හෝ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව පනත යටතේ ආරක්ෂණ නියෝගයක් ගැනීමේ වාතාවරණය මෙම සංශෝධනය කරනලද නීති නිසා තවත් දුරටත් යටපත් විය.

## e. රැකියා ස්ථානයේ සිදුවන වෙනස්කොට සැලකීම (Discrimination at the Workplace)

මෙම පර්යේෂණයේ අවශ්‍යතාවය සඳහා වෙනස්කොට සැලකීමේ ක්‍රියාව ප්‍රචණ්ඩත්වයකින් අවසන් වන්නේ නම් වෙනස්කොට සැලකීම ප්‍රචණ්ඩත්වයක් ලෙස සලකා ඇති පහත සඳහන් අවස්ථා උදාහරණ ලෙසට ගත හැකිය.

- එම වෙනස්කොට සැලකීමේ ක්‍රියාව හේතුවෙන් සිදුවන ශාරීරික හෝ මානසික හානිය හෝ ශාරීරික ප්‍රචණ්ඩත්ව සිදුවන අවස්ථා ගණන වැඩිවීම.
- එම වෙනස්කොට සැලකීම හේතුවෙන් කිසියම් ප්‍රචණ්ඩත්වයක් සිදුවීම හෝ එවැන්නකට සිදුවීමකට මග පෑදීම.
- එම වෙනස්කොට සැලකීම කිසියම් ආකාරයක ප්‍රචණ්ඩත්වයකට හෝ/හා ප්‍රචණ්ඩකාරීන්ට අනුබල දීම.
- රජය හෝ පුද්ගලික අංශය මගින් සිදුකරන ප්‍රචණ්ඩත්වයන් සාධාරණීකරණය කිරීම සඳහා වෙනස්කොට සැලකීම.
- එම වෙනස්කොට සැලකීම මත ප්‍රචණ්ඩත්වයක් ඇති වූ විට රජයේ අක්‍රමිකතාවයක් සඳහා හේතු පාදකවීම.
- ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ LBT පුද්ගලයින් ආයතනගත කිරීමේ දී ඔවුන්ට ද්වේශ සහගත ආකාරයට සැලකීමේ ප්‍රතිඵලයක් ලෙසට වෙනස්කොට සැලකීම.

සම්මුඛ සාකච්ජාවට සහභාගි වූ තිදෙනෙකු විසින් වෙනස්කොට සැලකීම හේතුවෙන් තම රැකියා ස්ථානයේ දී ඔවුන් මුහුණදුන් චිත්තවේගික'' ශාරීරික සහ ලිංගික අපයෝජන අත්දැකීම් පිළිබඳව අප සමග ප්‍රකාශ කරන ලදී. ක්‍රිස්ටිගේ විධායක අධ්‍යක්ෂක විසින් ඇයට ලිංගික අපයෝජන සිදුකරන ලද අයුරු සහ වැඩකරන වේලාවේ හෝ පිටදී ඇයගේ බලවත් අකමැත්ත නොතකා ඇය ඔහුගේ කාමරයට ගෙන්වා ගත් ආකාරය පිළිබඳව ක්‍රිස්ටි අප සමග පැවසුවා ය. ඇයගේ අධ්‍යක්ෂකවරයෙකු ඇය සම්බන්ධයෙන් විධායක අධ්‍යක්ෂකවරයාට 'හෙළිකරන ලද' පසු ඔහුගේ ආශ්වාදය පිණිස, ක්‍රිස්ටි කාන්තාවක් සමග ලිංගිකව හැසිරෙන අයුරින් හැසිරෙන ලෙසට විධායක අධ්‍යක්ෂවරයා විසින් ඇයට ආරාධනාකොට තිබේ.

ක්‍රිස්ටි ට අනුව,

"ඔහු මා වෙනත් ගැහැණු ළමයෙකුට හඳුන්වා දුන් පසුව මා ඇයත් සමග ලිංගිකව හැසිරෙන ආකාරය ඔහුට බලාසිටිය හැකිද යන්න දැනගැනීමට ඔහුට අවශ්‍ය වුනා. ඒක හරිම නින්දිත ක්‍රියාවක්. ඒ හේතුව නිසා මට මගේ රැකියාව එපා වුණා. මම පිරිමින්ට වඩා වැඩි වැඩියෙන් කාන්තාවන්ට ආදරය කරන බව දැනගත් පසු ඔහු හැමවෙලේම මෙවැනි යෝජනා මා වෙත ගෙන එන්නට පටන් ගත්තා. ඔහු දකින හැමවිටකම වගේ මට දුවන්නයි ඕනෙ වුණේ. මොකද ඔහු මගේ දිහා බලාගෙන හිටිය වුනත් ඒකේ හරිම අමුත්තක් තිබුණා. සමහර වෙලාවට එයාට මගේ ජංගම දුරකතන අංකය තිබුණ නිසා මට කෙටි පණිවිඩ එව්වා. "ඔයාගේ මිතුරියට කොහොමද? හෝ 'එයාගේ පිංතූරයක් මට එවනවාද? සහ ඔයාගේ ලිංගික අවයව මොන වගේද?" වැනි දේවල් එම පණිවිඩවල තිබුණා. මේ නිසා, මා අපයෝජනයට ලක්වූ අතර මානසික වශයෙන් ද දුර්වල වෙලා මට ඇත්තටම වැඩකරන එක එපා වුනා. දන්නවානේ, 'ඔයා කළමනාකරු සමග නිදාගත්තේ නැත්නම් කිසිදෙයක් හම්බවෙන්නේ නෑ' කියලා කට කතාවක් මගේ කාර්යාලයේ තියෙනවා. වැටුප් වැඩිවීමක් නැහැ, උසස්වීමක් හෝ කිසිම දෙයක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මහජන සම්බන්ධතා නිලධාරියෙකු ලෙසට මට එම තත්ත්වයේම ඉන්න සිදුවුණා. මම බල්ලෙක් වගේ වැඩ කරනවා. ඒත් මම අනිත් අය එක්ක නිදා ගත්තේ නැති නිසා මගේ වැටුප් වැඩිවීමක් කරන්නේ නැහැ. ඒගොල්ලෝ හැමෝටම මගේ පෞද්ගලික ජීවිතය සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමට අවශ්‍ය වුනා. තත්ත්වය ගොඩාක් බරපතල වුනා. මට මගේ මිතුරිය

මගේ 'සහකරුවා' ලෙසට හඳුන්වා දීමට හෝ ඒ පිළිබඳව ඔවුන්ට කියන්නට බැරි වුනා. මොකද ඒ අයට දැනගැනීමට අවශ්‍ය වුනා ඒ අයට 'බලන්න' පුලුවනිද හෝ 'අපිත් එක්ක එකතු වෙන්න' පුළුවනිද කියලා. මේ වගේ දේවල් තමයි එයාලා අහන ප්‍රශ්න."

රැකියා ස්ථානයේ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ ක්‍රිස්ටිගේ අත්දැකීම බහුතරයක් කාන්තාවන් සඳහා පොදුය. කෙසේ නමුත් ඇය එම අවස්ථාවේදී කාන්තාවක සමග සම්බන්ධතාවයක් තිබෙන ද්වී ලිංගික කාන්තාවක වීම මෙම තත්ත්වය උග්‍රවීමට පැහැදිලි හේතුවක් විය. මේ නිසා ඇයට තව තවත් ලිංගික ප්‍රචණ්ඩත්වයට සහ අපයෝජනවලට ලක් නොවී සහනය ලබාගැනීමේ මාර්ග සොයා ගැනීමට අපහසු විය.

ඇය විෂම ලිංගික කාන්තාවක් නොවීම සහ පොදු සහ පෞද්ගලික ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ඇති නීති, ලිංගික අර්ථකතනය සහ ප්‍රකාශනය මත සිදුවන ප්‍රචණ්ඩත්වය සැලකිල්ලට නොගැනීම ද මෙයට හේතු විය.

ඉන්ද්‍රාණි : තම ලිංගික අනන්‍යතාව හඳුන්වන්නේ 'මධ්‍යස්ථ' ලෙසයි. සම්පූර්ණයෙන්ම පිරිමි හෝ ගැහැණු නොවන - ඇය 32 හැවිරිදි කොළඹට නුදුරින් ජීවත්වන සමලිංගික කාන්තාවකි. ඇයගේ පෙර රැකියා ස්ථානයේ දී සේවකයින්ට නිවාස ලබාදීමේ දී ඇයට වෙනස්කොට සැලකීමකට මුහුණදීමට සිදු වූ බව ඇය විසින් වාර්තා කරන ලදී. තවදුරටත් ඇය පවසා සිටියේ "වැඩ කරන වේලාවට ගැහැණු පිරිමි සියලුදෙනාම එකට වැඩ කළා. නමුත් නිදාගැනීම, ඇඟ සෝදා ගැනීම සහ කාමර වෙන්කර ගැනීමේ දී කළමනාකරුවන් විසින් අපිව අනෙකුත් ගැහැණු ළමුන්ගෙන් වෙන් කළා කියා ය. අපි අසාමාන්‍යයයි කියලා ඔවුන් අප සමග සිටීමට කැමති නැහැ, ඔවුන් අපට කැමැති නැති නිසා අපිට වෙනම ස්ථානයක් දුන්නා." [48]

ඔහුගේ ට්‍රාන්ස් තත්ත්වය : FTM/Femaile – to Male)[49] නිසා විශාල වශයෙන්ම තමන්ට සුදුසු රැකියාවක් සොයාගැනීමට අපහසු වූ බව ස්කිනර් පැවසුවා ය.

48. ඉන්ද්‍රාණි සමග කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 අප්‍රේල් 28.
49. වැඩි විස්තර සඳහා අන්තර් ජාලයේ බලන්න නිකලොස් ඇන්ඩ්‍රියා (2010).

"මගේ සියලු ලියකියවිලිවල මගේ නම වෙනස්; (ගැහැණු) සහ ලිංගය වෙනස්; (පිරිමි) ලෙසටයි සඳහන් වෙන්නේ. ඒ නිසා මම ඔවුන් ඉදිරියේ පෙනී සිටින විට (අනාගත සේවාදායකයා) ඔවුන් දකින්නේ වෙනම පුද්ගලයෙක්. ඒ නිසා සමහර සේවාදායකයින් විවිධ දුර්වල හේතු දෙමින් 'කණගාටුයි අපට ඔබ බඳවා ගන්න බැහැ' හෝ 'අපි ඔයාට දන්වන්නම්' යනුවෙන් කිව්වා. නමුත් සමහර දෙනෙක් හුඟක් නපුරු විදියට 'ඔයාට මේ විදියට කවදාවත් රැකියාවක් හොයා ගන්න බැරි වෙයි.' හෝ 'ඇයි ඔයා පුරුෂයෙක් විදියට ඇඳගෙන ඉන්නේ?' හෝ 'ඇයි ඔයාට සාමාන්‍ය කෙනෙක් වෙන්න බැරි?' කියලා ඇහුවා." [50]

චමිලා නමැති රාජ්‍ය සේවයේ නියුතු නිලධාරිනිය තම අධීක්ෂණ නිලධාරීන් නිසා අවස්ථා දෙකක දී වෙන් වෙන්ව මුහුණ දුන් වෙනස්කොට සැලකීම් සහ ලිංගික හිරිහැරයන් පිළිබඳව අප සමග පවසා සිටියා ය.

පළමු අවස්ථාවේ දී තම අධීක්ෂණ නිලධාරියා (වයස 59 ක් පමණ වූ) චමිලාට ඔහුගේ බිරිඳ සමග ලිංගිකව හැසිරෙන ලෙස කියා සිටියේ ය. ඔහු කියූ පරිදි, ඔහුගේ බිරිඳ සමලිංගික කාන්තාවකි.

"ඔහු මට කතා කරලා කිව්වා ඔහුගේ බිරිඳ සමග සමලිංගිකව හැසිරෙන ලෙස. මා කිව්වා 'මම ඕනෑම වයසක කාන්තාවක් සමග යන කෙනෙක් නෙවෙයි' කියලා සහ ඔවුන්ගේ ආශාවන් සංසිඳවන්න මම ලැහැස්ති නැහැ සහ කැමැති නැහැ කියලා." [51]

ඔහු මට ස්ථාන මාරුවක් ලබාදෙන බවට පොරොන්දු වුනා.'' එම කාලයේ චමිලා කොළඹින් බැහැරව රැකියා කළ අතර, ඇය කොළඹට ස්ථාන මාරුවක් බලාපොරොත්තුවෙන් සිටියා ය. ඇයගේ ප්‍රධානියා විසින් එම අවස්ථාව ලිංගික ඉල්ලීමක් ලබාගැනීම දක්වා හේතු පාදක කරගෙන ඇතිවා මෙන්ම ඔහුගේ බිරිඳ ද ඒ සඳහා යොදාගෙන, එම ලිංගික හිරිහැරයට කරුණු දක්වා සිටින ලදී. මෙහි දී, තම ප්‍රධානියාට ලිංගික ආශාවන් ඉටුකරදීමට අවනත නොවීම හේතුවෙන් මෙම ලිංගික අතවරය, රැකියාවක ස්ථාන මාරුවක් ලබානොදීම හා උසස්වීම් ආදිය ලබානොදීම යන වෙනස්කොට සැලකීමේ ස්වරූපයක් ගත්තේ ය.

50. ස්කිනර් සමග කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 ඔක්තෝබර් 07.

51. චමිලා සමග කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 අගෝස්තු 08.

එමෙන්ම, චමිලා කියා සිටියා ඇයගේ තවත් ප්‍රධානියකු ඇයට වාචිකව අපයෝජනයක් කළ බවත් එය සිදුවූයේ යම් පුද්ගලයෙකුට (ඔහුගේ) 'අවධානය' ගැනීමට අවශ්‍ය වූ නිසා බවත්. ''මම දැනගත්තා... කවුදෝ මං ගැන කතාවක් ගොතලා ඔහුට කියා තිබුණා. ඉතිං, ඔහු මාව කැඳවලා, හතර පස් දෙනෙක් ඉදිරිපිට දී තදින් බැණ වැදුනා. ඔහු කුණුහරුප සහ 'ආප්ප' වැනි වචන කිව්වා.'' [52]

රැකියා ස්ථානයක සිදුවන ලිංගික අතවර පිළිබඳ විධිමත් නීති මාලාවක් රාජ්‍ය ආයතන මගින් පිළිගෙන නැත. එමෙන්ම පුද්ගලික ආයතන තුළ ද එවැනි විධිමත් නීති මාලාවක් සකස් වී නැතිමුත්, එය සමාගම් විසින් සංවිධානයකර යොදාගන්නා ප්‍රගතිශීලී යාන්ත්‍රණයක් ලෙසට දැක්විය හැකිය. කෙසේ වෙතත් කිසිදු අයෙකුට, ලිංගික නැඹුරුව, ස්ත්‍රී-පුරුෂ අනන්‍යතාවය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය නිසා වන හිංසනයන් වැළැක්වීමට පැහැදිලි විධිවිධාන නැත.

52. චමිලා සමග කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 අගෝස්තු 08.

# #07 රාජ්‍ය නිලධාරීන් මගින් සිදුවන ප්‍රචණ්ඩත්වය සහ වෙනස්කොට සැලකීම

සම්මුඛ සාකච්ඡාවලින් හෙළි වූ පරිදි 33 දෙනෙකුගෙන් 13 දෙනෙකු ම, රාජ්‍ය නිලධාරීන්ගෙන්, විශේෂයෙන් ම ආරක්ෂක අංශයේ සහ පොලිස් නිලධාරීන්ගේ ප්‍රචණ්ඩත්වයට ලක්ව ඇත. රාජ්‍ය නිලධාරීන් අතින් සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා නිසා, LBT පුද්ගලයින් විවිධ ආකාරයට අනාරක්ෂිතවී ඇත. උදාහරණ වශයෙන්, එවැනි අවස්ථාවක දී ප්‍රචණ්ඩත්ව සිද්ධියක් පිළිබඳ පැමිණිලි කිරීමට යාම එතරම් නුවණට හුරු ක්‍රියාවක් ලෙස නොසලකයි. මන්ද, ඔවුන්ට සමලිංගික බව හෝ ස්ත්‍රී-පුරුෂ අනන්‍යතාවය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අර්ථකතනය සහ ප්‍රකාශනය අපරාධයක් සේ දක්වමින් දඬුවම් ලැබීමට හෝ වරදකරුවකු වීමට ඇති අවස්ථාව නිසා ය.

ඉන්ද්‍රාණි (ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අර්ථකතනයට සහ ප්‍රකාශනයට අනුව පිරිමි හැසිරීම් සහිත සමලිංගික කාන්තාවකි) කියා සිටියේ, මුහුදු වෙරළ අසල ආපන ශාලාවකින් රාත්‍රී ආහාර ගෙන ආපසු එන අවස්ථාවේ දී, ඇයට සහ ඇයගේ (ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අර්ථකතනය සහ ප්‍රකාශනය මත කාන්තාවක වන) ගැහැණු යාළුවාට, පොලීසිය නිසා මුහුණ පෑමට සිදු වූ අත්දැකීමකි. වෙරළ ආශ්‍රිත ප්‍රදේශය විෂම ලිංගික ජෝඩු මුණගැසීමට යොදාගන්නා හුරුපුරුදු ස්ථානයක් බැවින් නිතරම පොලීසියේ වැටලීම්වලට ප්‍රසිද්ධය.[52]

52. ශ්‍රී ලංකාව තුළ බොහෝ තරුණ තරුණියන් තම පවුල් සමඟ ජීවත්වන අතර, විවාහයට පෙර ලිංගිකව හැසිරීම සමාජයෙන් පිළිකුල් කරන කරුණකි. (විෂම ලිංගිකයන්) තරුණ තරුණියෝ පුද්ගලිකව හමුවීමට ස්ථානයක් සොයාගත නොහැකි අවස්ථාවල, මුහුදු වෙරළේ දී හමුවෙති. උපුටා ගැනීමේ දී ''පඳුරු ළඟ'' යන යෙදුම විෂම ලිංගික ජෝඩු මෙම ප්‍රදේශයේ පඳුරු අසල හෙවන ලබමින් සිටීම අදහස් කිරීමට යොදා ගන්නා ලද්දකි.

ඉන්ද්‍රාණි කියූ පරිදි,

"අපි රාත්‍රී ආහාරය රැගෙන. රෑ 8.00 පමණ වෙනතුරු කතා කරමින් සිට ආපන ශාලාවෙන් එළියට ආවා. අපි එළියට එනකොට, පොලිස් නිලධාරීන් පිරිසක්, මුහුද අසල සිටි සියල්ලන්ම පරීක්ෂාවට ලක්කරමින් සිටියා. ඔවුන් විශේෂයෙන් පරීක්ෂා කරමින් සිටියේ පඳුරු අසල ගැවසුනු (විෂම ලිංගික) ජෝඩුයි. අපි මුහුදු වෙරළේ සිට පාර පැත්තට ගමන් කරමින් සිටියා. අපි ආපන ශාලාවෙන් එළියට එනවාත් සමගම පොලිස් නිලධාරීන් දෙදෙනෙක් අපිව නවත්තලා කොහෙද යන්නේ කියලා ඇහුවා. අපි කිව්වා අපි ආපන ශාලාවෙන් රාත්‍රී ආහාරය ගෙන, දැන් ගෙදර යනවා කියලා. අපි (ආපන ශාලාවේ) බිල පවා පෙන්නුවා. ඔවුන්, අපි මුහුදු වෙරළේ රස්තියාදු ගහමින් හිටිය බව කියමින් ප්‍රශ්න කිරීමට අපිව පොලීසියට අරගෙන ගියා." [53]

1842 දී සම්මත කරන ලද අයාලේ යන්නන්ගේ ආඥා පනතට අනුව කිසියම් පුද්ගලයකු ''පොදු ස්ථානවල අනවශ්‍ය ලෙස ගැවසීම'', ඉන්ද්‍රාණිගේ සිදුවීමට සමාන ලෙසට පොලීසිය මගින් ප්‍රශ්න කළ හැක. මෙම නීතිය, විශේෂයෙන් ම භාවිතාවන්නේ පොලීසියෙන් අපයෝජනයට ලක්වීමේ වැඩි සම්භාවිතාවක් ඇති අඩු ආර්ථික හා සමාජ තත්ත්වයක් ඇති බුච් සමලිංගික ස්ත්‍රීන් සහ ට්‍රාන්ස් පුද්ගලයින් ඉලක්ක කරගෙන ය. එවැනි පොලිස් වැටලීම්වල අවසාන ප්‍රතිඵලය අත්අඩංගුවට ගැනීමකින් (අත්අඩංගුවට ගත් පසු ශාරීරික සහ ලිංගික අපයෝජනයට ලක්වේ) හෝ අල්ලස් දී නිදහස්වීමකින් කෙළවර වේ.[54]

ට්‍රාන්ස් පුද්ගලයින් සහ බුච් සමලිංගික කාන්තාවන් වාර්තාකොට ඇති අන්දමට, ආරක්ෂක මුරපොළවල්වල දී ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතේ ඇති නම සහ රූපය සමග එම නිලධාරීන් බලාපොරොත්තු වන පිරිමි හෝ කාන්තා රූපය සමග නොගැලපෙන අවස්ථාවල දී, ඔවුන් අසන නින්දිත ප්‍රශ්න හේතුවෙන් ඔවුන්ට ආරක්ෂක අංශවල නිලධාරීන්ගෙන් හිරිහැර සිදු වී ඇත.

53. ඉන්ද්‍රාණි සමග කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 අප්‍රේල් 28

54. ශ්‍රී ලංකාවේ ලිංගික සේවයේ යෙදෙන සංක්‍රාන්ති ලිංගික සේවකයින්ට එරෙහිව සිදුවන පොලිස් වැටලීම් පිළිබඳව වැඩි විස්තර දැන ගැනීම සඳහා අන්තර්ජාලයේ බලන්න http://fcx.sagepub.com/content/5/2/195: Nichols, Andrea (2010) Dance Ponnaya, Dance! Police Abuses Against Transgender Sex Workers in Sri Lanka, *Feminist Criminology* 2010 5: 195, Available online at: s

කොළඹ ආරක්ෂක මුරපොලවල් අසල දී නිතරම තමාව පුරුෂයකු ලෙසට වැරදි ලෙස වටහාගන්නා බව සැන්ඩ්‍රා පවසා සිටියා ය.

''හුඟක් නිලධාරීන් මගේ ජාතික හැඳුනුම්පත පරීක්ෂා කරලා අහනවා ඇයි මට ගැහැණු නමක් තියෙන්නේ කියලා. එවිට මම ඔවුන්ට කියනවා, 'ඔව් මහත්තයා, ඒ මම ගැහැණු ළමයෙක් නිසා' කියලා. සමහරුන් අහලා තියනවා, 'ඔයා මහත්මියක් ද?, මහත්මයෙක් ද? 'කියලා. එතකොට මම කියනවා, මගේ හැඳුනුම්පතේ කියලා තියෙනවා මම ගැහැණු ද පිරිමි ද කියලා. ඒ නිසා ඒක ඉස්සරවෙලාම බලන්න' කියලා. මෙවැනි ක්‍රියා නිසා මට හුඟක් කේන්ති යනවා. ඒ නිසා මම ඔවුන්ට මේ පිළිබඳව මුල ඉඳලා හොඳටම කියලා දෙනවා.[55]

එසේම, විශ්‍රාම වැටුප් සහ තම සමලිංගික සහකරු සමග හවුල් අදායම් මාර්ග යටතේ බැංකු ණය ලබාගැනීම වැනි රාජ්‍ය සේවාවන් ලබා ගැනීමට නොහැකි වූ අවස්ථා ද තිබෙන බව සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ ඇතැම්හු ප්‍රකාශ කළහ. ඔවුන් මෙම ප්‍රතික්ෂේප කිරීම හඳුන්වන්නේ රජය මගින් සිදුවන ආයතනගත වෙනස්කොට සැලකීමක අවස්ථාවක් ලෙසට ය.

සම්මුඛ සකච්ඡාවලට භාජනය වූ හත්දෙනෙකු කියා සිටියේ තමන් මානසික සෞඛ්‍ය සහ වෛද්‍ය වෘත්තිකයන් ඇතුලු රාජ්‍ය අංශයේ සේවා සපයන්නන්ගෙන් ප්‍රචණ්ඩ ක්‍රියාවලට ලක් වූ බව ය. සමහර ප්‍රචණ්ඩ ක්‍රියාවල ස්වරූපය වූයේ, බොහෝවිට ඔවුන් ''සුවපත් කිරීමට'' කියා තම මව හෝ පියා සමග පූජනීය ස්ථාන, ආරෝග්‍ය ශාලා, වෛද්‍ය සේවා සහ මානසික සෞඛ්‍ය සේවා වැනි ස්ථානවලට බලහත්කාරයෙන් රැගෙන යාමයි.[56] සම්මුඛ සාකච්ජාවට සහභාගි වූ එක් අයෙකු කියා සිටියේ, තමන්ගේ සහකාරියගේ දෙමාපියන් සහ පවුලේ සාමාජිකයින් ඇය සුව කිරීමේ අරමුණෙන් විද්‍යුත් ස්පන්දන ප්‍රතිකාර ක්‍රම සඳහා පවා යොමු කළ බවයි.[57]

55. සැන්ඩ්‍රා සමග කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 සැප්තැම්බර් 18.

56. සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ පුද්ගලයන්ව සුව කිරීමට සහ බලෙන් පූජනීය සහ සෞඛ්‍ය ආයතන සඳහා යොමු කළ අයුරු පිළිබඳ විස්තර දැනගැනීම සඳහා පිටු අංක 10 සහ 11 හි සඳහන් චමිලා සහ ස්කිනර් සමග පැවැති සම්මුඛ සාකච්ඡාව බලන්න.

57. රොෂ්මි සමග සිදු කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2012 ජනවාරි 06.

# [ #08 සහන ලබාගැනීමේ මාර්ග ]

"මට පොලීසියට යන්න බැරි බව මම දැනගත්තා.
මම මොකක්ද දැන් කියන්නේ? - 'ඒ අය පහර දුන්නේ මම
ගැහැණු ළමයි එක්ක නටපු නිසා'යි කිව්වොත්,
මට තවත් ප්‍රශ්නවලට මුහුණදෙන්න වෙනවා. මම තනි වුනා....
ඒ නිසා මම ත්‍රී රෝද රථයක නැගලා ගෙදරට ගියා." [58]

සැන්ඩ්‍රා, 34 හැවිරිදි බුච් (Butch)

සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ බොහෝ දෙනෙක් මුහුණ දුන් ප්‍රධාන ගැටළුව වූයේ සහනයක් ලබාගැනීමට මාර්ගයක් නොමැතිවීම ය. ඉහත සඳහන් පරිදි, තම පවුලේ සාමාජිකයන් අතින් සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා විස්තර කිරීමේ දී, විශේෂයෙන්ම එම ප්‍රචණ්ඩ ක්‍රියාව තම පවුලේ පුද්ගලික පරිසරය තුළ සිදු වී ඇති නම් බොහෝ දෙනෙකු තම පවුලේ සාමාජිකයා අපරාධකරුවෙකු ලෙස හැඳින්වීමට මැලි වූ අතර, එය පොලීසියට හෝ වෙනත් සංවිධානයකට ද වාර්තා කිරීමට අකමැතිය. ඒ අතරම සමහර සම්මුඛ සාකච්ඡාවලට බඳුන් වූ සාමාජිකයන් කියා සිටියේ ප්‍රචණ්ඩ ක්‍රියා පොලීසියට වාර්තා කිරීමට මැලිවන තවත් කරුණක් වන්නේ තම පවුලේ සාමාජිකයන්ව නීතිය ඉදිරියට ගෙන ඒමේ අකමැත්ත බව ය. එසේම ඔවුන් එමගින් තම පවුලට ලැබෙන අනවශ්‍ය ප්‍රසිද්ධිය, පවුලේ අය සමාජය ඉදිරියේ ලජ්ජාවට හා අපහසුතාවයට ලක් කිරීමට ද අකමැතිය.

එසේම, ඔවුන් විවිධ පොදු ස්ථානවල එනම්, මහා මාර්ගයේ පොදු ජනයා ගැවසෙන ස්ථානවල, පොදු ප්‍රවාහන සේවා තුළ, රැකියා ස්ථානවල, ප්‍රචණ්ඩත්වයේ ගොදුරක් බවට පත් වූ විට ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂභාවය පිළිනොගන්නා තත්ත්වය නිසා හෝ ලිංගික නැඹුරුව නිසා ඔවුන් සමාජය ඉදිරියේ LBT පුද්ගලයින් ලෙස අනාවරණය

58. සැන්ඩ්‍රා සමග කළ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2010 සැප්තැම්බර් 18.

වේ යැයි තිබෙන බිය හේතුවෙන් එය වාර්තා නොකිරීමට උත්සාහ නොගනී.[59]

එබැවින් බොහෝ පොදු හෝ පුද්ගලික ස්ථානවල සිදුවන ශාරීරික හිංසනය පිළිබඳ සිදුවීම් වාර්තාගත හෝ ලේඛනගත නොවන අතර ශාරීරික හිංසනය අත්විඳින ලද LBT පුද්ගලයන් වන්දියක් හෝ සහනයක් බලාපොරොත්තු නොවීම සහ ප්‍රචණ්ඩත්වයට ලක් වූ ස්ත්‍රීන් උදෙසා වැඩ කරන (ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව වැඩසටහන් සහ සහයෝගීතා කණ්ඩායම් වැනි) මානසික සෞඛ්‍ය උපදේශන සේවා ලබාදෙන පුද්ගලයින්ගෙන් පවා සහනයක් බලාපොරොත්තු නොවීම සම්මුඛ සාකච්ඡා වර්තාවලට අනුව පැහැදිලි ය.

ස්ත්‍රී ලිංගික සහ ට්‍රාන්ස් පුද්ගලයින්ගේ සාමාන්‍ය ධාරිතාවය සහ අපරාධ වාර්තා කිරීමේ ප්‍රවනතාවය පිළිබඳව දන්නා තොරතුරු සමග මෙම සොයා ගැනීම් එකිනෙකට සමීපව ගලපා බැලිය යුතු වන්නේ මෙම අපරාධය ඔවුන්ගේ ලිංගිකත්වයට හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවයට සම්බන්ධ නොවූව ද, ඔවුන් වෙත පැන නගින සුවිශේෂී වූ අවශ්‍යතා තිබෙන නිසා විශේෂයෙන් ම වැඩිහිටි කැමැත්ත ඇතිව සිදුවන සමලිංගික ක්‍රියාවක් අපරාධයක් ලෙසට අර්ථගැන්විය හැකි ලෙසට දක්වා ඇති දණ්ඩනීති සංග්‍රහයේ විධිවිධාන මගින් LBT පුද්ගලයින් අවදානමකට ලක්කරයි. අප සමග කතා කරන ලද බොහෝ දෙනෙකු දණ්ඩ නීති සංග්‍රහයේ 305 A වගන්තිය සහ අයාලේ යන්නන් පිළිබඳ ආඥා පනත උපුටා දක්වන ලද අතර, එය ඔවුන් අත්අඩංගුවට ගැනීමට සහ කරදර කිරීම සඳහා ඉලක්ක කරගන්නා බව පැවසීය. LBT ප්‍රජාව පොලීසිය දකින්නේ ඔවුන්ට එරෙහිව හිංසනය සිදුකරන සහ කප්පම් ගන්නා ආයතනයක් ලෙසට ය.

එයට අමතරව, ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ දී සාමාන්‍ය හෝ වංචාවකට හසු වූ තැනැත්තාට සහාය දැක්වීමක් සිදුනොවන අතර. නඩු වාර පොදු ජනතාවට ද විවෘත නිසා බොහෝ දෙනා තම ලිංගික නැඹුරුව හෝ ස්ත්‍රී-පුරුෂ අනන්‍යාතාවය සමාජයට නිරාවරණය වීම වැළැක්වීමට පොලීසියට එම සිදුවීම් වාර්තා

59. සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ සාමාජිකයින් විවිධ හේතු මත තමන් පිළිබඳව අනාවරණය කිරීමට බිය වූහ. සමහරු තම ලිංගික නැඹුරුව පිළිබඳ පවුලේ සාමාජිකයින් දැනගැනීම ගැනීම සම්බන්ධයෙන් බිය වූහ. එමෙන්ම සමහරුන් සිතුවේ තමන් පොලීසියේ තාඩන පීඩනවලට ගොදුරු වේ යැයි කියා සහ/හෝ දණ්ඩ නීති සංග්‍රහයේ 365 A වගන්තිය යටතේ අත්අඩංගුවට ගනු ඇති බවය.

කිරීමෙන් වැළකී සිටියි. එසේම මානව හිමිකම් කොමිසම, පොලිස් කොමිසම, රාජ්‍ය සේවා කොමිසම සහ අධිකරණ සේවා කොමිසම වැනි ආයතන පිළිබඳව වැඩි විශ්වාසයක් තැබිය නොහැක්කේ එම ආයතන ස්වාධීනව කටයුතු නොකරන නිසාත්, ඒවා ජනාධිපතිතුමා විසින් පත් කරන ලද කොමිෂන් සභා වීමත් හේතුවෙනි.

මෙම පසුබිමෙහි, සම්මුඛ සාකච්ඡාවල දත්තයන්ට අනුව හෙළිවූයේ LBT පුද්ගලයින්ට හිංසනයෙන් මිදීම සඳහා සහනයක් රජයේ නිලධාරීන්ගෙන් ලැබෙතැයි සිතීම සැක සහගත බවයි.

# [#09 ප්‍රතිචාර දැක්වීම, මුහුණදීම (Reacting, Coping and Fighting Back)]

LBT පුද්ගලයින් ප්‍රචණ්ඩත්වයට දැක් වූ ප්‍රතිචාර මෙම පර්යේෂණයෙන් පරීක්‍ෂා කරගන්නා ලදී. සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ සමහර LBT පුද්ගලයින්ට අනුව ප්‍රචණ්ඩත්ව සිදුවන ස්ථානවලින් ඈත්වී සිටීම හෝ වෙනස්කොට සලකන අවස්ථා අත්හැරීම/නොසලකා සිටීම වඩා උචිත ය. එසේම තවත් සමහරුන්, සිදු වූ සිද්ධියට මුහුණ දීම මගින් ප්‍රතිචාර දැක්වී ය. මෙම පර්යේෂණයේ අවශ්‍යතාවය සඳහා LBT පුද්ගලයන් ලබාදුන් පිළිතුරු කොටස් 3 ට බෙදා ඇතඃ 1) බලපෑම් සහිත ප්‍රතිචාර/තමා තුළින්ම වෙනස් ආකාරයෙන් ප්‍රතිචාර මතුවීම 2) ඉවසා සිටීමෙන් ප්‍රතිචාර දැක්වීම සහ 3) ක්‍රියාකාරී/සක්‍රීය ප්‍රතිචාර.

## a. බලපෑම් සහිත ප්‍රතිචාර/තමා තුළින්ම වෙනස් ආකාරයෙන් ප්‍රතිචාර මතුවීම (Affctive Responce)

සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ සියළුදෙනාම, ඔවුන් මුහුණ දී ඇති ප්‍රචණ්ඩත්වය සහ වෙනස්කොට සැලකීමේ අත්දැකීම් හේතුවෙන් ප්‍රබල සහ කල්පවතින චිත්තවේගී බලපෑම්වලින් පීඩාවිඳින ලදහ. දෙදෙනෙකු හැර අන් සියලුදෙනාම පවසා සිටියේ, එම ප්‍රචණ්ඩත්ව ක්‍රියා තම මානසික සෞඛ්‍යයට ඍණාත්මකව බලපා ඇති බවයි. ඔවුහු මානසික අවපීඩනය, කාන්සාව, කේන්ති යන මානසික තත්ත්ව, ඉච්ඡාභංගත්වය සහ බිය යන තත්ත්ව වලින් පීඩා විඳින බව කියා සිටියහ. ඔවුන්ට නිතරම ''ගොඩාක් පහළ'' (මායා), ''මානසිකත්වය බිඳවැටුණු'' (රොෂ්මි) සහ ''ඇඬීමට අවශ්‍ය, බිත්තිවලට පහරදීමට අවශ්‍ය, තරහ එන'' (චාන්දනී) හැඟීම් ඇතිවිය. ක්‍රිස්ටි කියා සිටියේ ඇයට නිතරම ''මානසික අවපීඩන තත්ත්ව'' ඇති වූ බවත්, එවිට වෛද්‍යවරයා නියමකරන ''ඕනෑම පෙත්තක්'' ගෙන ''සත්‍ය තත්ත්වයෙන් මිදී ටික වේලාවක් හෝ ගත කිරීමට තමා කැමති බවත්'' ය. මායා ද අප සමග කියා සිටියේ ඇය පිළිබඳව ඇගේ දෙමව්පියන්ට අකමැත්තෙන් පැවසීමට සිදු

වූ විට එහි "ආතතික ප්‍රතික්‍රියාවක" ලෙසින් ඇයගේ "චිත්තවේගී පීඩාව"ශරීරයෙහි පැතිරුණු කුෂ්ටයක ස්වරූපය ගත් බවයි.[60]

සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ විසිදෙනෙකු, සමාජයෙන්, යහළුවන්ගෙන් සහ පවුලේ සාමාජිකයින්ගෙන් තමා ප්‍රතික්ෂේප වේ යැයි සිතූ නිසා තම ලිංගික නැඹුරුව වසන්කර සිටීමට කැමැත්ත දැක්වූ පිරිසක් විය. තවත් 18 දෙනෙකුට හැඟුනේ තම දෛවය ඉවසීමෙන් දරා සිටීම මගින් ප්‍රචණ්ඩත්වය අවම කරගැනීමට උත්සාහ කිරීම, ප්‍රචණ්ඩ ක්‍රියා සාමාන්‍යකරණය කිරීම හෝ සමාග්‍රහණය (internalisation) කිරීමට හැකි වූ බවයි. සම්මුඛ සාකච්ඡාවට යොමු වූ තුනෙන් දෙකක් ම, තමන් මුහුණ දුන් ප්‍රචණ්ඩ ක්‍රියාවලට තමන්ටම දොස් පවරා ගත්හ. ඔවුන් තුළ තමාගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සහ ලිංගික නැඹුරුව පිළිබඳ තමන් සමගම වෛරයක් ඇති වී තිබුණු අතර, කපා ගැනීම්, ගිනි තබා ගැනීම් වැනි ක්‍රියා මගින් තම ශරීරයට හානි සිදුකරගත් බවත් කියා සිටින්නට විය. "සාමාන්‍යයෙන් මම කාටවත් ගහන්න, බණින්න කැමති කෙනෙක් නෙමෙයි. නමුත් මගේ දුක අඩු කරගන්න මම එහෙම කරනවා. මම මාවම කපාගෙන විඳවනවා. එයින් මට සහනයක් ලැබී, මගේ දුක අඩු කරගන්න උත්සාහ දරනවා" යැයි ජෙනී පවසා සිටියා ය.[61] පෙනුමෙන් වයස අවුරුදු 28 ක් වන අතර, උතුරු මැද පළාතේ හැදී වැඩුණු ඇය දැනට කොළඹ නගරයට නුදුරින් ජීවත් වෙයි. ඇය තමන් බුච් (butch) පුද්ගලයෙකු ලෙසට හඳුනාගෙන ඇත.

සම්මුඛ සාකච්ඡාවට යොමු වූ පුද්ගලයින් එකොලොස් දෙනෙකු පවසා සිටියේ තමන්ගේ ජීවිතයට මුහුණදීමේ ක්‍රියාවලියක් ලෙසට තමන් ජීවිතයේ කුමන හෝ අවස්ථාවක දී සියදිවි නසා ගැනීමට තැත්කර හෝ සියදිවි නසා ගැනීමේ අදහස පහළ වී ඇති බවත් ය.[62]

60. මායා සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 ජනවාරි 22. රොෂ්මි සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2012 ජනවාරි 6, සහ චාන්දනී සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2010 නොවැම්බර් 17.

61. ජෙනී සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011.

62. 2011 වසරේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ පර්යේෂණ වාර්තාවලට අනුව, කාන්තා සහ පිරිමි සියදිවි නසා ගැනීම්වලින් ශ්‍රී ලංකාව, ලෝකයේම දෙවන ස්ථානයේ පසුවන බව සොයාගෙන ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානය - බලන්න (2012 ඔක්. 11 1998 වසර වනතුරු සියදිවි නසාගැනීම බරපතල දඬුවම් ලැබෙන වැරැද්දක් වුවද, අද ශ්‍රී ලංකාවේ එය තවදුරටත් අපරාධයක් ලෙසට නොසැලකේ. ලෝක සෞඛ්‍ය සංවිධානය අන්තර්ජාලයට පිවිසි දිනය - 2012 ඔක්.11 දින http://www.who.int/mental_health/prevention/suicide_rates/en/ (Accessed 11 Oct 2012 (2004)
World Health Organizetion (2004)Suicide Prevention:Emerging from D World Health Organization (2004) *Suicide Prevention: Emerging from Darkness* [online] Available from: http://www.searo.who.int/en/Section1174/Section1199/Section1567/Section1824_8089.htm (Accessed 11 Oct 2012)

චමිලා කියා සිටියේ "මා එක්වරක් සියදිවි නසා ගැනීමට තැත් කළා. ඒ වේදනාව තවදුරටත් දරාගෙන ඉන්න බැරි නිසා. මම ජීවිතය ගැන හුඟක් කලකිරිලයි හිටියේ. මට ඒ තත්ත්වයෙන් ගොඩඑන්න හුඟක් කල් ගියා" යනුවෙනි.[63] තවත් පිළිතුරක්... වශයෙන් ස්කිනර් කියා සිටියේ තමන් බස් රථ බෝම්බයකට හසු වී මිය යනු ඇතැයි මනඃකල්පිතව සිතූ[64] බවයි.

එසේම නියැදියෙන් සුළු සංඛ්‍යාවක් (5 දෙනෙකු) වාර්තාකර සිටියේ අපචාරාත්මක ද්‍රව්‍ය යොදා ගැනීම (මත් ද්‍රව්‍ය, සිගරට් සහ මත් කුඩු) සහ රාත්‍රී සමාජ ශාලාවල ගැවසීම, මෙම තත්ත්වය පාලනය කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස යොදා ගන්නා බවයි. රොෂ්මි කියා සිටියේ ඇය ''තදබල මානසික අවපීඩනයකින්'' පෙලුණ කාලයේ ඇය තදින් දුම්පානය කළ බවත් දිනකට සිගරට් පැකට් 15-20 අතර, ප්‍රමාණයක් අවශ්‍ය වූ බවත්, ''හුස්ම ගන්නෙත් නැතිව එක දිගටම සිගරට් බිව්වා. ඊට පස්සේ අසනීප වුනා'' යනුවෙනි.[65]

රැකියා ස්ථානයේ දී වෙනස්කොට සැලකීම මානසික සෞඛ්‍ය කෙරෙහි තදින් බලපාන ලද තවත් කරුණක් විය. ස්කිනර් කියා සිටියේ ඔහුට, ඔහුගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාව හේතුකොට ගෙන රැකියාවක් නොලැබීම නිසා ඔහු බොහෝ විට තදබල මානසික අවපීඩනයකට ලක් වූ බවයි. ''මට ඕනෑ රැකියාවක් කරල මුදල් උපයාගන්න. මම කියන්නේ, මට පිනට ජීවත්වෙන්න අවශ්‍ය නැහැ. මට දක්ෂතා තියෙනවා... මම කැමතියි, රැකියාවක් කරලා ඒ සඳහා පඩියක් ගන්න - එච්චරයි.'' යනුවෙන් ඔහු පවසා සිටියේ ය.[66]

තම ලිංගික නැඹුරුව හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය පිළිබඳව තම යහළුවන්ට කියා සිටීම මඟින් තමන් ප්‍රතික්ෂේප කිරීමක් සිදුවන බව බොහෝ දෙනා සිතූහ. DKS කියා සිටියේ, තමන් ප්‍රතික්ෂේප වූ බව තමන්ට දැනුණේ ''හදිසියේම ඔවුන් මට වෙනස් ආකාරයට සලකන්න පටන් ගත්තා... වෙනස් පුද්ගලයෙකුට

63. චමිලා සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 අගෝස්තු 8.
64. ශ්‍රී ලංකා රජය හා එල්.ටී.ටී.ඊ. ය සමග පැවති ගැටුම් සමය පිළිබඳ සදහනකි. එය බස් රථවල බෝම්බ පුපුරුවා, සාමාන්‍ය ජනතාව මරණයට පත් කරන ලද කාලයකි. ස්කිනර් සමග පැවති සම්මුඛ සාකඡාව, කාන්තා ක්‍රියාකාරී කමිටුව, 2011 ඔක්තෝබර් 07.
65. රොෂ්මි සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2012 ජනවාරි 6.
66. ස්කිනර් සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කමිටුව කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, 2011 ඔක්තෝබර් 7.

සලකන විදිහට... නමුත් මම වෙනස් නැහැ... මම හිටපු පරණ පුද්ගලයාමයි.... නමුත් මට තේරෙන්නේ නෑ. ඒ අය මාත් එක්ක ආශ්‍රය කිරීම ප්‍රතික්ෂේප කළා...” යනුවෙන් පැවසුවේය.[67]

අනු, ද්විලිංගික කාන්තාවක් වන අතර, ඇයගේ යහළුවෙකුට සමලිංගිකයින් සම්බන්ධයෙන් භීතියක් තිබෙන බව දැනගත් පසු දැඩි සේ දුකට පත් වූ බව කියා සිටියා ය. ''මම හුඟාක් තරහින් සහ කළකිරීමෙන් සිටියා. මට තේරුම්ගන්න බැහැ, ඇයි අනික් අය මිනිස්සුන්ට මේ විදිහට සලකන්නේ කියලා. අපිත් සාමාන්‍ය විදිහට ජීවත්වෙන්න කැමතියි. ඒ ගොල්ලෝ ආදරය කරන අයට ආදරය කරන්න කැමතියි'' යනුවෙන් ඇය පවසා සිටියා ය.[68]

සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ තිස් එක්දෙනෙක් කියා සිටියේ, ඔවුන් බොහෝ අවස්ථාවල දී මානසික අවපීඩනයකින් සහ වරදකාරී හැඟීමකින් පෙළුනේ, ඔවුන්ට තම ස්ථිර නොවන ලිංගිකත්වය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය පිළිගැනීමට සහ අවබෝධ කරගැනීමට, සටන් කරගැනීමට සිදු වූ නිසා බවයි. කෙසේ වෙතත්, ඍණාත්මක සමාජීය සහ මානසික බලපෑම්වලට ලක්වීමට අමතරව, බහුතරයක් දෙනා පවසා සිටියේ තම යහළුවන්ගෙන්, සහකරුවන්ගෙන්, පවුලේ සාමාජිකයින්ගෙන්, LGBT [69] සංවිධානවලින්, ආගමික නායකයින්ගෙන් සහ රැකියා ස්ථානයේ සහායකයින්ගෙන් තමන්ට ලැබෙන ධනාත්මක හැඟීම් පිළිබඳව ය.

දර්ශි නමැති හතලිස් හය හැවිරිදි, කොළඹ ජීවත්වන ස්ත්‍රී ලේබල්වලට අකමැති අතර, තමන් ''කාන්තාවන් සමග නිදාගන්නා බව'' පමණක් පැවසීමට කැමති ය. ඇය පවසනු ලැබුවේ, ඇයගේ ලිංගික නැඹුරුව පිළිබඳව බොහෝ කාලයක් දරා සිටිය නොහැකි වූ බවයි. ''නමුත් මට හමුවුනා මේ පිළිබඳව බොහොම සාමාන්‍ය විදිහට හිතන පුද්ගලයින්. ටිකෙන් ටික මෙය මට සාමාන්‍ය දෙයක් බවට පත්වුනා. ඊට පස්සේ මම හුඟක් සතුටින් හා පහසුවෙන් ජීවත් වුනා'' යැයි ඇය පැවසුවා ය.[70]

67. DKS සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, 2010 සැප්තැම්බර් 18.
68. අනු සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, 2011 මැයි 13.
69. කාන්තා සමලිංගික, පුරුෂ සමලිංගික, ද්විලිංගික සහ ට්‍රාන්ස් පුද්ගලයින්
70. දර්ශී සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2010 ඔක්තෝබර් 30.

ඉන්ද්‍රාණිත් අප සමග එවැනි ම සිදුවීමක් පිළිබඳව තම අත්දැකීම් පවසා සිටියා ය. ''මාව තේරුම් ගන්න පුළුවන් අය මගේ ගෙදර නොසිටියත්, මට හමුවුණු යහළුවන් මාව තේරුම් ගත්තා. ඔවුන් සාද පැවැත්වූවා. හැමෝම මාත් එක්ක කතා කළා. කිසිකෙනෙක් මට හිනා වුනේ නෑ. කවුරුත් ඇහැව්වේ නැහැ ඇයි මම කරාබු දාන්නේ නැත්තේ කියලා. මම ඔවුන් සමග බොහොම පහසුවෙන් කාලය ගත කළා. සමාජය මොනවද හිතන්නේ කියලා මම කරදර වෙන්නේ නෑ. හුඟාක් පුද්ගලයින් ඉන්නවා මාව පිළිගන්න කැමති. ඒ නිසා මම ඉන්නේ සතුටින්'' යැයි ඇය පැවසුවා ය.[71]

සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ බොහෝ දෙනෙක් තමන්ට විවිධ ආකාරයට විවිධ මාධ්‍යයන්වලින් සහයෝගයක් ලැබෙන බව කියා සිටියත්, තමන් පිළිබඳ ආඩම්බර සහ ශක්තිමත් හැඟීම් ප්‍රකාශ කරන ලද්දේ එම පුද්ගලයන්ගෙන් තුනෙන් එකක් පමණක් බවත් අවධාරණය කළ යුතු කරුණකි.

## b. ඉවසා සිටීමෙන් දක්වන ප්‍රතිචාරය. (Passive responce)

අප කතා කළ බොහෝ දෙනා, ප්‍රචණ්ඩත්වයට, වෙනස් කොට සැලකීමට හෝ අපචාරයට ලක් වූ විට, ඊට එරෙහිව වාචිකව හෝ ශාරීරිකව සටන් නොකළ අය වූහ. සම්මුඛ පරීක්ෂණයට භාජනය වූ විසිපස් දෙනෙකු පවසා සිටියේ තමන් කුමන අන්දමේ හෝ ගැටුමක් මඟහැර යන බවත්, තමන් අප්‍රාණික තත්ත්වයකට පත්වුන බවක් හැඟෙන බවත්, එමනිසා එම ප්‍රචණ්ඩත්වය අතරතුර දී හෝ පසුව ඒ ගැන ක්‍රියා නොකරන බවයි. ඉන්ද්‍රාණි පවසා සිටියේ "එක දවසක් මම සේවය කරන ස්ථානයේ දී පිරිමි ළමුන් දෙදෙනෙකු සමඟ රණ්ඩුවකට පැටලුණා. ඊට පස්සේ මම දවල් කෑම කන වෙලාවෙ දි ඔවුන්, හැමෝටම ඇහෙන විදිහට කෑ ගහලා, 'ආහ්... අද ආප්ප තාච්චිය පිච්චිලා වගේ' කියලා කිව්වා. මම මට නෙමෙයි වගේ නෑසුණු විදිහට හිටියා"යනුවෙනි.[72]

සම්මුඛ සාකච්ජාවට සහභාගි වූ සමහරුන් ආත්ම සංයමයෙන් යුතුව විශේෂයෙන්ම තම පවුලේ සාමාජිකයින් සහ නෑදෑයින් සමග ගතකරන බව පැවසූහ. උදාහරණ වශයෙන් ස්කිනර්, "ඒ විදිහ හුඟාක් හොඳයි කියලා හිතෙනවා (හිනාවෙමින්). මා ඒ දේවල් ගැන

71. ඉන්ද්‍රාණි සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, 2011 අප්‍රේල් 28.

72. එම

බොහෝ වෙලාවට හිතන්නේ නැතිව, ඒවා හිරකරගෙන ඉන්න හදනවා පුළුවන් තරම්. වෙන මොනවා කරන්න ද?" යනුවෙන් පැවසී ය.[73]

විශේෂයෙන් ම සමලිංගික කාන්තාවන්, තම ලිංගික නැඹුරුව හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත තීරණය යන අනන්‍යතාවය නිසා ඔවුන් වෙතට එල්ල විය හැකි සමලිංගිකත්වයට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා හා/හෝ අපචාරවලින් වැළකී සිටීමට, ප්‍රසිද්ධ ස්ථානවල ගැවසීමෙන් වැළකී සිටින බව අපගේ සම්මුඛ සාකච්ඡාවලින් අනාවරණය වූ කරුණක් විය. සමලිංගික කාන්තාවන් සහ පිරිමින් ජීවත්වන බොහෝ ස්ථාන සුළුතර ලිංගික ප්‍රජාව ජීවත්වන වටපිටාවක් සැකසීමට සහ පැවැත්මට, අභියෝගයට ලක්කරන සමලිංගිකයන්ට එරෙහි බලවේග තිබෙන 'අභියෝගාත්මක ප්‍රදේශ' බව උගතුන් විසින් සොයාගෙන ඇත.[74]

25 හැවිරිදි අනිෂ්කා කොළඹ ජීවත්වන අතර, තමා ''ද්වීලිංගික හෝ සමලිංගික කාන්තාවක්. නමුත්, 80% ක්ම සමලිංගික කාන්තාවක්'' ලෙසට තමන් හඳුනාගෙන ඇත. ඇයගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය ස්ත්‍රී වේ. ඇය සහ ඇයගේ සහකාරිය හිතාමතාම පොදු ස්ථානවල ගැවසීමෙන් වැළකී සිටින ආකාරය ඇය අපට පැවසී ය. ''අපි හුඟක් පරිස්සම් වෙනවා, එහෙ මෙහෙ යනකොට.... අපි දන්නවා අපගේ ප්‍රදේශ මොනවාද කියා... පොඩි බීමහල්. එහෙම නැත්නම් අපි ගෙදර දී කෑම ගන්නවා. අපි අපේ යහළුවන්ගේ ගෙවල්වලට යනවා. නමුත් පොදු තැන්වලට යන්නේ නෑ'' යනුවෙන් පැවසුවා ය.[75]

බොහෝ අවස්ථාවල දී LBT පුද්ගලයින්ට ප්‍රචණ්ඩ ක්‍රියාවලින් ආරක්ෂාවීමට තමාගේ සමාජීය හා ආර්ථික පසුබිම ඉවහල් වී ඇත. පර්යේෂණයෙන් තහවුරු වූ පරිදි LBT පුද්ගලයින්ගේ ආර්ථික පසුබිම උසස් තත්ත්වයක ඇති විට ඔවුන්ට තම ''ආරක්ෂාව මිලට ගෙන'' අනාරක්ෂිත ප්‍රදේශවලට යාමෙන් වැළකී සිටීමට හැකියාව ඇත. මායා පවසන ආකාරයට, ඇය තමාට ''යාමට සුදුසු ස්ථාන පමණක් තෝරා බේරාගෙන'' ගමන් බිමන් යන්නී ය. ඇය තවදුරටත්

73. ඉන්ද්‍රාණි සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, 2011 අප්‍රේල් 28.
74. ඉන්ග්‍රම්, ගෝඩන් බ්‍රෙන්ට්, ඈන්-මරී බොතිලෙත්, යොලන්ඩා රෙටර් (එඩ්ස්) (1997) කුයිස් ඉන් ස්පේස්: කොමියුනිටීස්/පබ්ලික් ප්ලේසස්/සයිටිස් ඔෆ් රෙසිස්ටන්ස්, බේ ප්‍රෙස්, යූ.එස්.ඒ.
75. අනිෂ්කා සමඟ පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 ජනවාරි 22.

කියා සිටියේ ''මෙහි ප්‍රතිඵලයක් ලෙසට, මම සමහර ක්‍රියාවලින් වැළකී සිටිනවා. මම නගරයේ සමහර ප්‍රදේශවලට යන්නේ නෑ. මම පාරේ අවිදින්න යන්නේ නෑ. හැමතැනම යන්නේ මගේ මෝටර් රථයෙන්. පොදු ප්‍රවාහන සේවාවල යන්නේ නැහැ. කෝච්චිවලත් යන්නෙත් නෑ. ඒ විදිහට තමයි ජීවත්වෙන්නේ'' කියා ය.[76]

සමලිංගිකත්වයට එරෙහිව සිදුකරන නොයෙකුත් කතාවලින් තමන් ආරක්ෂා කරගැනීම සඳහා රැකියා ස්ථානයේ දී තම පුද්ගලිකත්වය ආරක්ෂා කරගැනීමට තමන් වගබලා ගන්නා බව සම්මුඛ සාකච්ඡාවලට සහභාගි වූ පිරිස් විසින් පවසා සිටින ලදී. සෝමා වයස අවුරුදු 40 ක් වන අතර, කොළඹ දී උපත ලබා ඇත. නමුත් දැනට විදේශගතව තම සහකාරිය සමඟ ජීවත් වෙයි. ඇය කියන පරිදි ඇයගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය ස්ත්‍රී වන අතර. ඇයගේ ලිංගික නැඹුරුව සමලිංගික වේ. ඇයගේ වර්තමාන රැකියා ස්ථානයේ දී, ඇය තම සහකරුගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය විවෘතව ප්‍රකාශ කිරීමෙන් හැකිතාක් වැළකී සිටී. ''මම රැකියාව කරන තැන, මම හුඟාක් දුරදිග බලලා, බොහෝ උත්සාහ කරලා (මගේ ලිංගික නැඹුරුව) වසන් කරගන්නවා. මට සහකරුවෙකු ඉන්න බව කියලා තියනවා. ඒත් එයාගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ගැන මම කියලා නෑ'' යැයි ඇය පැවසුවා ය.[77]

## C. සක්‍රීය/ක්‍රියාකාරී ප්‍රතිචාර

මෙම කාණ්ඩයට ලැබුණු ප්‍රතිචාරවලට, තම පවුල, ප්‍රදේශය, නගරය හෝ රට අතහැර යාම; 'සාමාන්‍ය' ලෙස ජීවත්වීම හෝ සාමාන්‍ය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව ජීවත්වීම; LBT කණ්ඩායම් සහ ප්‍රජාව වෙතින් සහයෝගය පැතීම; නිවසින් බැහැරව නිදහස සෙවීම (ක්‍රීඩාවල නිරත වීම, කාය වර්ධන මධ්‍යස්ථාන/පුස්තකාලවල කාලය ගත කිරීම; වැනි ගෙදරින් බැහැරව සිටින ක්‍රියාවල නිරත වීම) සහ ශාරීරිකව සහ වාචිකව යළිපෙරලා සටන් කිරීම අයත් විය.[78]

76. මායා සමඟ පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 ජනවාරි 22.
77. සෝමා සමඟ පැවති සම්මුඛ සාකච්ඡාව. කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011.
78. සම්මත ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට හෝ/සහ ලිංගික නැඹුරුවට අදාල ආකල්පවලට අනුව ජීවත්වීම ඒත්තු ගන්වන සේ පොදු ස්ථානවල ගැවසීමේ දී මෙමගින් අදහස් කරනු ලැබේ.

සම්මුඛ සාකච්ජාවට සහභාගි වූ හයදෙනෙකු පවසා සිටියේ, වෙනස්කොට සැලකීම් සහ ප්‍රචණ්ඩ ක්‍රියාවලට මුහුණ දීමට ඇති අකමැත්ත නිසා තමන් පවුල්වලින්, නගරයෙන් හෝ රටින් බැහැරව ගිය බවක් හෝ බැහැරව ජීවත්වීමට ඉතා කැමැත්තක් දක්වන බවත් ය. ක්‍රිස්ටි, ''මගේ ජීවිතය මට අවශ්‍ය විදිහට ගත කරන්න හරිම අමාරුයි. මට සමහර වෙලාවකට හිතෙනවා..... කිසිම සළකුණක් ඉතුරු නොකර අයින්වෙලා යන්න... සමහර වෙලාවට රටින් පිටවෙන්න හරි, මැරෙන්න හරි හිතෙනවා'' යැයි පැවසුවා ය.[79]

තම ප්‍රදේශවලින් බැහැරවීමට කැමති සියළුදෙනාටම එසේ කිරීමට නොහැකි වී ඇත්තේ ආර්ථික අපහසුතා නිසා ය. පවුල තුළ සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා හෝ සමහර අවස්ථාවල දී සමලිංගිකයින්ව අනාචාරයේ හැසිරෙන්නන් ලෙස දකින නිවෙස් හිමියන්ගෙන්, සිදුවන තාඩන-පීඩන නිසා තමන්ට තම දෙමාපියන්ගේ නිවෙස්වලින් හා තමන් ජීවත් වූ නිවාසවලින් බැහැරව ජීවත්වීමට සිදු වූ බව තවත් පුද්ගලයින් විසින් පවසා සිටින ලදී.

තම එදිනෙදා ජීවිතයේ සිදුවන ප්‍රචණ්ඩත්වයටත් අපචාර හා තාඩන-පීඩන වලින් වැළකීමේ ඉතාම ප්‍රයෝජනවත් උපායමාර්ගයක් සහ සිත්ගන්නා සුළු ක්‍රියාමාර්ගයක් ලෙසට සම්මුඛ සාකච්ජාවට ලක්කෙරුන සමලිංගික සහ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින් 7 දෙනෙකු පිරිමින් ආකාරයෙන් පෙනී සිටීම සහ හැසිරීම මගින් ප්‍රචණ්ඩත්වයෙන් බේරීමට උත්සාහ ගෙන තිබුණි.

පිරිමියෙකු ලෙස සැරසීම හෝ එවැනි ආකාරයෙන් ඇඳුම් ඇඳීම මගින් තම ස්ත්‍රී-සමලිංගික අනන්‍යතාව පෙන්වීමට හැකියාවක් ලැබෙන අතර, වැඩිපුර පිරිමින් ගැවසෙන සහ පිරිමි ආධිපත්‍ය රැඳී තිබෙන ස්ථානවල දී මේ නිසා වඩා සුරක්ෂිත බවක් ලැබේ. උදාහරණයක් ලෙස, එක් සමලිංගික කාන්තාවක් ප්‍රකාශ කරන ලද්දේ ඇය මෝටර් සයිකලයේ රාත්‍රී කාලයේ ගමන් කිරීමේ දී තම ආරක්ෂාව සඳහා පිරිමි ළමයෙකු ලෙස ඇඳ පැළඳගෙන යාමට කැමති බවයි.[80]

79. ක්‍රිස්ටි සමඟ පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 පෙබරවාරි 16.

80. ඉන්ද්‍රණි සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 අප්‍රේල් 28.

සම්මුඛ සාකච්ඡාවට යොමු වූ සමහර පුද්ගලයන් කියා සිටියේ තමන් සම්මත ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට අනුකූලව ජීවත්වන බවයි. (පිරිමි ලෙස ඉපදුනේ නම් පිරිමියෙකු ලෙසටත්, ගැහැණියක ලෙස ඉපදුනේ නම් ගැහැණියක ලෙසටත්) [81] ඒ අතර, තවත් සමහරුන් පවසා සිටියේ තමන්ව හඳුනාගෙන තිබෙන ආකාරයට ට්‍රාන්ස් පුද්ගලයෙකු ලෙස ජීවත්වීම හෝ සමාජය 'වැරදි ලෙස' ට හඳුනාගන්නා ආකාරයට ජීවත්වීම තමන්ට පහසු බව ය. ඇය කියා සිටියේ, ''පොදු වැසිකිළි - හැමතිස්සේම වැසිකිළියට යනකොට 'මල්ලි මල්ලි, වැරදිලා අනිත් එක' කියලා කියනවා. එතකොට මට 'අපෝ දෙවියනේ' කියා සිතෙනවා. නමුත්, පසුව 'අයියෝ මම ගියේ වැරදි එකට කියලා' පිරිමි වැසිකිළියට යනවා ... මොකද හැමෝම හිතන්නේ මම පිරිමි ළමයෙක් කියලා'' යැයි කීවා ය.[82]

මායා, ස්ත්‍රියක් ලෙසට සැරසී ටික කාලයක් ගතකරමින්, දිනපතාම පොදු ස්ථානවල දී ඇය දෙස අනවශ්‍ය ලෙස විපරමින් බලන පුද්ගලයන්ගෙන් වැළකී සිටියා ය. මායා 37 හැවිරිදි බුච් සමලිංගික කාන්තාවක් ලෙසට තමාව හඳුනා ගෙන ඇති අතර, ශ්‍රී ලංකාවේ වාසය කරයි. ඇය පැවසූ අන්දමට, ''මම මගේ පෙනුම වෙනස් කරගත්තා, කොණ්ඩය වැවුවා, ඇඟ ටිකක් මහත් කරගත්තා, එවිට මම බොහෝ දුරට කාන්තාවක් ලෙසට පෙනුණා. එවිට පුදුමයකට මෙන් කවුරුත් මාව ගණන් ගත්තේ නෑ. මට බැංකුවකට හෝ ඕනෑම ආයතනයකට යන්න පුළුවන් වුනා. නමුත් ඊට කලින් හැමෝම මගේ දිහා අමුතු විදිහට බලනවා. (නමුත් ඒ වතාවේ) එහෙම නැහැ. ඉතිං ඒක මට සහනයක් වුනා. නමුත් ඒ එක්කම මට වෙන්න වුනු පුද්ගලයා නිසා මට අමුත්තක් දැනුණා. මට හිතුනා, මම ඉන්න විදිහ මගේ සැබෑ තත්ත්වය පෙන්වන්නේ නෑ කියලා.''[83]

81. ඇඳුම් ඇඳීමේ භාෂාව විශ්ලේෂණය කිරීමට සංඥා සහ සළකුණු ප්‍රයෝජනවත් වන බව රූත් රූබන්ත්ටයින් (1995) සඳහන් කරයි. 'සංඥා' යනු සංඥාවක් ලබාදෙන, පැහැදිලි තේරුමක් ඇති දෙයක් බව පවසන ඇය, එයට විරුද්ධව 'සළකුණු' යනු තේරුම් ගණනාවක් ඇති දෙයක් බව කියයි. (පිටුව 7) සළකුණු සහ සංඥා දන්නා ප්‍රේක්ෂකයින් විසින් හඳුනාගෙන අර්ථකතනය කිරීමට හැකිනම් මෝස්තර සහ ඇඳුම් සාර්ථක සන්නිවේදන මාධ්‍යයක් ලෙසට හඳුනාගත හැකිය. එසේ කිරීමට බැරිවීම මගින් වැරදි ලෙසට අර්ථකතනයක් හෝ වැරදි හඳුනාගැනීමක් විය හැකිය. උදාහරණයක් ලෙසට, ශ්‍රී ලංකාවේ 'පිරිමි ගති ඇති ස්ත්‍රී සමලිංගිකයින්' හඳුන්වන්නේ පිරිමි ලෙසට ඇඳුම් අඳින සමාජ පරිසරයක් තුළ 'පිරිමි ගති ඇති' පුද්ගලයින් ලෙසට ය. මෙයට විරුද්ධව, ශ්‍රී ලංකාවේ ගමක 'පිරිමි ගති ඇති ස්ත්‍රී සමලිංගිකයකු බොහෝ පහසුවෙන් 'පිරිමියකු' හෝ 'පිරිමියකු මෙන් පෙනී සිටින ගැහැණු ළමයකු' සේ (වැරදියට) හඳුනාගන්නවා ඇත.

82. H සමඟ පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 පෙබරවාරි 12.

83. මායා සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව. 2011 ජනවාරි 22.

සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ විසිදෙනෙකු පවසා සිටියේ තමන් ඉතාමත් ඕනෑකමින් තමන්ට අවශ්‍ය සහනය සහ මාර්ගෝපදේශය ලබාගැනීම සඳහා විෂම හෝ කාන්තා කණ්ඩායම්/ව්‍යාපාරය තුළ වූ නොයෙකුත් සහයෝගීතා කණ්ඩායම්, පුද්ගලයින් හෝ ආයතනවල පිහිට පැතූ බවයි. මායා නිවැරැදිව පෙන්වා දුන් පරිදි, 'ඒක හරිම පුදුම දෙයක්, ඇත්තටම මෙම සහයෝගිතා කණ්ඩායම් (විශේෂයෙන් කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම් ගැන සඳහන් කරමින්) ඔවුන්ට විවිධ ක්‍රියාකාරකම් මිලියන දහයක් තියෙන්න පුළුවන්. නමුත් ඔවුන් සමග එකට ගැවසීම, දවල් ආහාර ගැනීම ම අපට ලැබෙන විශාල උදව්වක්'' යනුවෙනි.[84]

චාන්දනී විස්තර කළ අන්දමට, ඇය වසර ගණනාවක්ම තමා ''තෝරාගත් පවුලෙන්'' (තමන් යැපුණු යහළුවන්) සහනය සහ සහයෝගය බලාපොරොත්තු වූ බවත්, තමන්ගේ ජීව විද්‍යාත්මක පවුලෙන් සහයෝගයක් බලාපොරොත්තු නොවූ බවත් ය.[85]

සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ එකලොස් දෙනෙකු සඳහන් කර සිටියේ, ප්‍රචණ්ඩත්වයෙන්, අපචාර සහ වැරදි ලෙසට සැලකීම වැනි අපහසුතාවලින් මිදී, සැනසුම් සහගතව ජීවත්වීම සඳහා තමන් නිවසින් බැහැරව ක්‍රියාකාරකම්වල නිරතවන බව ය. තම මානසික සුවය සඳහා සංගීතයට සවන්දීම, චිත්‍රපට නැරඹීම සහ පුස්තකාලයට යෑම වැනි ක්‍රියාවලට ඔවුන් යොමු වී ඇත. ඒ අතර, සමහරුන් බොහෝ සේ කය වෙහෙසා කරන ක්‍රියාකාරකම්වලට යොමු වී, කාය වර්ධන මධ්‍යස්ථාන කරා යෑම, ඇවිදීම, දිවීම වැනි ක්‍රියා සඳහා ද යොමු වී ඇත.

බොහෝ සමලිංගික කාන්තාවන්ට සහ ට්‍රාන්ස් පුද්ගලයින්ට වෙනස්කොට සලකන අවස්ථාවක දී හෝ ප්‍රචණ්ඩත්ව තත්ත්වයක දී තමා වෙනුවෙන් සටන් කිරීමේ ඉතාම සාමාන්‍ය ක්‍රමය වන්නේ, වාචිකව තම විරෝධය පළ කිරීමයි. සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ 33 දෙනාගෙන් 22 දෙනෙකු පවසා සිටියේ, තම දෙමාපියන්ගෙන් සිදුවන මානසික හිරිහැරවලින් මිදීමට ඇති එකම මඟ හැකිතාක් දුරට වාචිකව සටන් කිරීම බවයි.

84. එම

85. චාන්දනී සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2010 නොවැම්බර් 17.

තිස්හය හැවිරිදි හොට්හෙඩ් නැමැති සමලිංගික කාන්තාව මෘදු පිරිමි ගති ඇති කාන්තාවක් ලෙසට තමාව හඳුන්වා ගනී. කොළඹ ජීවත්වන ඇය කියා සිටියේ ''මගේ අම්මාට මා විවාහ කරදීමට අවශ්‍ය වුනා. එයා ඇයගේ යහළුවන්ගේ පුතුන් ගැන මට යෝජනා කළා. ඔවුන් තමයි මට ගැලපෙන සුදුසුම ස්වාමිපුරුෂයින් කියලා. එතකොට මම කිව්වා... ඔය අදහස අතහැර ගන්න එක හොඳයි, මොකද මම හිතන්නේ මම පිරිමින්ට වැඩිය ගැහැණු අයට කැමතියි කියලා'' යි.[86]

ඉනෝකා නමැති 29 හැවිරිදි, කොළඹ පදිංචිව සිටින, පිරිමි ගති ඇති සමලිංගික කාන්තාවක් ලෙස තමා හඳුන්වා ගන්නා අතර ඇය ද මේ සමානම ප්‍රතිචාර දක්වා සිටියා ය. ඇය විස්තර කළ අන්දමට ඇය තමන් සමලිංගික කාන්තාවක් බව මවට කීමෙන් පසු ඇයගේ පළමුවන ප්‍රශ්නය කෙලින්ම එල්ල වූයේ... ලිංගික හැසිරීම සම්බන්ධවයි.... ඇය ඇහුවා ''ඔයා කොහොමද තවත් කාන්තාවක් එක්ක ලිංගිකව එක්වෙන්නේ?''... කෝ ''ඔයා තවත් ගැහැණු කෙනෙක් එක්ක ලිංගිකව හැසිරිලා තියෙනව ද?, ඔයා සමලිංගික කියල කියන්න?'' කියලා... එතකොට මම කිවුවා ... හොඳයි ඔයා සමලිංගික නැහැ කියල කියන්නේ, පිරිමියෙක් එක්ක ලිංගිකව හැසිරුණාට පස්සෙ ද?''[87] යනුවෙන් පැවසුවා ය.

තම රැකියා ස්ථානයේ දී තමන්ට සිදු වූ ශාරීරික අතවර පිළිබඳ ක්‍රිස්ටි අප සමග කියා සිටියා ය. එම අතවර වාචික ඒවාට පමණක් සීමා වී, ශාරීරික හිරිහැර දක්වා වර්ධනය නොවුනේ ඇය තමාට හිරිහැර කරන්නාට විරුද්ධව ක්‍රියා කළ නිසා ය. ඇය ''මම මගේ ප්‍රධාන විධායක නිලධාරියාට තරවටු කර කිවුවා, ඔහු, මට මොකක් හරි කරන්න ආවොත්, මම අනිවාර්යයෙන්ම කම්කරු දෙපාර්තමේන්තුවට යනවා කියලා. ඒ වගේම මම ඔහුට කිවුවා, ඔහු මාව අල්ලන්න හැදුවොත්. මම ඔහුට කම්මුල් පහරක් ගහනවා කියලත්, ඒක හැමෝම ඉස්සරහ කරන බවත්'' කීවා යැයි කියා සිටියා ය.[88]

86. හොට්හෙඩ් සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2010 සැප්තැම්බර් 18.

87. ඉනෝකා සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2010 ඔක්තෝබර් 14.

88. ක්‍රිස්ටි සමග පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 පෙබරවාරි 16.

නයෝමි, 20 හැවිරිදි වන අතර, තම දෙමාපියන් සමග කොළඹ පදිංචි වී සිටින්නියකි. එමෙන්ම ඇය තමන්ව හඳුන්වා දීමට විශේෂ ලේබල් යොදා ගැනීමට අකමැත්තක් දක්වන්නී ය. තමන් වෙතට නන්නාඳුනන පුද්ගලයින්ගෙන් එල්ලවන වාචික අපවාදවලින් වැළකී සිටීමට ඉංග්‍රීසි භාෂාව මෙවලමක් ලෙසට යොදාගන්නා බව ඇය අප සමග පැවසුවා ය. ''මම ඔහුට ඉංග්‍රීසි භාෂාවෙන් කතා කළා. මොකද මම දන්නවා, එවිට බොහෝ පුද්ගලයන් බය බව... ඊට පස්සේ, ඔහු කටපියාගෙන යන්න ගියා'' යනුවෙන් ඇය පැවසුවා ය.[89]

89. නයෝමි සමඟ පැවති සම්මුඛ සාකච්ඡාව, කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාව, 2011 සැප්, 22.

# [#10 ශ්‍රී ලංකාවේ LBT පුද්ගලයින්ට බලපාන නීති ]

## දණ්ඩ නීති සංග්‍රහයේ 365A වගන්තිය බරපතල අසභ්‍යතාව

1995 ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහ පනතේ අංක 22 මැයි සංශෝධනයේ 365A වගන්තිය, වැඩිහිටි කැමැත්ත ඇතිව සිදුකරන සමලිංගික සම්බන්ධතා අපරාධයක් ලෙසට භාවිතා කිරීමට උපයෝගී කරගනු ලැබේ. [90]

ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 1995 වූ සංශෝධනයට පෙර, 365A වගන්තිය මගින් අපරාධයක් යැයි සලකන ලද්දේ පුරුෂයින් අතර සිදුවන ලිංගික ක්‍රියාකාරකම් පමණි. මෙම විධිවිධාන මධ්‍යස්ථ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයන්ට සහ වෙනස්කොට නොසැලකීමටත්, වෙනස් කිරීමට දරණ ලද අයහපත් පරිකල්පන ප්‍රයත්නයත් මගින්, 365A වගන්තිය සංශෝධන වී ''පුද්ගලයන් දෙදෙනෙකු අතර වන ක්‍රියාවක්'' ලෙසට වෙනස් වූ අතර, මෙම සංශෝධනය මගින් කාන්තාවන් අතර සිදුවන ලිංගික ක්‍රියාකාරකම් ද එම නීතිය යටතට ගෙන එන ලදී.[91]

90. එහි මෙසේ සඳහන් වේ: ''පොදු ස්ථානයක හෝ පෞද්ගලික ස්ථානයක වරද සිදුකරන ඕනෑම පුද්ගලයකු හෝ වරදට පංගුකරුවකුවන හෝ තවත් තැනැත්තෙකුට වැරදි ක්‍රියාව කිරීමට තැත් කරන හෝ සහාය ලබාදීම සඳහා වෙනත් පුද්ගලයකු සමඟ කරන බරපතල අසභ්‍ය ක්‍රියාවකට වරදකරුවනු ඇති අතර, එම තැනැත්තාට අවුරුදු 2 දක්වා කාලයකට බන්ධනාගාර ගතකිරීම මගින් හෝ දඩයක් හෝ ඒ දෙකම සහිතව දඬුවම් පමුණුවනු ලබන අතර, අවුරුදු 18 ට වැඩි පුද්ගලයකු විසින් අවුරුදු 16 ට අඩු පුද්ගලයකුහට වරද කරනු ලැබුවේ නම් දඩයක් සහිතව එම පුද්ගලයා අවුරුදු 10 ට නො අඩු සහ අවුරුදු 20 ට නොවැඩි කාලයකට බරපතල වැඩ සහිතව බන්ධනාගාර ගතකරන අතර, අපරාධය සිදු වූ පුද්ගලයාට, ඔහුට සිදු වූ හානිය වෙනුවෙන් අධිකරණය නියම කරන වන්දි මුදලක් ගෙවීමට ද නියෝග කරනු ඇත.''
91. වැඩි විස්තර සඳහා: තම්බයියා, වයි. (2004) (IM) Moral Citizens: Sexuality and the Penal Code in Sri Lanka in A.J. Canagaratna (Ed.) Neelan Tiriuchelvam Commemoration Conference Papers (pp.107-141) Colombo, ICES.

''බරපතල අසභ්‍යතාවය'' යනු කුමක්දැයි නිර්වචනයකොට නොමැති අතර, එමගින්, එම විධිවිධානය විෂම ලිංගික සම්බන්ධතා සඳහා ද යොදා ගත හැකිද? යන්න සම්බන්ධයෙන් පැහැදිලි නැත. දේශපාලනික සහ අනෙකුත් මහජන නායකයින් පුරුද්දක් වශයෙන් LBT ප්‍රජාවට විරුද්ධව කරනු ලබන ප්‍රකාශ දක්නට ලැබෙන සමාජ වටපිටාවක, මහජන පරිකල්පනය අනුව ''බරපතල අසභ්‍යතාවය'' බොහෝ විට සමලිංගික සම්බන්ධතා හැඳින්වීමට යොදා ගත්තක් බව කිව හැකිය. 365A වගන්තිය යටතේ එන නඩු, උසාවියක කලාතුරකින් විභාගකර නැතත්, එවැනි අනුමාන අගයන් මත පදනම් වූ විධිවිධාන පොත්වල සඳහන් වී තිබීම ම සුළුතර ලිංගිකයින්ට පොලීසිය විසින් කරනු ලබන අපයෝජන සහ අනෙකුත් බලපෑම්වලට සහ ඔවුන්ගේ ජීවිතයේ තේරීම්වලදී හෝ ලිංගික ක්‍රියාකාරකම්වලදී පමණක් නොව ලිංගික අයිතිවාසිකම් සඳහා කරන ක්‍රියාකාරකම්වල දී [92] ඔවුන් ගොදුරක් කරගැනීමට හේතුවක් වේ.

පෞද්ගලික පුරවැසියන් එය අනෙකුත් අයට එරෙහිව, බොහෝ විට පවුලේ සාමාජිකයන්ට එරෙහිව යොදාගන්නා බවට තර්ජනයකර පසුව, එය නීතිය ක්‍රියාකරවන්නන්පිට දමනු ලැබූ සිද්ධීන් ද වාර්තා වී ඇත.[93]

සමලිංගික, ලිංගික ක්‍රියාවන් සාපරාධී ක්‍රියාවක් ලෙසට සැලකීම මගින් පොලීසියට සහ සමලිංගිකත්වයට විරුද්ධ කණ්ඩායම්වලට සියලු ස්ත්‍රී LBT පුද්ගලයන්ට 'කාම විකෘතීන්' සහ අපරාධකරුවන් ලෙසට නම් කිරීමට මග පෑදෙනු ඇත. විෂම ලිංගික නොවන පුද්ගලයන් ලෙසට හඳුනාගැනීම සහ අල්ලාගැනීම පිළිබඳව වන බිය, LBT පුද්ගලයන්, ඔවුන්ගේ පවුල්, යහළුවන් සහ සමස්තයක් වශයෙන්

92. ''බරපතල අසභ්‍යත්වය සඳහා පුද්ගලයින් දෙදෙනෙකුට දඩ'', ඩේලි මිලර්, 16.2012, ශ්‍රී ලංකාව අන්තර්ජාලයේ පළ කර ඇත. කොටුවේ දුම්රිය පොලේ පොදු වැසිකිලියක සමලිංගික ක්‍රියාවක යෙදී සිටි පුරුෂයන් දෙදෙනෙකුට කොළඹ මහාධිකරණය විසින් එක් අයෙකුට රු.1500/= බැගින් වූ දඩ මුදලක් නියම කරන ලදී. මුඛ ලිංගික ක්‍රියාවක යෙදී සිටිය දී කොටුව පොලීසිය විසින් 40 හැවිරිදි පුරුෂයකු හා 50 හැවිරිදි පුද්ගලයකු අත්අඩංගුවට ගන්නා ලදී. එක් පුද්ගලයකු රජයේ නිලධාරියකු ලෙසට හඳුනාගෙන ඇත. කොළඹ කොටුවේ මහේස්ත්‍රාත්, කණිෂ්ක විජේරත්න ඉදිරියේ ගොනු කරන ලද චෝදනා පත්‍රයේ සැකකරුවන් දණ්ඩ නීති සංග්‍රහයේ 365 A වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති බව පැමිණිලි පක්ෂය විසින් සඳහන් කරන ලදී. සැකකරුවන් පොදු වැසිකිළියක බරපතල අසභ්‍ය ක්‍රියාවක නිරත වූ බවට පොලීසිය චෝදනා කළේ ය. විත්තියේ නීතිඥයා, ජයරත්න පතිරණ කියා සිටියේ සේවාදායකයා මෙම චෝදනාවලට වරදකරු ලෙසට පිළිගන්නා බවයි.'' http://www.dailymirror.lk/news/23546-two-men-fined-for-gross-indecency-.html,

93 වැඩි විස්තර සඳහාඃ තම්බයියා වයි. (2003) Man-made Laws and Feminine Feelings: A 'Lesbian' Encounter with the Law in Sri Lanka, Lines, 2(1) May 2003 ශ්‍රී ලංකා, ජේළි 2(1) මැයි 2003 බලන්න.

මුළු සමාජයම සම්බන්ධකරගත් නිහඬ චක්‍රයකට මුල පුරනු ඇත. මෙමගින් බලකිරීම්, බියවැද්දීම්, නීති විරෝධී අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තැබීම්, ශාරීරික සහ ලිංගික හිරිහැර සහ සමච්චල් කිරීම්, වධහිංසා, දූෂණය සහ ලිංගික නැඹුරුව, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අර්ථකතනය සහ ප්‍රකාශනය හේතුවෙන් ස්වාධීන පුද්ගලයින් ඇතුලුව, රජයේ සහ රාජ්‍ය නොවන පිරිස් විසින් කරනු ලබන මිනීමැරීම් ඇතුලු විවිධ මානව හිමිකම් උල්ලංඝන රාශියක් මගින් LBT පුද්ගලයන් අවදානම් තත්ත්වයකට පත්කරනු ලැබේ.

## b. 399 වගන්තිය - දණ්ඩ නීති සංග්‍රහය - පුද්ගලාරූඪය (Personation) මගින් රැවටීම

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 399 වන වනගන්තිය වන පුද්ගලාරූඪය මගින් රැවටීම, බොහෝ විට ට්‍රාන්ස් පුද්ගලයින්ට විරුද්ධව භාවිතා වන්නකි.[94] 'පුද්ගලාරූඪය' සහ 'වෙන කෙනෙකු සේ පෙනී සිටීම' සිදිධීන් කිහිපයක් උසාවියට පැමිණ ඇති අතර, එහිදී කාන්තාවන් පුරුෂයන් සේ වෙස්වලාගෙන" සිටීම සහ ඔවුන්ගේ 'සත්‍ය ලිංගික අනන්‍යතාව' මහජනයාට හෙලිවිය. මීට සමාන ලෙස "මහජනයා නොමඟ යැවීම" සම්බන්ධයෙන් සංක්‍රාන්ති ලිංගික කාන්තාවන් අත්අඩංගුවට ගෙන ඇත.[95]

94. ''වෙනත් පුද්ගලයකු ලෙසට පෙනී සිටීමට තැත් කිරීම හෝ අනුදැනුම ඇතිව වෙනත් පුද්ගලයකු ලෙසට පෙනී සිටීම හෝ පෙනී සිටින ලද පුද්ගලයා හෝ ඔහු සත්‍ය වශයෙන්ම වෙනත් පුද්ගලයා නොවීම, පුද්ගලයකු ''පුද්ගලාරූඪය මගින්'' රැවටීම වේ'' යනුවෙන් කියැවේ. අර්ථකතනය : පුද්ගලාරූඪය කරනු ලබන පුද්ගලයා සත්‍ය හෝ මනඃකල්පිත පුද්ගලයකු වූ විට එය වැරැද්දක් ලෙසට පිළිගැනේ. මෙම වැරැද්දට වරදකරුවකු වූ ඕනෑම පුද්ගලයකුට දඬුවම් වශයෙන් දඩයක් හෝ අවුරුදු 3ක් දක්වා කාලයකට සිර දඬුවමක් හෝ යන දෙකම නියම කළ හැක.

95. ලංකාදීප බලන්න; 'පිරිමි ළමයකු අවුරුදු 18 දී සිට ගැහැණු ළමයකු සේ වෙස්වලාගෙන', 2010 අගෝස්තු 31; ලංකාදීප, 'යුද හමුදා නිලධාරියකු සේ වෙස් වලාගත් කාන්තාවක් දුරකථන ඇමතුමක් නිසා ඇතිවූ ප්‍රේම සම්බන්ධයකින් පසුව කාන්තාවක් සමග විවාහ වෙයි', 2010 අගෝස්තු 23; දිවයින, 'කෙල්ලෝ, කොලු කෙල්ලන් ලෙසට වෙස්වලාගෙන', 2009 මැයි 17; ලංකාදීප, 'අවුරුදු 20ක් පිරිමියකු සේ වෙස්වලාගත් පුද්ගලයකු පොලීසියේ දී කාන්තාවක වෙයි', 2009 ජනවාරි 3; ලංකාදීප, 'පිරිමියෙකු සේ වෙස්වලාගත් 16 හැවිරිදි අභිකුණ්ටික තරුණිය මිනීමැරුමකට සැකපිට අත්අඩංගුවට' 2005 මැයි 11; ලංකාදීප 'දඹුල්ල පන්සලේදී පිරිමි ළමයා ගැහැණු ළමයකු වෙයි', 2004 මාර්තු 10; ලංකාදීප, 'යුද හමුදා නිලධාරිනියක ලෙස වෙස්වලාගත් යුද හමුදා නිලධාරියාට හොර හැඳුනුම්පතක් දීම සම්බන්ධයෙන් කොස්තාපල්වරිය අත්අඩංගුවට' 2003 ජනවාරි 18; ඉරිදා ලංකාදීප, 'ගැහැණු වෙස් ගත් පිරිමියකු සම්බන්ධ සිද්ධියක්' 2003 ජූලි 20.

## c. 1842 අයාල ආඥා පනත

පොදු ස්ථානවල රස්තියාදුවන්නන් ලෙසට හඳුන්වන පුද්ගලයින් රඳවා තැබීමට බලධාරීන්ට බලය පැවරීම 1842 දී සම්මත ශ්‍රී ලංකාවේ අයාල ආඥා පනතට අනුව අදටත් සිදුවේ.[96]

"නිකරුණේ කාලය ගත කරන පුද්ගලයා" අසද්භාවයෙන් යුතුව අයාලේ යන්නෙකු ලෙසට අර්ථකතනය කිරීමේ අභිමතය සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ බලය පොලීසියට ඇත. මෙය බොහෝ විට අයාල අඥා පනත අනිසිලෙස භාවිතා කිරීමට සහ වැරදි ලෙසට යොදා ගැනීමට භාවිතා කරන අතර, මෙමගින් විෂම ලිංගික නොවන කාන්තාවන්, ට්‍රාන්ස් පුද්ගලයින් සහ නාච්චි [97] ප්‍රජාව වැරදි ලෙසට අත්අඩංගුවට ගැනෙන්නේ ඔවුන් වෙනස් ලෙසට දකින බැවින් ය. අඩු සමාජ ආර්ථික තත්ත්වයක් ඇති, පොලීසියේ හිංසනයට ලක්වීමේ අවදානම ඇති සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින් අල්ලා ගැනීමට අයාල ආඥා පනත බෙහෙවින් භාවිතයට ගැනේ.[98] බොහෝවිට ඔවුන් අඳින පළඳින ආකාරය (ඔවුන්ගේ ජීව විද්‍යාත්මක ලිංගයට විරුද්ධව) ඔවුන්ව ලිංගික ශ්‍රමිකයන් ලෙසට නිගමනය කිරීමට හේතුවක් වේ - අයාල ආඥා පනත මගින් ලිංගික ශ්‍රමිකයන්ට හිරිහැර කිරීම, අත්අඩංගුවට ගැනීම සහ චෝදනා ඉදිරිපත් කිරීම සාධාරණීකරණය කරයි.[99]

නීතියට අනුව චෝදනා ලද පුද්ගලයින් (වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගත්) පොලීසිය විසින් පැය 24 ක් ඇතුළත මහේස්ත්‍රාත්වරයා වෙතට ඉදිරිපත් කළ යුතුය. නමුත්, චෝදනාලද

96. "පොදු වීදිවල හෝ මහා මාර්ගයේ හෝ මහජනයා ගැවසෙන ස්ථානයක අයාලේ ගැවසෙන හෝ අසංවර ලෙසට හැසිරෙන හෝ අශෝභන ලෙසට හැසිරෙන සෑම පොදු ගණිකාවක්ම.... නිකරුනේ කාලය ගතකරන හෝ නොහික්මුණු පුද්ගලයෙකු ලෙස විනිශ්චය කරනු ලබන අතර නීතිය ඉදිරියේ වරදකරුවකු කොට බරපතල වැඩ සහිතව හෝ නොමැතිව දවස් 14කට නොවැඩි කාලයක් සඳහා සිර දඬුවම් හෝ දඩයක් නියම කරනු ලැබේ." යනුවෙන් වගන්ති අංග 3 (1) (ආ) මගින් අවධාරණනය කරනු ලැබේ. "එවැනි පුද්ගලයකු බලපත්‍රයක් නොමැතිව අත්අඩංගුවට ගැනීමට හැකිය." යන්න වගන්ති අංක 3 (2) මගින් අවධාරණය කරනු ලැබේ.

97. "ගැහැණු ලෙසට පෙනී සිටීමට කැමති එහෙත් ඔවුන්ගේ ප්‍රධාන 'පුරුෂ' බව අතහැරීමට අවශ්‍යතාවයක් නැති සහ පිරිමින් සම්බන්ධව දැඩි ලිංගික ආශාවක් ඇති" පිරිමි ශරීරයක් සහිත පුද්ගලයන් ලෙසට තමාව හඳුන්වන නාච්චි ප්‍රජාව විසින් එක්තරා කොටසක් හැඳින්වීමට භාවිතා කරන සිංහල යෙදුමකි. (මිලර් සහ නිකොලස්, 2012 : 555)

98. වැඩි විස්තර සඳහා : නිකොලස්. ඒ (2010) Nichols A. (2010) Dance Ponnaya Dance Feminist Criminology April 2010, Volume 5, No.2 අප්‍රේල් කාණ්ඩ 5, අංක.2 කියවන්න. http://fcx.sagepub.com/content/5/2/195

99. නිකලොස්. ඒ (2010) Nichols A. (2010) Dance Ponnaya Dance Feminist Criminology April 2010, Volume 5, No. ෆෙමිනිස්ට් ක්‍රිමිනොලොජි, 2010 අප්‍රේල් කාණ්ඩ 5, අංක.2 http://fcx.sagepub.com/content/5/2/195

පුද්ගලයින් සිකුරාදා දිනයක අත්අඩංගුවට පත් වුවහොත් මහේස්ත්‍රාත්වරු සති අන්තයේ රාජකාරි නොකරන බැවින්, ඔහු හෝ ඇය පැය 48ට වඩා වැඩි කාලයකට රඳවාගෙන තබනු ලබන්නට හැකියාවක් ඇත. අත්අඩංගුවට ගැනීම් රාත්‍රී කාලයේ සිදුකිරීම සහ චෝදනා ලද පුද්ගලයින් රාත්‍රියක් පොලීසිය බාරයේ තබා ගැනීමේ සමහර සිද්ධීන් අත්අඩංගුවට ගත් මෙම පුද්ගලයින් අපයෝජනයට ලක්වීම් සම්බන්ධයෙන් වාර්තාගත වී ඇත.[100]

## d. මූලික අයිතිවාසිකම්

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදයේ ශ්‍රී ලාංකික පුරවැසියාගේ අයිතීන් පිළිබඳව සඳහන් වේ.[101]

ලිංගික නැඹුරුව හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය මත ආරක්ෂාව තහවුරු කිරීම පිළිබඳව ව්‍යවස්ථාවේ සඳහන් නොවේ. මෙම තහවුරු කිරීම්, වෙනස්කොට නොසැලකීම යටතට ගැනෙන විධිවිධාන මගින් ආවරණයවන බවත්, නීතිය ඉදිරියේ සියලු පුද්ගලයින් එක සමාන බවත්, පිළිබඳව තර්ක කළ හැක. උපතේ දී පිරිමි හෝ ගැහැණු ලෙසට ජීව විද්‍යාත්මක වර්ග කිරීමක් කිරීම ඇරුණුකොට වෙනත් කිසිවකුට 'ලිංගය' යන පදය භාවිතා කිරීමට ව්‍යවස්ථාව මගින් අවස්ථාව සලසා දී නොමැත කෙසේ නමුත්, වෙනස්කොට සැලකීම ආවරණය කරන විධිවිධාන ''එවැනි හේතූන් මත'' වෙන්කොට හඳුනාගැනීම තහනම් කරනු ලැබේ. එවැනි අවස්ථාවක එය ජාත්‍යන්තර නීතිය සමග සන්සන්දනය කිරීමට නම්, ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය මත වෙනස්කොට සැලකීමට විරුද්ධව විධිවිධාන ඇතුළත්කර එය අර්ථකතනය කළයුතු අතර, සමලිංගික ක්‍රියාකාරකම් අපරාධී ක්‍රියා වශයෙන් නම් කිරීම දැනට පවතින නීතිය යටතේ සිදුවේ.

ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සම්බන්ධව නිශ්චිත වෙනස්කොට නොසලකන භාෂාවක් ව්‍යවස්ථාවේ නැති බව සුළුතර ලිංගික ප්‍රජාවට බලපෑමක් ඇති කිරීමට

100. (එම ග්‍රන්ථයෙහි ම)

101. එම පරිච්ඡේදයේ 12 වන ව්‍යවස්ථාවට අනුව, ජාතිය, ආගම, භාෂාව, කුලය, ලිංගය, දේශපාලන කැමැත්ත, උපන් ස්ථානය හෝ එවැනි හේතූන් මත කිසිම පුරවැසියෙකුට වෙනස්කොට සැලකිය නොහැක.

හේතුවක් වන්නේ, අයිතීන් භුක්තිවිඳීමේ දී ආරක්ෂාවීමේ දී සහ නීති ක්‍රියාත්මක කිරීමේ දී ඔවුන්ට විශාල වශයෙන් අවාසි සිදුවන නිසා ය. ව්‍යවස්ථාවේ සඳහන් අයිතීන් උල්ලංඝනය වූ හෝ විධායක හෝ පරිපාලනමය ක්‍රියා මගින් ඕනෑම මොහොතක උල්ලංඝනයවීමට තර්ජනයක් පවතින පුද්ගලයකුට ඇති විසඳුම් පිළිබඳව ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවේ 17 වන වගන්තියේ සඳහන් වේ. සඳහන්ව ඇති විසඳුම් යටතට අධිකරණය මගින් සහනය පැතීම, වන්දි ලබාගැනීම හෝ ප්‍රතිසංස්ථාපනය, පුනර්යුක්ත කිරීම සහ රැකියාවේ උසස්වීම් ලබාදීම ඇතුළත් ය. රටෙහි ඇති ඉහලම උසාවියෙන් යුක්තිය පසිඳලීමට අවශ්‍ය ශ්‍රී ලාංකිකයින්ට දූක කීමට ඇති යාන්ත්‍රණයක් වශයෙන් හඳුන්වන මූලික අයිතිවාසිකම් උපයෝගී කරගනිමින්, ශ්‍රේෂ්ඨාධිකරණය ද ඇතුළත්ව උසාවිවලට නඩු විශාල සංඛ්‍යාවක් ලැබී ඇත. කෙසේ නමුත් නීතිය මගින් ලබාදෙන මෙම විසඳුම්, ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය මත වෙනස්කොට සැලකීම්වලදී පුද්ගලයින් විසින් කලාතුරකින් උපයෝගී කරගැනේ.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම විසින් මානව හිමිකම් උල්ලංඝනය සම්බන්ධයෙන් විමර්ශන සිදුකරන අතර, එය විසඳුම් ක්‍රියාමාර්ග සඳහා අනුගමනය කරන වැදගත් යාන්ත්‍රණයකි. කෙසේ නමුදු, මානව හිමිකම් කොමිෂන් පනත පිරික්සා බැලීමේ දී ආවරණය වූ කාරණය නම්, පවතින නීතිය මගින්, පරීක්ෂා කිරීමේ වපසරිය සීමාකිරීම සහ ''මූලික අයිතිවාසිකම්'' යටතේ පමණක් විභාග කිරීම සිදුවන බවයි. එනම් ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කරන මානව හිමිකම් කඩවීම් සඳහා පමණකි. මෙයට, ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය මත වෙනස්කොට සැලකීම අයත් නොවන අතර, එමගින් ජාත්‍යන්තර නීතියට යටත්ව මානව හිමිකම් ආරක්ෂා කිරීමට සහ ඉටුකිරීමට ශ්‍රී ලංකාව දී ඇති පොරොන්දු උල්ලංඝනය වේ.[102] මානව හිමිකම් කොමිෂන් පනත මගින්, ජාතික තලයේ නීති සහ පරිපාලන ක්‍රියාමාර්ග ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රතිපත්ති සහ සම්මතයන්වලට අනුකූල බවට ස්ථිර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳව රජයට නිර්දේශ ඉදිරිපත් කිරීමට ජාතික මානව

102. බලන්න නීතිය සහ සමාජභාරයේ 2010 (Law and Society Trust) (2010) Sri Lanka Atrophy and Subversion of the Human Rights Commission, ANNI Report on the Performance and Establishment of National Human Rights Institutions in Asia, කොළඹ,, ශ්‍රී ලංකාව

හිමිකම් කොමිසමට බලය ලබාදෙනු ලැබේ.[103] කෙසේ නමුත්, LBT පුද්ගලයින් සහ අනෙකුත් සුළුතර ලිංගික ප්‍රජාව වෙනස්කොට සැලකීම්වලට භාජනයවන නීති ප්‍රතිසංස්කරණය කිරීම උදෙසා මානව හිමිකම් කොමිසම විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තා හමු වී නැත.

## e. ජාත්‍යන්තර ගිවිසුම්

ශ්‍රී ලංකාව, එක්සත් ජාතීන්ගේ ප්‍රධාන මානව හිමිකම් ගිවිසුම් සහ විකල්ප ගිවිසුම් රාශියකට අත්සන් කොට ඇත.[104] ශ්‍රී ලංකාවට, LBT පුද්ගලයින් යන අනෙකුත් සුළු ලිංගික ප්‍රජාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධව ඇති ජාතික නීති සහ ප්‍රතිපත්ති සංශෝධනය කිරීමට සහ ඒවා ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට සමාන තලයකට ගෙන ඒම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කිරීමට ඇත.

103. බලන්න නීතිය සහ සමාජභාරයේ 2010 (Law and Society Trust) (2010) Sri Lanka Atrophy and Subversion of the Human Rights Commission, ANNI Report on the Performance and Establishment of National Human Rights Institutions in Asia, කොළඹ, ශ්‍රී ලංකාව.

104. සියළුම ආකාරයේ ජාතිවාදී වෙනස්කොට සැලකීම් තුරන් කිරීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය; ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය; සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය; ස්ත්‍රීන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම සඳහා වන ප්‍රඥප්තිය; වධ දීම සහ අනෙකුත් අමානුෂික ක්‍රියා හෝ පහත්කොට සැලකීම හෝ දඬුවම් දීමට විරුද්ධ වීම පිළිබඳ සම්මුතිය; ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය; ළමුන් විකිණීම සම්බන්ධ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළවන විකල්ප ගිවිසුම සහ සංක්‍රමණික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය.

# [ #11 නිර්දේශ ]

මෙම අධ්‍යයනය මගින් ඉස්මතු කරන ලද ප්‍රචණ්ඩත්වය සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ තොරතුරුවලට පිළියමක් වශයෙන්, ප්‍රතිපත්ති සම්පාදකයින්ට, රජයේ ආයතනවලට, අධ්‍යාපනික ආයතන, පෞද්ගලික අංශයට, සිවිල් සමාජයට සහ අනෙකුත් අදාළ පාර්ශවයන්ට ලබාදීම සඳහා පහත සඳහන් නිර්දේශ හඳුනාග න්නා ලදී.

- 2011 පෙබරවාරි මස දී CEDAW[105] කමිටුවේ 48 වැනි සැසිවාරයේ දී ශ්‍රී ලංකා රජයේ සමාලෝචන සැසියේ දී ඉදිරිපත් කෙරුණු CEDAW කමිටුවේ අවසන් නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීම ''සමලිංගික වැඩිහිටි පුද්ගලයින් අතර ස්වකැමැත්තෙන් සිදුවන ලිංගික සම්බන්ධතා සාපරාධී ක්‍රියාවක් නොකිරීමටත්, සම්මුතිය යටතේ වෙනස්කොට නොසැලකීමට බැඳී සිටින බවත්'' අවසන් නිරීක්ෂණවල දී CEDAW කමිටුව විසින් රජයට අවධාරණය කරන ලදී.
- එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් සඳහා වන මහකොමසාරිස්ගේ වාර්තාවෙහි, වෙනස්කොට සලකන නීති සහ ක්‍රියාවන් මෙන්ම ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය මත පුද්ගලයින්ට එරෙහිව සිදුවන හිංසනයන් පිළිබඳ දක්වා ඇති අවසන් නිගමන සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.
- පොදු හා පෞද්ගලික ස්ථානවල දී සමලිංගික වැඩිහිටියන් අතර සිදුවන ක්‍රියාවන් සාපරාධී ක්‍රියාවක් සේ සලකන දණ්ඩ නීති සංග්‍රහයේ 356A වගන්තිය පරිච්ඡින්න කිරීම.
- ශ්‍රී ලංකාවේ විෂම ලිංගික නොවන ස්ත්‍රීන්ට, ට්‍රාන්ස් පුද්ගලයින්ට සහ නාච්චි ප්‍රජාවට එරෙහිව අයාල ආඥා පනත අත්තනෝමතිකව භාවිතා කිරීමට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම.

105. කාන්තාවන්ට එරෙහි සියලු ආකාර වෙනස්කම් පිටුදැකීමේ ජාත්‍යන්තර සම්මුතිය, එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1979 දෙසැම්බර් 16 වන දින සම්මත කරන ලදී. ශ්‍රී ලංකා රජය විසින් 1981 ඔක්තෝබර් 05 දින මෙයට අත්සන් ලබන ලදී.

- ට්‍රාන්ස් පුද්ගලයින්ට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ 399 වන වගන්තිය, ('පුද්ගලාරූඪය මගින් රැවටීම) පොලීසිය විසින් අත්තනෝමතිකව භාවිතා කිරීම වැළැක්වීමට ක්‍රියා කිරීම.
- වෙනස්කොට නොසැලකීම සම්බන්ධව සඳහන් වන, ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාව සංශෝධනය කිරීම මගින් ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය මත පදනම්ව වෙනස්කොට සැලකීම තහනම් කිරීම එහි පැහැදිලිව අන්තර්ගත කිරීම.
- ව්‍යවස්ථාවෙන්ම පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම, පිළිගැනීම සම්බන්ධව ක්‍රියාකිරීමට අවශ්‍ය වෙනස්කම් සිදුකිරීම. ඉන්දියාව ඇතුළු තවත් රටවල ව්‍යවස්ථා මෙන්, පෞද්ගලිකත්වය අපගේ ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකමක් නොවේ. LBT පුද්ගලයින් සුලබ වශයෙන් ඔවුන්ගේ කැමැත්තකින් තොරව ''නිරාවරණය''වන අතර, ඒ සඳහා ඔවුන්ට කිසිදු විසඳුමක් නැත. පෞද්ගලිකත්වයට ඇති අයිතිය උල්ලංඝනය කිරීම අන්තර්ජාලය හරහා වර්ධනය වී ඇත.[106]
- ලිංගික නැඹුරුව, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අර්ථකතනය සහ ප්‍රකාශනය මත පදනම් හිංසනයන් පැහැදිලිව හඳුනාගනිමින්, වෙනස්කොට නොසැලකීමේ ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමට, රැකියා ස්ථානයේ වන ලිංගික හිංසනය සම්බන්ධයෙන් එක හා සමාන ප්‍රතිපත්ති ගොඩනැගීමට රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය දිරිමත් කිරීම.
- LBT පුද්ගලයින්ට මුහුණදීමට සිදුවන ගැටලුවලට සංවේදී ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සහ වර්ධනය කිරීමේ අරමුණින්, LBT පුද්ගලයින් සහ අනෙකුත් සුළුතර ලිංගික ප්‍රජාව සමග වැඩකරන සංවිධාන සමග එකතුවීමට ක්‍රියා කිරීම.

106. තවද පෞද්ගලිකත්වය සම්බන්ධව ව්‍යවස්ථා අයිතිවාසිකමක් නොමැතිව, ජාතික ආරක්ෂාව සම්බන්ධ හේතූන් නිසා රජය විසින් සුපරික්ෂාකාරී නිරීක්ෂණ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, පෞද්ගලික ජීවිතවලට බාධා කිරීම සඳහා තාක්ෂණය යොදාගෙන ඇත.

- ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහාය ගැනීමට මාර්ගෝපදේශකයක් වශයෙන් යෝග්‍යකර්තා මූලධර්ම[107] අනුගමනය කිරීම. හිංසනය, වෙනස්කොට සැලකීමට සහ LBT පුද්ගලයින් සාපරාධී පුද්ගලයින් ලෙසට දැකීම පිළිබඳව ක්‍රියා කිරීම සඳහා වන ආසියානු පැසිපික් සංසදයේ නීතිවේදීන්ගේ උපදේශක කවුන්සිලය මගින් දක්වා ඇති නිර්දේශයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මානව හිමිකම් කොමිසමට සම්පත් සැපයීම.
- සවිස්තරාත්මක ලිංගික අධ්‍යාපනික නිර්ණායකවලට අනුව පාසල්වල ලිංගික අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම.

107. (2007) ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සම්බන්ධව ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යොදාගැනීමේ දී ගතහැකි යෝග්‍යකර්තා මූලධර්ම (යෝග්‍යකර්තා මූලධර්ම යනු, ස්ත්‍රී සමලිංගික පුද්ගලයින් සම්බන්ධයෙන්වන මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ අන්තර් ලිංගිකත්වය සම්බන්ධ ගැටළු පිළිබඳ ක්‍රියාකාරීවීමට ජාත්‍යන්තර මානව හිමිකම් නීති ප්‍රමිතීන්වලට අදාලව යොදා ගැනීමට අපේක්ෂිත ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාව සම්බන්ධව ඇති මූලධර්ම පද්ධතියකි. නීතිවේදීන්ගේ ජාත්‍යන්තර කොමිසම, මානව හිමිකම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර සේවය සහ ලෝක මානව හිමිකම් විශේෂඥයන් සමග 2006 වර්ෂයේ දී ඉන්දුනීසියාවේ යෝග්‍යකර්තා නුවර පැවති සමුළුවක දී මෙම මූලධර්ම සමූහය නිර්මාණය කරන ලදී.)

# [ ආශ්‍රිත ග්‍රන්ථ ]

Aizura, Aren, Jenny Walsh, Ash Pike, Roz Ward and Jak (2011) *Gender Questioning: A Joint Project of Trans Melbourne Gender Project*, Gay and Lesbian Health Victoria and Rainbow Network Victoria, Melbourne, Australia.

Ada Derana (Truth First) March 2012 [online] Available from: http://www.adaderana.lk/news.php?nid=17473&mode=beauti

BBC News (2012) Q & A Post War Sri Lanka, 13 November 2012. Available online at: http://www.bbc.co.uk/news/world-south-asia-11393458

Bastians, Dharisha (2013) Bodhu Bala Sena Wants Law Changed to Permit a Sinhalese Man to Marry Five Wives to Propagate the Sinhala Race, 23 January 2013, www.dbsjeyaraj.com Available online at: http://dbsjeyaraj.com/dbsj/archives/15219

**Bellanvila Sudaththa Thero and Dunne, C. J., (2007) Homosexuality, Buddhism and Sri Lankan Society, Groundviews 28 August 2007: Colombo [online] Available from:** http://groundviews.org/2007/08/28/homosexuality-buddhism-and-sri-lankan-society/

Bruce-Jones E., & Itaborahy L., (2011) *State Sponsored Homophobia: A World Survey of Laws Criminalizing Same Sex Sexual Activity between Consenting Adults*, An ILGA Report, The International Lesbian, Gay, Bisexual, Trans and Intersex Organization.

Colombage, Dinouk (2013) Bodu Bala Sena: A Threat to Sri Lanka's Future, Groundviews, 19 March 2013, Colombo, Sri Lanka. Available online at: http://groundviews.org/2013/03/19/bodu-bala-sena-a-threat-to-sri-lankas-future/

Daily Mirror, Two men fined for gross indecency, 16 November 2012, Sri Lanka. Available online at: http://www.dailymirror.lk/news/23546-two-men-fined-for-gross-indecency-.html

Fernando, M. (2008) 'Vagrant Voices', *Himal South Asia, Vol. 21 (3),* Available online at:

http://www.himalmag.com/Vagrant-voices_nw2138.html

Gunasekara, Tisaranee (2013) The Muslims are the new Tamils, Lanka Standard, 27 Jauary 2013, Colombo, Sri Lanka. Available online at: http://www.lankastandard.com/2013/01/the-muslims-are-the-new-tamils/

Human Rights Watch (2011) Sri Lanka: Report Fails to Advance Accountability, 16 December 2011, New York. Available online at: http://www.hrw.org/news/2011/12/16/sri-lanka-report-fails-advance-accountability

Human Rights Watch (2008) *This Alien Legacy: The Origins of "Sodomy" Laws in British Colonialism*. www.hrw.org/sites/default/files/reports/lgbt1208_webwcover.pdf.

Human Rights Commission of Sri Lanka Act No. 21 of 1996

Ingram, Gordon Brent, Anne-Marie Bouthilette, Yolanda Retter (Eds) (1997). Queers in Space: Communities / Public Places / Sites of Resistance, Bay Press, USA.

Law and Society Trust (2010) Sri Lanka Atrophy and Subversion of the Human Rights Commission, ANNI Report on the Performance and Establishment of National Human Rights Institutions in Asia, Law and Society Trust: Colombo.

Miller, J and Nichols, A (2012) Identity, sexuality and commercial sex among Sri Lankan nachchi. Sexualities, Special Section, 15 (5/6) pp.554 – 569, Sage Publications, Available online at: DOI: 10.1177/1363460712446120

Nichols, Andrea (2010) Dance Ponnaya, Dance! Police Abuses Against Transgender Sex Workers in Sri Lanka, *Feminist Criminology* 2010 5: 195, Sage Publications, Available online at: http://fcx.sagepub.com/content/5/2/195

*The Sunday Leader,* "Don't Abandon the Gay Men", 6 June 2010.

Rubinstein, Ruth (1995) *Dress Codes: Meanings and Messages in American Culture*. Boulder: Westview Press.

Raghavan, Suren (2013) Bodu Bala Sena and Buddhism's Militant Face in Sri Lanka, Groundviews, 15 January 2013, Colombo Sri Lanka. Available online at: http://groundviews.org/2013/01/15/bodu-bala-sena-and-buddhisms-militant-face-in-sri-lanka/

Section 10 (d) Human Rights Commission of Sri Lanka Act No. 21 of 1996

Section 365A, Sri Lanka Penal Code (Amendment) Act No.22 of 1995, 31 October 1995

Section 399, Cheating by Personation, Sri Lanka Penal Code 1883

Tambiah, Y. (2004) (Im)moral Citizens: Sexuality and the Penal Code in Sri Lanka. In A.J. Canagaratna (Ed.), Neelan Tiruchelvam Commemoration Conference Papers (pp. 107 – 141) Colombo, ICES

Tambiah, Y. (2003 May). Man-made Laws and Feminine Feelings: A ‘Lesbian' EncouvÙ³g;Òü‘ù£ä—ó‰ùtú

# [ උප ග්‍රන්ථ ]

# උප ග්‍රන්ථ A : පුද්ගල තොරතුරු

ස්ත්‍රී සමලිංගික, ද්වීලිංගික සහ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයන් සමග පැවැත්වූ ගුණාත්මක සම්මුඛ සාකච්ඡා 33 කින් උපුටා ගන්නා ලද දෙදෙනෙකුගේ විස්තර ඇතුළත් තොරතුරු පහත දැක්වේ.

## චරිත සටහන 1 : ක්‍රිස්ටි

මහනුවර දී උපත ලැබූ 28 හැවිරිදි ක්‍රිස්ටි, දැනට ඇයගේ සහකාරිය සමග කොළඹ වාසය කරයි. ජාතියෙන් සිංහල වන ඇය රෝමානු කතෝලික පවුලක උපත ලබා ඇති අතර, 'කලාතුරකින් පල්ලියට යන අතර 'ඇයගේ විදියට' ආගම අදහනු ලබයි. ඇය දැනට කොළඹ පෞද්ගලික සමාගමක පාරිභෝගික සත්කාරක විධායක නිලධාරිනියක ලෙස සේවය කරනු ලැබේ. ඇය හඳුනාගෙන සිටින ආකාරයට ඇගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාව 75% ක් ස්ත්‍රී වන අතර 25% ක් පිරිමි ගති ඇති කාන්තාවකගේ වේ. ඇයගේ ලිංගික නැඹුරුව විග්‍රහ කිරීමට නිශ්චිත පදයක් භාවිතා කිරීමට නොකැමැති නමුත් ඇය කියා සිටින්නේ ''පුරුෂයකු සමඟ සිටිනවාට වඩා කාන්තාවක සමඟ සිටීම, මට 100% ක් සතුට ගෙනදෙන්නක්'' බවයි.

අවුරුදු 4 කට පෙර, ක්‍රිස්ටි 24 හැවිරිදි වියේ පසු වූ විට ඇය ලිංගික සහකරුවකු වශයෙන් පිරිමින්ට වඩා ගැහැණුන්ට කැමති බව ඇයගේ සහෝදරයාට පවසා ඇත. මුල් අවස්ථාවේ දී ඔහු මෙය එතරම් ගණන් නොගත් අතර, ඒ පිළිබඳව කතා කිරීමට අකමැති විය. නමුත් කල්යත්ම ඇගේ මව්පියන් ඇයව බලෙන් විවාහකරදීමට සැරසුන විට ඔහු (ඇගේ සහෝදරයා) 'ඇයගේ කැමැත්තක්' යැයි කියා ඇති අතර ඇයගේ තෝරාගැනීම්වලට සහාය දක්වා තිබේ. අවුරුදු 21 දී ක්‍රිස්ටි ඇය පිළිබඳව ඇයගේ නැන්දාට හෙළිකරන ලද අවස්ථාවේ දී නොසිතූ අවස්ථාවකට ඇයට මුහුණදීමට සිදුව ඇත. ක්‍රිස්ටිගේ තෝරාගැනීමට සහාය දක්වනවා වෙනුවට, නැන්දණිය ඇයට ලිංගික කැමැත්තක් දක්වූවාය. මෙම සිදුවීමෙන් අවුරුදු කිහිපයකට පසු, ක්‍රිස්ටි ට පිරිමි යහළුවෙකු වෙනුවට ගැහැණු යහළුවකු සිටින බව ඇයගේ මාමා දැනගත් විට, ඔහු ඇයට බලෙන් අසභ්‍ය චිත්‍රපට පෙන්වීමට උත්සාහ

දුරූ අතර, නපුරු වචන යොදමින් ඇයගේ ෆේස් බුක් පිටුව ඔස්සේ ඇය වෙත තර්ජන එල්ලකොට තිබේ.

මෙම ශාරීරික, ලිංගික සහ මානසික සහ චිත්තවේගික හිංසන අත්දැකීම්වලට අමතරව, ක්‍රිස්ටිගේ පැරණි පෙම්වතා විසින් ඇය කාන්තාවන් සමග තිබූ පෙර සම්බන්ධකම් පිළිබඳව දැනගත් පසුව ඇයට නිරන්තරයෙන් ලිංගිකව එක්වීමට බලකරන ලද අතර, ඇය තල්ලු කිරීම සහ බෙල්ල මිරිකීම වැනි ක්‍රියා මගින් ද ශාරීරික සහ ලිංගික හිංසනයට ලක්කරන ලදී. රැකියා ස්ථානයේ දී, ඇයගේ පැරණි ප්‍රධාන විධායක නිලධාරියා ඇයගෙන් ''ඇයගේ ලිංගික ඉන්ද්‍රියන්'' කෙසේ පිහිටා ඇත් ද සහ ඇය, ඇයගේ පෙම්වතිය සමග ලිංගික ක්‍රියාකාරකම්වල යෙදෙන අයුරු ඔහුට 'බැලීමට' හෝ එයට 'සහභාගිවීමට' පුළුවන් ද වැනි කරුණු අසා ඇයට අසභ්‍ය කෙටි පණිවිඩ (SMS) එවීම මගින් ඇයට නිරන්තරයෙන් හිරිහැර කරන ලදී. මෙම ශාරීරික, ලිංගික, චිත්තවේගික හිංසනයන් හි ප්‍රතිඵලයක් ලෙසට, ඇය තමාගේම ශරීරය කපාගැනීම, සිගරට් කොටවලින් පුච්චා ගැනීම වැනි තමාටම හානිකරගැනීමේ ක්‍රියා කිරීමට උත්සාහ දරා ඇත. ඇය කියන අන්දමට අදටත්, 'දැඩි අපහසු' අවස්ථාවල දී ඇයට සියදිවි හානිකර ගැනීමට සිතෙන අතර, ඇයගේ නැන්දා සහ මාමා සමග ඇයට ඇති හිංසන අත්දැකීම් නිසා ඒ ගැන කතා කිරීමට තරම් කිසිවකු විශ්වාස කළ නොහැකි තත්ත්වයක් ඇය වෙත පවතී.

## චරිත සටහන 2 : චමිලා

36 හැවිරිදි තනිකඩ පුද්ගලයකු වන චමිලා කොළඹ නගරයට නුදුරින් ඇයගේ දෙමාපියන් සමඟ වාසය කරයි. ඇය සිංහල බෞද්ධ වන අතර, තෘතීක අධ්‍යාපනය සම්පූර්ණකර ඇත. ඇය රාජ්‍ය ආරක්ෂක අංශයේ රැකියාවක නියුතු අතර, මසකට රුපියල් 27,500 කට අඩු ආදායමක් ලබයි.

චමිලා, බුච් සමලිංගික කාන්තාවක ලෙස තමාව හඳුනාගනී. ඇය, කාන්තාවන්ට කැමැත්තක් දක්වීමත් සමඟ ඇය අවුරුදු 22 දී තමා සමලිංගික ස්ත්‍රියක් බවට දැනගත්තා ය. ඇයට එක් කාන්තාවක් සමඟ සමීප සම්බන්ධතාවයක් තිබුණු අතර, අවුරුද්දකට පසු එය ලිංගික අත්දැකීමක් දක්වා වර්ධනය විය. ඇයට අවුරුදු 25 ක් වනවිට ඇයගේ ලිංගික නැඹුරුව පිළිබඳව ඇය තෝරාගත් යහළුවන් කිහිපදෙනෙකුට සහ ඇයගේ ප්‍රධානියාට පැවසුවාය.

ඇයගෙන් හදිසියේ වෙන්වුන පෙම්වතිය ඇයගේ නිවස ඉදිරිපිට දී කළ කලබගෑනියකින් පසුව චමිලාගේ ලිංගිකත්වය සහ ඔවුන්ගේ සම්බන්ධතාවය පිළිබඳව අසල්වැසියන් දැනගත් අතර, ඇය සමාජයට නිරාවරණය විය. ඇයගේ පවුලේ උදවිය මෙම සිදුවීමෙන් විශාල ලෙස කලබල වූ අතර, චමිලාට පියාගෙන් ගුටිකෑමට පවා සිදුවිය. චමිලාගේ හිසේ කැක්කුමට ප්‍රතිකාර කරන මුවාවෙන් ඇයගේ මව විසින් ඇය මනෝ වෛද්‍යවරයකු වෙතට කැඳවාගෙන යන ලදී. මීට අමතරව චමිලාට අවුරුදු 30 ක් වන විට ඇය සමීපතම සහකාරියගේ හිංසනයට ලක් විය. ඇයට රැකියා ස්ථානයේ දී ලිංගික අතවර සිදු වී තිබේ. ඇය වෙනස්කොට සැලකීම්වලට ද ලක් වී ඇති නමුත් ඒ පිළිබඳව කෙදිනකදීවත් පැමිණිල්ලක් ඉදිරිපත්කොට නැත්තේ නීතියෙන් ආරක්ෂාව ලැබීම සම්බන්ධයෙන් ඇය තුළ සැකයක් පවතින නිසා ය. ක්‍රීඩා කණ්ඩායම්වලට ඇය තෝරාගෙන නැති අතර, දෙවතාවක් ජ්‍යෙෂ්ඨයන් ඇයගේ කාර්යාලයට පැමිණ ඔවුන්ගේ බිරියන් සහ ගැහැණු යහළුවන් සමග ලිංගික ක්‍රියාකාරකම්වල යෙදෙන ලෙසට බල කර ඇත. ඇය සමග එකට සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨයකු, තමන් සමග ලිංගිකව හැසිරෙන ලෙසට ඇයට කියා ඇත. රැකියා ස්ථානයේ දී ඇයට, ඇයගේ ජ්‍යෙෂ්ඨයන්ගේ උසුළු විසුළුවලට ලක්වීමට සිදු වී තිබේ. LBT පුද්ගලයින් සමග වැඩකරන සංවිධානවලින් සහ රැකියාවේ නියුතු යහළුවන්ගෙන් චමිලා සහාය පතයි.

# උප ග්‍රන්ථ B : පාරිභාෂිත වචන මාලාව

**ආප්ප :** ස්ත්‍රී සමලිංගිකයින් සඳහා යොදන අපහාසාත්මක පදයකි.

**ද්වි ලිංගික (Bisexual)** : තමන්ගේ ම සහ විරුද්ධ ලිංගිකයන්ට සිතින් සහ/හෝ ලිංගික වශයෙන් කැමති අය.

**බුච් (Butch) :** පුරුෂ සමලිංගික ස්ත්‍රියකි. පුරුෂ හැසිරීම්, පුරුෂ ඇඳුම් සහ/හෝ කොණ්ඩ මෝස්තර තුළින් ඇයගේ පුරුෂභාවය ප්‍රකාශ කිරීමට හැකිවේ. ඇයගේ ගැහැණු ශරීරය සහ කාන්තාවක ලෙසින් ඇයට ඇති අනන්‍යතාවයට ඇය කැමැති ය.

**සිස්ජෙන්ඩර් (Cisgender) :** සිස්ජෙන්ඩර් පුද්ගලයෙකු යනු උත්පත්තියෙන්ම හිමිකරගන්නා ලද ස්ත්‍රී–පුරුෂ සමාජභාවී ලිංගිකත්වය සමග තමන් හඳුන්වා ගන්නා පුදගලයෙකි.

**ෆෙම් (Femme)** : කාන්තා සමලිංගිකයෙකි. රූපලාවන්‍ය භාණ්ඩ භාවිතය මගින් අඩි උස සපත්තු සහ ගවුම් මගින් ඇයගේ ගැහැණුකම අර්ථකතනය සහ ප්‍රකාශනය කිරීමට හෝ නොකිරීමට පුලුවන. ඇය මිහිරිව සහ හඬ නොනගා කතා කරන හෝ විවෘතව ඉතා රළු අයුරින් කතා කරනු ලබන පුද්ගලයෙකු විය හැකිය. ඇයට ඇති ගැහැණු ශරීරය සහ ස්ත්‍රියක ලෙසින් ඇයට ඇති අනන්‍යතාවයට ඇය ද කැමැතිය.

**පුරුෂ සමලිංගික (Gay)**: තමන්ගේම ලිංගිකයන්ට සිතින් සහ/හෝ ලිංගික වශයෙන් ආකර්ශනයක් දක්වන අය. සියළුදෙනා ඇතුළත්වන පදයක් වුවත් මෙය ප්‍රධාන වශයෙන් පුරුෂයන් සම්බන්ධයෙන් යෙදෙන්නකි.

**ස්ත්‍රී-පුරුෂ සමාජභාවය (Gender)** : යම් හැසිරීම්, චරිත ලක්ෂණ සහ ස්ත්‍රීභාවීය හෝ පුරුෂභාවීය වශයෙන් සමාජමය ලෙස වර්ග කිරීම; මෙය සමාජය විසින් නිර්මාණය කරන ලද සංකල්පයකි. විවිධ සංස්කෘතීන්ට අනුව ස්ත්‍රීභාවීය වන්නේ කුමන හැසිරීම් ද, පුරුෂභාවීය වන්නේ කුමන හැසිරීම් ද යන කරුණු වෙනස් වියහැකි නමුත්, ජීවිතයේ සෑම අංශයකම කෙනෙකු හැසිරිය යුතු ආකාරය සම්බන්ධයෙන් යම් සීමාවන් හා රීතීන් මෙ මගින් පනවනු ලැබේ.

**ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය යුගලය (Gender Binary) :** ස්ත්‍රී-පුරුෂ බව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය, ස්ත්‍රීභාවීය සහ පුරුෂභාවීය ලෙස වෙනස් භාණ්ඩ දෙකකට වර්ගීකරණය කිරීමයි. බොහෝ සමාජයන් විසින්, පුද්ගලයින් මෙම නිශ්චිත භාණ්ඩ දෙකට වර්ග කරනු ලබන අතර, එමගින් මෙම භාණ්ඩ දෙකට නොගැලපෙන පුද්ගලයින් අතහැරීමක් සිදු වේ.

**ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය Gender Identity) :** තමාට උපතින් ලබාදෙන ලද ලිංගය සමග ගැලපිය හැකි හෝ නොහැකි, කෙනෙකු තුළ වන්නා වූ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ අභ්‍යන්තර සහ පෞද්ගලික අත්දැකීමයි. මෙයට ශරීරය පිළිබඳ සිය හැඟීම් ද ඇතුළත් වේ. (නිදහසේ තෝරා ගැනෙයි නම්, වෛද්‍ය ක්‍රම, ශල්‍යකර්ම ආදිය මගින් වුව ශරීරයේ පෙනුම සහ/හෝ ක්‍රියාකාරිත්වය වෙනස් කිරීම ද මෙයට ඇතුළත් වියහැකිය.) ඇඳුම, කතා බහ සහ හැසිරීම් මගින් ද ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය ප්‍රකාශ කළ හැකිය.

**ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අර්ථකතනය සහ ප්‍රකාශනය (Gender Expression) :** තම ස්ත්‍රීභාවයේ හෝ පුරුෂභාවයේ බාහිර අර්ථකතනය සහ ප්‍රකාශනයයි. මෙය ස්ත්‍රීත්වය හෝ පුරුෂත්වය හෝ ප්‍රකාශ කරන, නැත්නම් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය නියමයන් ට අභියෝග කරන ආකාරයෙන් ම තම ඇඳුම, පෙනුම, හැසිරීම, කතා රටාව, ගති ලක්ෂණ හරහා සිදු කළහැකිය. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අර්ථකතනය සහ ප්‍රකාශනය හරහා කෙනෙකුගේ ලිංගික නැඹුරුව හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය පිළිබඳ උපකල්පනයන් ගොඩනගා ගත නොහැක.

**විෂම ලිංගික සම්මතයන් (Heteronormativity) :** සියළුම පුද්ගලයින්, ස්ත්‍රී-පුරුෂ සමාජභාව දෙකෙන් (උදා: පුරුෂ හෝ ස්ත්‍රී) එකකට වැටෙන බව සහ පිරිමි සහ ගැහැණු විසින් අනුගමනය කළයුතු නිශ්චිත කාර්යභාරයන් ඇති බවත්, විෂම ලිංගිකත්වය (උදා: විරුද්ධ ලිංගිකයන්ට/ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට ඇති ආකර්ෂණය) යනු එකම ''සාමාන්‍ය ලිංගිකත්වය'' යන බව අදහස් කරන ආකල්පයකි.

**විෂම ලිංගිකත්වය (Heterosexism)** :ලිංගික ආශාව, සමීපතාවය සහ පවුල් ජීවිතය ප්‍රකාශ කිරීම සඳහා ඇති එකම 'සාමාන්‍ය' සහ නීත්‍යානුකූල ප්‍රකාශනය බව හැඟීන්වීමට යොදාගැනේ.

**විෂම ලිංගික (Heterosexual) :** විරුද්ධ ලිංගිකයන්ට ලිංගිකව, අධ්‍යාත්මයෙන් සහ/හෝ ප්‍රේමයෙන් ආකර්ශණයක් ඇති අය.

**සමලිංගික (Homosexual) :** තමන්ගේම ලිංගිකයින්ට, ලිංගිකව, අධ්‍යාත්මයෙන් සහ/හෝ ප්‍රේමයෙන් ආකර්ශණයක් ඇති අය.

**සමලිංගිකත්වයට එරෙහි භීතිකාව (Homophobia)**:
සමලිංගිකත්වයට එරෙහිව ඇති සහේතුක බිය, වෛරය හෝ අගතිගාමිත්වය.

**අන්තර්ලිංගික (Intersex) :** උත්පත්තියේදී ස්ත්‍රී සහ පුරුෂ ලිංගික සහ ප්‍රජනන අවයව සම්මිශ්‍රණයක් ඇතිව උපත ලබන කෙනෙක්. බොහෝවිට අන්තර් ලිංගික පුද්ගලයන්ට ස්ත්‍රී සහ පුරුෂ ලිංගයන්හි ජීව විද්‍යාත්මක චරිත ලක්ෂණ ඇත. පිරිමි ශරීරයක්, ගැහැණු ශරීරයකින් වෙනස්වීමේදී ක්‍රෝමසෝන, හෝමෝන වෙනස්කම් සහ ලිංගික අවයවවල තත්වයන් හි විශාල විවිධත්වයක් අන්තර්ලිංගිකත්ව වර්ගවලදී විග්‍රහ වේ. අන්තර් ලිංගික විවිධත්වයන් උපතේදී හෝ පසුව වර්ධනයවීම මගින් දැකිය හැක. "අන්තර්ලිංගික" යන පදය 'නපුංසක' යන පදයට සමාන පදයක් වන අතර එය අපහාසාත්මක සහ/හෝ ආචාරශීලී නොවන පදයක් පහත්කොට සලකන පදයක් ලෙසට සැලකේ.

**LGBTIQ :** ස්ත්‍රී සහ පුරුෂ සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්ති ලිංගික, අන්තර් ලිංගික, ලිංගිකත්වය ප්‍රශ්න කරන්නන් සහ තමන්ගේම ලිංගික සහ ස්ත්‍රී - පුරුෂ අනන්‍යතාවය ප්‍රශ්න කරන අය හඳුන්වාදීමට භාවිතා කරන කෙටි පදයකි. (දැනට වැඩි වී ඇති අනන්‍යතා බාණ්ඩයන්ට අනුව මෙම පදය LGBBHHTTQQI දක්වා විකාශනය වෙමින්, ස්ත්‍රී සමලිංගක, පිරිමි සමලිංගික, ද්වී ලිංගික, ද්වි ලිංගිකවීමට කුතුහලයක් දක්වන, විෂම ලිංගික, සමලිංගික, ට්‍රාන්ස් පුද්ගලයින්, සංක්‍රාන්ති ලිංගික.

**ස්ත්‍රී සමලිංගික (Lesbian) :** භාවමය වශයෙන් සහ/හෝ ශාරීරික වශයෙන් සිය කැමැත්ත වෙනත් ස්ත්‍රියක් වෙත ප්‍රකාශ කරන ස්ත්‍රියක්.

**විෂම ලිංගික සම්මතයට පටහැනි කාන්තාවන්/පිරිමි (Non-heteronormative women/men):** විෂම ලිංගිකත්ව සහ විෂම ලිංගිකත්ව රාමුවෙන් බාහිරව ජීවත්වීමට කැමති කාන්තාවන්/පිරිමින් හඳුන්වාදීමට භාවිතා කරන පදයකි.

**පොන්නයා:** සමලිංගික පුරුෂ/පිරිමි ගති නැති පුද්ගලයකු හැඳින්වීමට භාවිතා කරන අපහාසාත්මක සිංහල යෙදුමකි. "මෙම යෙදුමට විවිධ අර්ථකතන ඇති අතර ශ්‍රී ලංකාවේ පිරිමි බව තීරණය කරන ආධිපත්‍යයික සම්මතයන්වලට අනුකූල නොවන පිරිමින්, අවඥාවෙන් හඳුන්වා දීමට ද භාවිතා කෙරේ. අනාචාර ගැහැණියකගේ සැමියෙකු, තමන්ගේ පවුල බලාගැනීමට නොහැකි පිරිමියෙකු, පිරිමි ගති නැති පුරුෂයකු, පිරිමින්ට ලිංගික කැමැත්තක් දක්වන පිරිමින්" (මිලර් සහ නිකොලා, 2012:557)

**Queer:** පවතින ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සහ/හෝ ලිංගික ආකල්ප අතික්‍රමණය කරන පුද්ගලයා. මෙම යෙදුම විෂම ලිංගික සම්මතයන්ගෙන් බාහිරව ජීවත්වන විෂම ලිංගික පුද්ගලයින්ට මෙන්ම ස්ත්‍රී සහ පුරුෂ සමලිංගික, ද්විලිංගික, ට්‍රාන්ස් පුද්ගලයින් සහ අන්තර් ලිංගික පුද්ගලයන් හැඳින්වීමටද භාවිතා කෙරේ. තමන්ගේ ස්ත්‍රී පුරුෂබව සහ අනන්‍යතාවය ප්‍රශ්න කරන අය, ලිංගිකත්වය ප්‍රශ්න කරන්නන් සහ අන්තර්ලිංගික පුද්ගලයින් හඳුන්වා දීමට ද භාවිතා කරනු ලැබේ,

**ලිංගය (Sex) :**
ශරීරයෙන් ස්ත්‍රී හෝ පුරුෂ ලෙස වර්ග කිරීමයි. උත්පත්තියේදී බිළිඳන්ට ලිංගයක් නියම කරන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගෙන සමාජය විසින් පිළිගන්නා වූ යම් ජීව විද්‍යාත්මක ලක්ෂණ මතය. මේ ලක්ෂණ අතරට ක්‍රෝමසෝම, හෝමෝන, අභ්‍යන්තර ප්‍රජනන අවයව සහ ලිංගික අවයව අතුළත් වේ.

**ලිංගික නැඹුරුව (Sexual Orientation):** තමන්ගේ ලිංගයට/සමාජභාවයට හෝ ඊට විරුද්ධ වූ ලිංගයට/සමාජභාවයට හෝ විවිධ වූ ලිංගයන්ට/සමාජභාවයන් ට හෝ අයත් කෙනෙකු පිළිබඳව

හටගන්නා වූ දැඩි භාවමය ලිංගික ආකර්ෂණයට හැමකෙනෙකු තුළ ඇති ශක්‍යභාවය; මෙය අතිශයින් සමීපතර සහ ලිංගික සම්බන්ධතාවයක් දක්වා ව්‍යාප්ත විය හැකිය.

**ට්‍රාන්ස් පුද්ගලයින් (Trans gender) :** පොදුවේ උපතින් තමාට ලබාදෙන ලිංගයට සහ සාමාන්‍යයෙන් බැඳුනු හැසිරීම් හා අනන්‍යතා ප්‍රකාශයන්ට වෙනස් වූ, හැසිරීම් අනන්‍යතා ප්‍රකාශනයන් ප්‍රදර්ශනය කරන අය සඳහා භාවිතා කරන පොදු පදයකි. මේ පිරිස අතර විරුද්ධ ලිංගයේ ඇඳුම් අඳින පිරිස්, එක් ලිංගික අනන්‍යතාවයකින් වෙනත් ලිංගික අනන්‍යතාවයක් කරා පරිවර්තනය වෙමින් සිටින පිරිස් සහ පිළිගත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය රටාවන් අභියෝග කරන පිරිස් විය හැකිය. ට්‍රාන්ස් පුද්ගලයින්ගේ ලිංගික කැමැත්ත අනුව ඔවුන් ස්ත්‍රී සමලිංගික හෝ පුරුෂ සමලිංගික හෝ ද්විලිංගික හෝ විෂම ලිංගික විය හැකිය. බටහිර සමාජයන්හි භාවිතා කරන 'සංක්‍රාන්ති ලිංගික' යන යෙදුමට අනෙකුත් බොහෝ රටවල ඇත්තේ සීමිත ප්‍රතිනාදයකි. සංක්‍රාන්ති ලිංගිකයන් ලිංගික ආශාව හා සමීපතාවය ආදිය ප්‍රකාශ කරන්නේ අතිශයින් සංකීර්ණ බහුවිධ සහ පිළිගත් රටාවන්ට අභියෝග කරන අන්දමටයි. උදාහරණයක් ලෙස, නේපාලයේ 'මෙති' (Meti), පකිස්ථානයේ 'සනානා' (Zanana), ආජන්ටිනාවේ 'ට්‍රැවස්ටි' (Travesti) ආදී පදවලින් හඳුන්වන පිරිස්, ස්ත්‍රී ස්වභාවයන් විවිධාකාරයෙන් වැළඳගත් පිරිමින් ය. ඔවුහු සැත්තකම් ආදිය මගින් සිය ශරීරය වෙනස් කිරීමට කල්පනා නොකරති. ඉන්දියාවේ හිජ්රා (Hijra) ප්‍රජාව අතර, සමහරවිට සිය පුරුෂ ලිංගික අවයව සැත්කමකින් ඉවත් කොට දැමූ හෝ නොදැමූ අය සමලිංගික නොවන පුරුෂයන් සමග ලිංගිකව හැසිරේ. සමහර සංස්කෘතීන්, සංක්‍රාන්ති ලිංගිකයින්ව හැඳින්වීමේ දී තුන්වන ලිංගය (Third Sex) හෝ තුන්වන ලිංගික සමාජභාවය (Third Gender) ලෙස හැඳින්වීමට කැමැත්තක් දක්වනු ලැබේ. ශ්‍රී ලංකාවේ, නාච්චි ලෙසට හඳුන්වන්නන්ට "සංක්‍රාන්ති ලිංගික සහ සමලිංගික පුද්ගලයන් දෙවර්ගයම අයත් වේ; ඔවුන් ස්ත්‍රීභාවීය සමාජභාවයන් අනුගමනය කරන නමුත් ඔවුන්ගේ ප්‍රධාන 'පුරුෂ' ලක්ෂණ කිසිවක් අත්හැරීමට ආශාවක් නොදක්වන අතර, පිරිමින් සම්බන්ධයෙන් ඔවුන්ට නොසැලෙන දැඩි ලිංගික ආශාවක් ද ඇත." (මිලර් සහ නිකොලා, 2012:555)

**ට්‍රාන්ස් (Trans*) තාරකා ලකුණ සහිතව :** ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවලියේ ඇති සියලුම අනන්‍යතාවන් හැඳින්වීමට යෙදෙන පොදු යෙදුමකි. මෙයින් ලිංගික සහ සමාජභාවීය අත්දැකීම් විශාල ප්‍රමාණයක් හැඳින්විය හැකඃ ට්‍රාන්ස් පුද්ගලයින්, සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින්, සමාජභාවීය ආකල්ප ප්‍රශ්න කරන පුද්ගලයින්.

**ට්‍රාන්ස් පුරුෂයා (ස්ත්‍රී සිට පුරුෂ කරා) (Transgender Man (Female-to-Male/FTM) :** උපතින් ස්ත්‍රී ලිංගය හිමිකරගත්, එහෙත් පුරුෂ හෝ පුරුෂභාවීය අනන්‍යතාවයක් ප්‍රකාශ කරන සහ ගැහැණු ළමයකු ලෙසට හැදී වැඩුණු හෝ නොවැඩුණු පුද්ගලයකු Transman, FTM හෝ F2M ලෙසට ද හඳුන්වනු ලැබේ.

**ට්‍රාන්ස් ස්ත්‍රිය - ට්‍රාන්ස් (පුරුෂ සිට ස්ත්‍රී කරා) (Transgender Woman (Male-to-Female/MTF) :** උපතින් පුරුෂ ලිංගය හිමිකරගත්. එහෙත් ස්ත්‍රී හෝ ස්ත්‍රීභාවීය අනන්‍යතාවයක් ප්‍රකාශ කරන සහ පිරිමි ළමයකු ලෙසට හැදී වැඩුණු හෝ නොවැඩුණු පුද්ගලයකු. (Transwoman, MTF හෝ M2F ලෙසට ද හඳුන්වනු ලැබේ.

**ට්‍රාන්ස් පුද්ගලයන්ට එරෙහි භීතිකාව (Transphobia) : ට්‍රාන්ස්** පුද්ගලයන්ට හෝ සංක්‍රාන්ති තත්ත්වයක සිටින ඕනෑම පුද්ගලයකුට එරෙහිව ඇති බිය හෝ අගතිගාමී තත්ත්වය. මෙම භීතිකාවට, ප්‍රචණ්ඩත්වය, හිරිහැර සහ වෙනස්කොට සැලකීම මෙන්ම සෑම කෙනෙකුම පිරිමි හෝ ගැහැණු විය යුතුයි යන පොදු පිළිගැනීම අයත් විය හැකිය. සාමාන්‍ය ජීවිතයේ ක්‍රියාකාරකම්වලට ද මෙම භීතිකාව ඇතුළත් විය හැකිය. උදාහරණයක් ලෙසට පිරිමින්ට පමණක් හෝ ගැහැණුන්ට පමණක් ඇති වැසිකිළි පාවිච්චි කිරීමට බලකිරීම හෝ නිරන්තරයෙන් පත්‍රිකා පිරවීමේ දී 'පුරුෂ' හෝ 'ස්ත්‍රී' බව ලකුණු කිරීමට සිදුවීම, සමලිංගිකයන්ට එරෙහි භීතිකාව ද මේ හා සමාන වන නමුත් එය විෂමලිංගික බවෙන් පිටත සිටින්නන් ඉලක්ක කරගනී.

**සංක්‍රාන්ති ලිංගික (Transsexual) :** උපතේ දී ලබාදෙන ලද ලිංගයට වෙනස් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවයක් ඇති පුද්ගලයින් හැඳින්වීමට භාවිතා කරනු ලැබේ. බොහෝ විට සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින් ඔවුන්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සමග පෑහීම සඳහා ඔවුන්ගේ ශරීර හෝමෝන හෝ ශල්‍යකර්ම මගින් වෙනස් කරනු ලබන හෝ වෙනස් කිරීමට කැමති අය වේ.

**සංක්‍රාන්තිය (Transition) :** ඇඳුමෙහි ස්වරූපය වෙනස් කිරීම, අළුත් නමක් තෝරා ගැනීම සහ නිවැරදි සර්ව නාමය භාවිතා කරන ලෙසට මිනිසුන්ගෙන් ඉල්ලා සිටීම, සංක්‍රාන්තියට අයත් වේ. මෙයට හෝමෝන ප්‍රතිකාරය, උපදේශනය හා/හෝ ශල්‍යකර්ම වැනි වෛද්‍ය ප්‍රතිකාර ඇතුළත් හෝ ඇතුළත් නොවිය හැකිය.

**විරුද්ධ ලිංගිකයින්ගේ ඇඳුම් ඇඳීමට ප්‍රිය කරන පුද්ගලයින් (Transvestite) :** විරුද්ධ ලිංගිකයින්ගේ ඇඳුම් ඇඳීමෙන් ලිංගික සතුටක් ලබන පුද්ගලයෙකු, බොහෝවිට පිරිමියෙකු හැඳින්වීමට යොදා ගැනේ. මෙම පුද්ගලයින්, අනෙකුත් අය මෙන්ම පුරුෂ සමලිංගික, ස්ත්‍රී සමලිංගික, ද්විලිංගික, විෂම ලිංගික, තමන්ගේ ලිංගික අනන්‍යතාවය ප්‍රශ්න කරන හෝ වෙන කෙනෙකු හෝ විය හැකිය.

# ආ. උපග්‍රන්ථය C : ලිංගිකත්වය සම්බන්ධ සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය වාර්තා සංරක්ෂිතය (1993 - 2013)

**(+) ධනාත්මක ලිපි හැඳින්වේ.**

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| **ඉංග්‍රීසි මාධ්‍ය (1999 - 2013)** | | | |
| සම ලිංගික භීතිකාව ගැන | 2013.09.07 | Gay star news (ගේ ස්ටාර් නිව්ස්) | ශ්‍රී ලංකාව විධිමත් ලෙසට පුරුෂ සමලිංගිකයන් ඉලක්ක කරයි. http:/www.gaystarnews.com/article/sri-lanka-begins-%E2%80%98systematic-targeting%E2%80%99-g ays070913 |
| පොදු | 2012.11.20 | Daily Mirror (ඩේලි මිරර්) | ගණිකා වෘත්තිය නීතිගත කිරීම - පළාත් සභා සභාපති http://www.dailymirror.lk/news/23626-legalize-prostitution-provincial-councillor.html |
| පුරුෂ සමලිංගික | 2012.11.16 | Daily Mirror | බරපතල අසභ්‍යතාව සම්බන්ධයෙන් පුද්ගලයන් දෙදෙනෙකුට දඩ. http://www.dailymirror.lk/news/23546-two-men-fined-for-gross-indecency-.html |
| පුරුෂ සමලිංගික | 2012.11.14 | Daily Mirror | නුගේගොඩ දී සමලිංගික නිවාසයක් යැයි සැක කරන ස්ථානයක් වටලයි. http://www.dailymirror.lk/news/22679-alleged-gay-brothel-raided-in-nugegoda.html |
| පොදු | 2012.01.29 | Sunday Times (සන්ඩේ ටයිම්ස්) | දිනපතා ළමුන් 3-5 අතර සංඛ්‍යාවක් දූෂණය වේ. http://www.sundaytimes.lk/120129/News/nws_12.html |

108. මෙය පරිපූර්ණ ලැයිස්තුවක් නොවන බව කරුණාවෙන් සලකන්න. 1999 වර්ෂයේ සංවිධානය පටන්ගත් දා සිට, ශ්‍රී ලංකාවේ කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ලිංගිකත්වය සම්බන්ධව පළවන (විශේෂයෙන්ම පුවත්පත් මාධ්‍යයෙන්) ඉංග්‍රීසි සහ සිංහල වාර්තා නිරීක්ෂණයකොට එම පුවත්පත් ලිපි රැස්කර ගන්නා ලදී. දෙමළ භාෂාව දත් කෙනෙකු කාර්යමණ්ඩලයේ නොසිටි බැවින් දෙමළ මාධ්‍ය වාර්තා නිරීක්ෂණය නොකළෙමු. ස්කෑන් කරන ලද මෙම මාධ්‍ය වාර්තාවල පිටපත්, ඉල්ලීමක් ඉදිරිපත් කළහොත් ලබාදිය හැකිය.

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| පොදු | 2011.06.29 | BBC | අසභ්‍ය ජායාරූපවලට පෙනී සිටි ගැහැණු ළමුන් ශ්‍රී ලංකාවේ දකුණු ආසියානු මුස්ලිම් පල්ලිය මගින් නිදහස් කරයි.<br>http://www.bbc.co.uk/news/world-south-asia-13959901?print=true#story_continues_1 |
| පොදු | 2012.02.19 | Lakbima News (ලක්බිම නිව්ස්) | ''මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම හොඳ ප්‍රයත්නයක් නමුත්......''<br>http://www.lakbimanews.lk/index.php?option=com_content&view=article&id=3953:human-rights-action-plan--nice-try-but&catid=35:news-features&Itemid=37 |
| පුරුෂ සමලිංගික | 2007.06.26 | LGBT Asylum News (ඇසිලම් නිව්ස්) | http://www.youtube.com/watch?v=WCiPgrozz-E&feature=player_embedded |
| පුරුෂ සමලිංගික | 2011.10.27 | LGBT Asylum News | http://madikazemi.blogspot.com/2011/10/sri-lankan-gay-man-granted-asylum-in.html |
| පුරුෂ සමලිංගික | 2012.01.18 | LGBT Asylum News | http://madikazemi.blogspot.com/2012/01/video-persecution-of-gay-people-in-sri.html |
| පුරුෂ සමලිංගික | 2011.11.26 | LGBT Asylum News | http://madikazemi.blogspot.com/2011/11/video-sri-lankan-gay-activist-speaks.html |
| පොදු (+) | 2011.11.09 | Daily Mirror | සමලිංගික අයිතිවාසිකම් සම්බන්ධයෙන් අපි ඉන්නේ කොහේ ද?<br>http://www.dailymirror.lk/opinion/14644-where-do-we-stand-on-gay-rights.html |
| පොදු | 2011.11.04 | Daily Mirror | ''කැමරන්ගේ තර්ජනය - ශ්‍රී ලංකාවට කීමට ඇති දේ'' (ස්කෑන් පිටපතක් ඇත.) |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| පොදු | 2011.11.03 | Daily Mirror | ''කැමරන්ගේ සහන කපන ලැයිස්තුවේ ශ්‍රී ලංකාව ද සමලිංගිකයින්ට විරුද්ධ රටවල් අතර'' http://www.dailymirror.lk/news/14463-sl-among-anti-gay-nations-on-camerons-aid-cut-list.html#comments |
| පොදු | 2011.10.30 | The Guardian (ද ගාඩියන්) | "සමලිංගිකත්වය තහනම් කරන රටවල් සහන ලබාගැනීමේ අවදානමක, ඩේවිඩ් කැමරන් අනතුරු අඟවයි" http://www.guardian.co.uk/politics/2011/oct/30/ban-homosexuality-lose-aid-cameron |
| සමලිංගික හීතිකාව | 2011.09.22 | www.lankasri.com | "ශ්‍රී ලංකාවේ සමලිංගිකයින් සංඛ්‍යාව ඉහළ යයි." http://eng.lankasri.com/view.php?22BmSac3CA34e4Y5203lOKdd3Oln20T5Y3e4SMMca3mB52 |
| සමලිංගික හීතිකාව | 2011.09.21 | www.adaderana.lk | "ශ්‍රී ලංකාවේ සමලිංගිකයින් වැඩි වෙයි." - http://www.adaderana.lk/news.php?nid=15105&utm_source=twitterfeed&utm_medium=twitter |
| සමලිංගික හීතිකාව | 2011.09.21 | www.philstar.com | ශ්‍රී ලංකාවේ සමලිංගිකයින්ගේ වර්ධනයක්. http://www.philstar.com/Article.aspx?articleId=729496&publicationSubCategoryId=200 |
| සමලිංගික හීතිකාව | 2011.09.14 | www.lankaenews. com | "ගණිකා වෘත්තිය සහ සමලිංගිකත්වය අතින් ශ්‍රී ලංකාව ඉදිරියෙන්" - http://www.lankaenews.com/English/news.php?id=12247 |
| සමලිංගික හීතිකාව | 2011.09.14 | www.lankapuvath.lk | සමීක්ෂණය : ගණිකාවන් 40,000, සමලිංගිකයින් 35,000 සහ ගණන් නොකළ ස්ත්‍රී සමලිංගිකයින් සංඛ්‍යාවක්. http://www.lankapuvath.lk/index.php/home/behind-the-curtain/behind-the-curtain-2/18389-survey-40000-prostitutes-35000-homosexuals-a-unaccounted-lesbians- |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| පොදු (-) | 2011.09.11 | Sunday Times | **"MR සමලිංගික අයිතීන් තහනම් කරයි."** http://www.sundaytimes.lk/110911/Columns/cafe.html |
| අයාලේ | 2011.08.04 | Daily Mirror | "අයාලේ යන කාන්තාවෝ අත්අඩංගුවට" http://print.dailymirror.lk/news/news/52088.html |
| FTM | 2011.04.05 | The Island (ද අයිලන්ඩ්) | "පුරුෂයකු ලෙසට පෙනී සිටින කාන්තාවක් අත්අඩංගුවට" http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=22479 |
| අන්තර් ලිංගික | 2011.08.25 | Lanka News papers.com | "ශ්‍රී ලංකාවේ ස්ත්‍රී උපත්වලින් 500 කට වැඩි සංඛ්‍යාවක් පිරිමි අවයව සමඟ" http://www.lankanewspapers.com/news/2011/8/70079.html |
| පොදු (+) | 2011.05.15 | The Sunday Leader (ද සන්ඩේ ලීඩර්) | "ලිංගික අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරිනියක වන උපේක්ෂාගේ ජීවන මග" - http://www.thesundayleader.lk/2011/05/15/the-life-journey-of-a-sexual-rights-activist-upeksha/ |
| පොදු (+) | 2011.05.08 | The Sunday Leader | 'මගේ කතාව' ෂර්මන් ඇන්තනී ද රෝස් විසිනි. http://www.thesundayleader.lk/2011/05/08/my-story/ |
| සමලිංගික භීතිකාව | 2010.07.29 | Daily Mirror | "සොබාව ධර්මයට එරෙහි රැල්ල" කතුවැකිය - චම්පිකා ලියනආරච්චි විසිනි. (ස්කෑන් පිටපත ඇත.) අන්තර්ජාලයේ ද ඇත. http://www.dailymirror.lk/print/index.php/editorial/106-editorial/16941.html |
| පොදු (+) | 2010.06.25 | Daily Mirror | "ලංකාව සමලිංගික පිරිස් සමග කතාබහක" (මෙම ලිපිය පිළිබඳ ධනාත්මක සහ සෘණාත්මක අදහස් සඳහා බලන්න) http://www.dailymirror.lk/index.php/news/4626-lanka-for-dialogue-with-gays.html |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| පුරවැසි භාවය (+) | 2010.06.16 | Cat's Eye (කැට්ස් අයි) | පුරවැසිභාවය, සමලිංගිකත්වය සහ සමාන අවස්ථාවන්. http://catseyesrilanka.wordpress.com/2010/06/16/citizenship-homosexuality-and-equal-opportunities/ |
| FTM | 2010.08.23 | Daily Mirror (අන්තර් ජාලයෙනි) | **"ඇත්ත ඇත්තේ එතනයි" - මාතර ක්‍රිෂාන් ජීවක ජයරුක් විසිනි.** http://print.dailymirror.lk/news/front-page-news/19277.html තමාගේ 'ස්වාමිපුරුෂයා' කාන්තාවක් බව හදිසියේම දැනගත් 23 වියැති කාන්තාවක් ඒ ගැන පොලීසියට පැමිණිලි කිරීම සම්බන්ධයෙන් ලිපියකි. |
| | 2010.12.08 | Daily Mirror (අන්තර් ජාලයෙනි) | **"පිරිමියකු ලෙස පෙනී සිටිය කාන්තාවක් ඇප පිට නිදහස්"** - මාතර ක්‍රිෂාන් ජීවන ජයරුක් විසිනි. http://print.dailymirror.lk/news/news/29338.html රිමාන්ඩ් බාරයේ සිටිය දී, රැවටීම සිදුකරන ලද්දැයි සැක කරන පුද්ගලයාගේ ලිංගය පිළිබඳව අධිකරණ වෛද්‍යවරයා විසින් පරීක්ෂා කරන ලද අතර 'ඇයට' එරෙහිව තිබූ චෝදනා පදනම් රහිත බැවින් ඇප පිට නිදහස් කිරීම සම්බන්ධව පළ වූ පසු නඩු විභාගය පෙබරවාරි 15 වෙනිදා දක්වා කල්දමන ලදී. |
| නීති (+) | 2010.07.11 | The Sunday Island (ද සන්ඩේ අයිලන්ඩ්) | **"පුරවැසිභාවය, අභිමානය සහ අගතිග ාමිත්වය"** - කැට්ස් අයි තීරුව http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=1777 සමලිංගික සම්බන්ධතා සහ පුරවැසිභාවය සම්බන්ධ ධනාත්මක ලිපියකි. අන්තර්ජාලයෙන් ද ලබාගත හැක. |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| ලිංගි-කත්වය/ MTF | 2010.06.06 | The Sunday Leader (අන්තර් ජාලයේ පිටපත) | ''සමලිංගික පුරුෂයන් තනි නොකරනු'' රාණී මෙහොමඩ් විසිනි. මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් අනුකම්පාව උපදවන්නකි. MSM නමින් හඳුන්වන විරුද්ධ ලිංගිකයින්ගේ ඇඳුම් අඳින පුරුෂයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ කතාන්දර. |
| ප්‍රයිඩ් (+) | 2010.07.09 | Ground Views (ග්‍රවුන්ඩ් විව්ස්) | "ශ්‍රී ලංකාවේ ප්‍රයිඩ් සැමරීම." http://www.groundviews.org/2010/07/09/celebrating-pride-in-sri-lanka/ |
| පොදු (+) | 2010.07.07 | | "ශ්‍රී ලංකාවේ ස්ත්‍රී සහ පුරුෂ සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්ති ලිංගික සහ අනන්‍යතාවය ප්‍රශ්න කරන පුද්ගලයන් සැමරීම." http://www.groundviews.org/2010/07/07/celebrating-a-lesbian-gay-bisexual-transgender-inquiring-and-queer-sri-lanka/ |
| සමලිංගික භීතිකාව | 2010.08.03 | | "සමලිංගික භීතිකාව සම්බන්ධ කතුවැකියː වෘත්තීමය පැහැරහැරීමක් හෝ නිර්ව්‍යාජ විශ්වාසයක් ද?" http://www.groundviews.org/2010/08/03/a-homophobic-editorial-professional-negligence-or-genuine-belief/ |
| පොදු (+) | 2009.02.03 | The Sunday Times | ''සමලිංගික දිවිනසා ගැනීම්, සමලිංගික ගැටළුː මෙම පුද්ගලයින් පිටස්තරයන් ද?'' - http://sundaytimes.lk/030209/plus/13.html (scroll down to second article) |
| නීති (+) | 2008 මාර්තු | Himal South Asia (හිමාල් දකුණු ආසියා) | "අයාලේ යන්නන්ගේ හඬ" http://www.himalmag.com/Vagrant-voices_nw2138.html |
| නීති (+) | 2008.12.28 | The Sunday Leader (අන්තර් ජාලය) | "සමලිංගිකයින් ද මනුෂ්‍යයන් ය." - කතු වැකිය. ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ SOGI සම්මුතිය අත්සන් කිරීම වැළකීම සම්බන්ධයෙන් වූ සිදුවීමට පිළිතුරු ලිපියකි. |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| පොදු (+) | 2008.07.21 | Pink News (පින්ක් නිවුස්) | make or break සමුළුවේ දී **"රදගුරුතුමා, සමලිංගිකයින් බාර ගන්නා ලෙසට පල්ලියට කියයි"** http://www.pinknews.co.uk/news/articles/2005-8427.html |
| නීති (+) | 2008.03.08 | Daily Mirror | **"ශ්‍රී ලංකාවේ සමලිංගික අයිතිවාසිකම්වල අඩුපාඩු"** - මරිනි ප්‍රනාන්දු විසිනි. දකුණු ආසියානු හිමාල් සඟරාවේ 'Vegrant Voices' හි ප්‍රථමයෙන් පළ විය. (2008 මාර්තු කලාපය) ප්‍රධාන ලිපිය. ශ්‍රී ලංකාවේ සමලිංගික අයිතිවාසිකම් පිළිබඳ ධනාත්මක ලිපියකි. |
| පොදු | 1999.08.15 | The Sunday Leader | ද ස්ට්‍රීට්වෝක් (The Streetwalk) තීරුව-බන්ධුල ජයසේකර විසිනි. **''සමලිංගික ස්ත්‍රීන්ගෙන් කරුණාකර අප බේරාගනී''** ලංකාවේ පළමු ස්ත්‍රී කණ්ඩායම කොළඹ දී, දකුණු ආසියානු ස්ත්‍රී සමලිංගිකයන්ගේ සමුළුවක් පැවැත්වීමට යාම සම්බන්ධයෙන් පළ වූ ලිපියකට පිළිතුරු ලිපියක් වශයෙන් පළ වූ සමලිංගික භීතිකාවක් දනවන ලිපියකි. එම ලිපියෙහි **''එක දිගටම දුම්වැටි උරන කාන්තාවන් නොවන අය''** සහ කාන්තා පාසල් අසල 'මාර්ග බාධක' දමා ස්ත්‍රී සමලිංගිකයින්ගෙන් පාසල් සිසුන් අරක්ෂා කරගැනීම පිළිබඳව සඳහන් වේ. මෙම ලිපිය තර්ජනාත්මකව නිමාවෙන අතර, පොලිස්පති සහ ජනාධිපති ආරක්ෂක අංශයේ නිලධාරීන් නිසි පියවර ගනු ඇතැයි සඳහන් කරයි. (ස්කෑන් කරන ලද පිටපතක් තිබේ.) |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| පොදු | 1999.08.16 | The Sunday Leader | **"තර්ජනාත්මක දුරකථන ඇමතුම් සමඟ ස්ත්‍රී සමලිංගිකයින් පැන යයි."** - අමන්ත පෙරේරා විසිනි. (ස්කෑන් කරන ලද පිටපත් තිබේ. |
| පොදු | 1999.08.20 | The Sunday Island | කතෘට ලිපි පී. අලස් විසින් ලියන ලද **''ස්ත්‍රී සමලිංගික සමුළුව කොළඹ ද?''** (ස්කෑන් කරන ලද පිටපතක් තිබේ.)<br><br>යෝජිත කොළඹ ස්ත්‍රී සමලිංගික සමුළුවට පිළිතුරු ලිපියකි.<br><br>'මගේ මතයට අනුව ස්ත්‍රී සමලිංගි-කයින් ආගමක් නැති, අවිනීත, ස්වභාවධර්මයට එරෙහි අපරාධ කරන පිරිසක් වන අතර, ශිෂ්ට සමාජය විසින් මෙවැනි අපරාධකරුවන් කරන ක්‍රියාවන් ඉවසා සිටිය යුතු නැත. ඔවුන් සමාජයෙන් බැහැර කරන ලද පුද්ගලයන් සේ සැලකිය යුතුය' යනුවෙන් ලිපියෙහි සඳහන් වේ. ලිපිය අවසානයේ දී 'යම් හෙයකින් මෙම ස්ත්‍රී සමලිංගිකයින්ට මෙම සමුළුව පැවැත්වීමට අවසර ලැබුණොත් ලංකාවේ සිටින ස්ත්‍රී දූෂකයන් නිදහස් කරන ලෙසට මම පොලිස් නිලධාරීන්ගෙන් ඉල්ලමි.<br>එසේ කිරීමෙන් මෙම අයාලේ යන අය, සැබෑ රසය කුමක්දැයි වටහාගනු ඇත.' අන්තර්ජාලයෙන් මෙම ලිපිය බලාගත හැකිය.<br>http://iglhrc.org/cgi-bin/iowa/article/takeaction/globalactionalerts/769.html) |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| **සිංහල මාධ්‍ය වාර්තා (2001 - 2013)** | | | |
| සමලිංගික හීතිකාව | 2013.09.25 | නෙත් FM (ගුවන් විදුලිය | බැලුම්ගල ගුවන්විදුලි වැඩසටහන: ''හෝමෝලිංගික සහ NGO'' https://www.youtube.com/watch?feature=player_embedded&v=5cUTT9UjFe0 ආගමික නායකයින් සමග කතා බහක යෙදීමෙන් සමලිංගිකත්වයට පහර ගසන වැඩසටහනකි. බෞද්ධ, කතෝලික, හින්දු සහ ඉස්ලාම් නායකයින් සමලිංගිකත්වයට විරුද්ධව කරුණු දක්වයි. සමහර NGO's විසින් මෙය ව්‍යාප්ත කරන බව මෙහිදී සඳහන් කෙරුණි. නිවේදකයින් කියා සිටියේ සමලිංගිකත්වයෙන් වර්ගයා බෝවීම සිදුනොවන හෙයින් එය හුදෙක් ම රාගය මත පදනම් වූවක් බවය; මෙය කිසියම් කෙනෙකු දූෂණය කිරීමට හෝ මරා දැමීමට ඇතිවන ආශාවක් සහ සමානය. මනෝමය ප්‍රශ්නයක් ලෙසට සමලිංගිකත්වය හඳුන්වා දී තිබුණි. එය සමාජ රෝග පතුරුවන්නකි; මේ මගින් කාන්තා සංවිධානවලට ද පහර එල්ල කරන ලද අතර ලංකාවේ සමහර NGO's සමලිංගිකත්වයට එරෙහිව පවතින නීතිරීති වෙනස් කිරීමට උදව් කරනු ලබන අතර, ඔවුන් නැවැත්විය යුතුයැයි මෙහිදී අවධාරණය කෙරුණි. දෙමාපියන්, ළමුන් ආරක්ෂා කරගත යුතුය. සමලිංගිකත්වයට එරෙහිව ඇති නීති පිළිබඳව නීතිඥයකු කරුණු දක්වා ඇත. |
| ධනාත්මක (+) | 2013.09.14 | විකල්ප | ''කබලෙන් ළිපට'' http://www.vikalpa.org/?p=17678 'සමලිංගික විවාහ' සම්බන්ධයෙන් නෙත් FM හි ගුවන්විදුලි වැඩසටහනට ධනාත්මක පිළිතුරක් ලබා දී ඇත. |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| අර්ධ ධනාත්මක | 2013.09.07 | ලක්බිම | ළමා අපචාර, ඒඩ්ස් සහ සමලිංගිකත්වය පටලවා ගතයුතු නැත. (2013 අගෝස්තු 13 වෙනිදා විකාශන වූ බැලුම්ගල ගුවන්විදුලි වැඩසටහනට පිළිතුරකි.) https://www.facebook.com/photo.php?fbid=707944952555117&set=a.163900603626224.39614.147203948629223&type=1&theater මෙම ලිපිය පුවත්පත විසින් සංස්කරණය කරන ලද අතර, පුවත්පතට අනුව 'සමාජීය සහ සංස්කෘතික' හේතුන් මත මෙහි සඳහන් කොටස් පළ කිරීමට නොහැකිය. සංස්කරණය නොකරන ලද ලිපිය http://www.vikalpa.org/?p=17589 හි ලබාගත හැකිය. |
| ධනාත්මක (+) | 2013.09.09 | විකල්ප | **"සමලිංගිකයින්"** http://www.vikalpa.org/?p=17589 සම ලිංගික විවාහ' පිළිබඳ නෙත් FM ගුවන්විදුලි වැඩසටහන ධනාත්මක පිළිතුරකි. |
| සමලිංගික භීතිකාව | 2013.08.19 | නෙත් FM (ගුවන් විදුලිය | **"සමලිංගික විවාහ"** සම්බන්ධයෙන් බැලුම්ගල ගුවන්විදුලි වැඩසටහන. http://www.youtube.com/watch?v=vkhwORxsa5E#t=505 වෙස්වලාගත් මාධ්‍යවේදියකු 17 හැවිරිදි සංක්‍රාන්ති ලිංගික තරුණයකු සමග මාස 3 ක ඇසුරක් පවත්වා ගෙන ගිය අපහාසාත්මක වැඩසටහනකි. ඔවුන් අතර, ඇති වූ කතාබහ රහසෙන් පටිගතකොට සමලිංගිකත්වය යනු ළමා අපයෝජනය බවට වැරදි ලෙසට මේ මගින් අර්ථකතනය කරන ලදී. |
| සමලිංගික භීතිකාව | 2011.11.06 | www. rivira. lk | ඩේවිඩ් කැමරන්ගේ බ්‍රිතාන්‍ය ආධාර තත්ත්වය සහ අපරාධයක් ලෙස නොසැලකීම සම්බන්ධ නිවේදනය සම්බන්ධව මහජනතාවගේ අදහස්. (ස්කෑන් පිටපතක් ඇත/ඉංග්‍රීසි පරිවර්තනය තිබේ.) |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| සමලිංගික හිතිකාව | 2011.11.06 | www.rivira.lk | බ්‍රිතාන්‍ය ආධාර සඳහා සාපරාධී නොකිරීම සම්බන්ධව ඩේවිඩ් කැමරන්ගේ නිවේදනය සම්බන්ධයෙන් කතුවැකිය. (ස්කෑන් පිටපත ඇත. ඉංග්‍රීසි පරිවර්තනය තිබේ. |
| සංක්‍රාන්ති (FTM) | 2011.10.29 | ලංකාදීප | **"පිරිමියකු සේ වෙස්වලාගත් කාන්තාවක් අත්අඩංගුවට"** (ස්කෑන් පිටපත ඇත.) |
| (+) | 2011.09.30 | www.samabima.info | **ශ්‍රී ලංකාවේ සමලිංගිකයින් සිටී ද? අපි 'කොන්ඩම්' යන වචනය භාවිතා කිරීමට ලැජ්ජා ඇයි?** (රිවිර පුවත්පතෙහි පළ වූ සමලිංගික හිතිකාවක් දනවන ලිපිවලට පිළිතුරු ලිපියක් ලෙසට මෙය පළ විය.) http://www.samabima.info/?p=826 |
| සමලිංගික හිතිකාව | 2011.09.25 | www.rivira.lk | **"සමලිංගිකත්වය පිළිබඳව චෝදනා කරමින්, යුද හමුදාව අපකීර්තියට පත්කිරීම සඳහා NGO වැයමක්"** (ඊට එරෙහිව) http://www.rivira.lk/2011/09/25/vimarshana.html (ස්කෑන් පිටපත තිබේ/ඉංග්‍රීසි පරිවර්තනය තිබේ.) |
| සමලිංගික හිතිකාව | 2011.09.18 | www.rivira.lk | **"රහසේ දළුලන සමලිංගික සංස්කෘතියේ නොදුටු පැතිකඩ"** http://www.rivira.lk/2011/09/18/vimarshana.html (ස්කෑන් පිටපත තිබේ/ඉංග්‍රීසි පරිවර්තනය තිබේ.) |
| සමලිංගික හිතිකාව | 2011.09.18 | www.rivira.lk | සමලිංගික සංවිධාන, රිවිර පුවත්පත සම්බන්ධව, ජනාධිපතිතුමාගෙන් විශේෂ නිවේදනයක්. http://www.rivira.lk/2011/09/18/puwath9.html (ස්කෑන් පිටපත තිබේ/ඉංග්‍රීසි පරිවර්තනය තිබේ.) |
| සමලිංගික හිතිකාව | 2011.09.18 | www.rivira.lk | **"සමලිංගික මධ්‍යස්ථානවලට එරෙහිව රට හඬ නගයි."** http://www.rivira.lk/2011/09/18/vishesha1.html |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| සමලිංගික හීතිකාව | 2011.09.14 | www. dinamina.lk | ශ්‍රී ලංකාවේ පුරුෂ සමලිංගිකයින් 35,000 ක් - ජාතික ඒඩ්ස් හා සමාජ රෝග පාලන ඒකකය. http://www.dinamina.lk/epaper/art.asp?id=2011/09/14/pg09_4&pt=p&h |
| සමලිංගික හීතිකාව | 2011.09.11 | රිවිර | **"සමලිංගික මධ්‍යස්ථාන 24 ක් විවෘත කර ඇත."** 2011.09.10 දින රිවිර අන්තර්ජාල පුවත්පතේ පළ වූ ලිපිය. (ස්කෑන් පිටපත ඇත./ ඉංග්‍රීසි පරිවර්තනය ඇත.) |
| සමලිංගික හීතිකාව | 2011.09.11 | www.rivira.lk | ඡායාරූපයක් සහිත කෙටි ලිපියක්. http://www.rivira.lk/2011/09/11/puwath15.html ඉංග්‍රීසි පරිවර්තනය ඇත. |
| සමලිංගික හීතිකාව | 2011.09.10 | රිවිර | **"සමලිංගිකත්වයට එරෙහි සමලිංගික හීතිකාව සහ මඩ ව්‍යාපාරය"** http://www.puvathlanka.com/NEWS/img/rivira/samalingika/samalinga.html (2011 සැප්තැම්බර් 27 දින සිට මෙම අන්තර්ජාල පිටුව ඉවත් කර ඇත.) ගමන්මගෙහි සහකරුවෝ සංවිධානය පිළිබඳව ගෙන ගිය ඉතා ඉහල සමලිංගික හීතිකාවක් දනවන ලිපියකි. කතුවරයා සමලිංගිකයකු සේ පෙනීසිටිමින් මෙම කණ්ඩායම හමු වී පසුව මෙම ලිපිය ලියා ඇත. දෙමාපියන්ට අනතුරු ඇඟවීමට සහ ඔවුන්ගේ පුතුන් මෙම රෝගයෙන් ආරක්ෂා කිරීමට මෙම ලිපිය මගින් උත්සාහ කර තිබේ. (ඉංග්‍රීසි පරිවර්තනය ඇත) |
| පිරිමි ගති ඇති (බුච්) | 2011.05.28 | දිවයින | **"සිසුන් අත්අඩංගුවට....."** සුළු හොරකමක් සම්බන්ධයෙන් 17 හැවිරිදි සිසුවියකු සහ ළාබාල සිසුවියන් දෙදෙනෙකු අත්අඩංගුවට. මෙම කණ්ඩායමේ නායකයා පිරිමි ළමයකු සේ කොණ්ඩය කපන ලද වැඩිමහල් සිසුවියක විය. (ස්කෑන් පිටපත තිබේ.) |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| අන්තර් ලිංගික | 2011.08.25 | ලංකාදීප | **"සැත්කමෙන් පසු ළමුන් දෙදෙනෙකුට අලුත් ජීවිත"** හයිපොන්දියාස් නම් අන්තර් ලිංගික තත්ත්වය නිවැරැදි කිරීමේ ශල්‍යකර්මය කරන ලද 8 හැවිරිදි ළමයකු පිළිබඳව මෙම ප්‍රවෘත්තියේ සඳහන් ය. (ඇයගේ ලිංගික/ප්‍රජනන අවයව 'නිවැරැදි' කරන ලදී.) මෙම ළමයා බාහිර වශයෙන් ගැහැණු දරුවකු සේ පෙනුනත්, ඇයගේ ලිංගික අවයව සනාථ කිරීමට අපහසු බව රිජ්වේ ආර්යා ළමා රෝහලේ අධ්‍යක්ෂවරයා විසින් පවසා තිබුණෙන් ශල්‍යකර්මයක් කිරීම මගින් ඇය 'සම්පූර්ණ' ස්ත්‍රී ලිංගිකයකු බවට පත්කරන ලදී. වෛද්‍යවරයාට අනුව ලංකාවේ මෙවැනි සිදුවීම් 500 ක් පමණ ඇත. (ස්කෑන් පිටපත ඇත.) |
| MTF | 2011.05.30 | ලංකාදීප | **"ගැහැණියක සේ වෙස්ගත් දෙදරු පියකු අත්අඩංගුවට"** ගැහැණු ඇඳුම් ඇඳ, මෝටර් සයිකලයෙන් යමින් සිටිය දී 'කාන්තාවක' පොලීසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදී. පොලීසිය විසින් ප්‍රශ්න කිරීමේ දී ඔහු දෙදරු පියකු බව දැනගත් අතර මෙසේ කරන ලද්දේ ඇයි දැයි ඔහුගෙන් විමසූ විට කියා ඇත්තේ ඔහු මෙසේ ගමන් කිරීමට කැමැත්තක් දැක් වූ බවයි. (විනෝදයට එය කළ බවයි.) පොලීසිය පවසන්නේ ඔහු ප්‍රදේශයේ සිදු වූ සුලු මංකොල්ලකෑම්වලට (කාන්තාවන්ගේ රත්තරන් මාල) සම්බන්ධ පුද්ගලයකු බවයි. (ස්කෑන් පිටපත ඇත.) |
| පොදු | 2011.05.08 | ඉරිදා ලක්බිම | **"සමලිංගිකත්වය යනු කුමක් ද?/ එය හොඳ කරන්නේ (මාස 3 කින්) කෙසේ ද?"** යන්න පිළිබඳව පළ වූ විශේෂාංග ලිපියකි. |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| ස්ත්‍රී සමලිංගික | 2010.03.14 | ලංකාදීප | **කේලම් තීරුව - "කෙල්ලන් - කොල්ලන් බලා ගනීවි."** ජාතික දැල්පන්දු කණ්ඩායම සම්බන්ධවයි. දෙමාපියන් විසින් එහි සාමාජිකත්වය දරණ ළමුන් කොල්ලන්ගෙන් නොව කෙල්ලන්ගෙන් ප්‍රවේශම් කරගත යුත්තේ කෙසේ ද? (ස්කෑන් පිටපත ඇත.) |
| පොදු | 2010.05.02 | ඉරිදා දිවයින | **"පුඩිං බෝඩිං, සාඩින් බෝඩිං සහ චමරි බෝඩිං"** - මිත්‍ර ශ්‍රී කරුණානායක විසිනි. කාන්තා නේවාසිකාගාර සම්බන්ධ ලිපියකි. ස්ත්‍රී සමලිංගිකයින්ට කාන්තා නේවාසිකාගාර කදිම ස්ථානයක් බව මෙහි එක් ඡේදයකින් කියැවේ. කල්ගතවීමට මත්තෙන් මෙය නියපොත්තෙන් කඩා දැමිය යුත්තක් බව කතෘවරයා පෙන්වා දෙනු ලබයි. 80 හෝ 90 දශකයට සමගාමීව අද කාන්තා සමලිංගික ක්‍රියාකාරකම්වල අඩුවක් දක්නට ලැබෙන අතර, දෙමාපියන් විසින් සිය දරුවන් මෙවැනි අස්වාභාවික ක්‍රියාකාරකම්වල යෙදීම පිළිබඳව සොයා බැලීම සහ දැනුවත්භාවය මීට හේතුවක් වියහැකිය. (ස්කෑන් පිටපත ඇත.) |
| පොදු/ MTF | 2010.05.09 | ඉරිදා දිවයින | **"බෝඩිංවල තහනම් ගෙඩි කන ඉලන්දාරි"** - මිත්‍ර ශ්‍රී කරුණානායක විසිනි. පිරිමි නේවාසිකාගාර පිළිබඳ ලිපියකි. 'කෙලි කොල්ලන්ට කාමර කුලියට දෙන සමලිංගික නේවාසිකාගාර අයිතිකරුවන් පිළිබඳව එක ඡේදයක් අඩංගු ය. (ස්කෑන් පිටපත ඇත.) |
| MTF | 2010.08.31 | ලංකාදීප | **"අවුරුදු 18 දී සිට ගැහැණු ළමයකු සේ වෙස්වලාගත් පිරිමි ළමයෙක්"** පාරේ සිදුවුණු රණ්ඩුවක දී, අවු.27 වියේදී එළිවෙයි. (ස්කෑන් පිටපත ඇත.) |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| FTM | 2010.08.23 | ලංකාදීප | **"ජංගම දුරකථන ප්‍රේම සම්බන්ධතාවයකින් පසුව හමුදා නිලධාරියකු ලෙසට වෙස්වලාගත් කාන්තාවක්, කාන්තාවක් කසාද බඳියි"** - (ස්කෑන් පිටපත ඇත.) හමුදා නිලධාරියකු ලෙසට වෙස්වලාගත් 30 හැවිරිදි කාන්තාවක් ජංගම දුරකථනය මාර්ගයෙන් තවත් කාන්තාවක සමඟ ප්‍රේම සම්බන්ධතාවයක් අරඹයි. 2009 නොවැම්බර් 29 දින චෝදනා ලැබූ මෙම පුද්ගලයා ඇයගේ 'බිරිඳ සමඟ විවාහ වී ඇත. ඇයගේ ජයාරූප යැයි කියමින් චෝදනා ලැබූ පුද්ගලයා යුද හමුදා නිලධාරියකුගේ ජායාරූප පෙන්වා තිබේ. චෝදනා ලැබූ පුද්ගලයා පිරිමියකු නොවන බව හෙළි වී ඇත්තේ ඇයගේ 'බිරිඳ සමඟ බීමත්ව නිවසට පැමිණීමෙන් පසු ඇති වූ සිද්ධියක දී ය. චෝදනා ලැබූ පුද්ගලයා විවාහක දෙදරු මවක් බවට පොලීස් පරීක්ෂණවල දී අනාවරණය විය. |
| ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය | 2010.08.17 | දිවයින | **"හඳුනා වෙන්කරගත නොහැකි ඇඳුම් හේතුවෙන් පිරිමි වාට්ටුවට ඇතුළත් කරයි."** - බලපිටියේ සිදුවූවකි. ඇය පිරිමියකු සේ හැසිරීමට ද කැමති ය. කොටට කොණ්ඩය කපා ටී ෂර්ටයක් සහ දිග කලිසමක් අඳියි. දියණියන් 4 කුගේ මවක් වන ඈ රක්‍ෂණ සමාගමක රැකියාවක නියුතු අතර මෝටර් සයිකලයක් පදවයි. රැකියාවට යන අතරතුරක දී ඇයට දිනෙක අනතුරක් සිදුවී ඇත. මෙම සිදුවීම දකින ලද අසල්වැසියන් සහ ප්‍රදේශයේ පිරිස ඇය රෝහලට රැගෙන ගිය අතර, ඇය පිරිමි වාට්ටුවට ඇතුළත් කරන ලදී. තුවාලවලට ප්‍රතිකාර කරන අතරතුර හෙදියන්ට ඇය පිරිමියකු නොවන බවත් කාන්තාවක් වන බවත් තේරුම් ගිය අතර, වහාම ඔවුන් විසින් ඇය ගැහැණු වාට්ටුවට ඇතුළත් කොට ඇත. පිරිමියකුගේ ඇඳුම් නොමැතිව, ගැහැණු ඇඳුම් ඇන්දේ නම් මෙසේ සිදුනොවන බව හෙදියෝ පෙන්වා දුන්හ. |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| ද්විත්ව සියදිවි නසා ගැනීම/ සැක සහිත මරණ | 2009.08.24 | ලංකාදීප | කොළඹ මෙහෙකාර සේවයේ නියුතු වතුකරයේ තරුණ ගැහැණු ළමුන් දෙදෙනාගේ සැක සහිත මරණ. තේ වත්තක එකට හැදුන වැඩුණු ගැහැණු ළමුන් දෙදෙනෙකු, දුපපත්කම හේතුවෙන් කොළඹ එක ළඟ පිහිටි ගෙවල් දෙකක මෙහෙකාර සේවයේ යෙදී සිට සෑම රාත්‍රියකම දෙදෙනාට එකට සිටීමට නොහැකිවීම හේතුවෙන් සියදිවි හානිකර ගැනීම සම්බන්ධයෙන් නිර්මාණාත්මක තීරු ලිපියකි. |
| | 2009.08.28 | දිවයින | 2009 අගෝස්තු 15 දින බෞද්ධාලෝක මාවතේ ඇලක තිබිය දී හමු වූ තරුණ ගැහැණු ළමුන් (වයස 14 සහ 13) දෙදෙනාගේ සැකසහිත මරණය සම්බන්ධව ප්‍රවෘත්තියකි. දෙදෙනාම තේ වත්තක සිට පැමිණ එක ළඟ පිහිටි නිවාස දෙකක මෙහෙකාර සේවයේ යෙදී සිට ඇත. ගැහැණු ළමුන්ගේ නම්, ලෙච්චමී සුමති (14) සහ මධුරවීරන් ජීවරාණි (13) වේ. ඔවුන් දෙදෙනාගේ මරණය සැක සහිත බව දෙමාපියන් පවසයි. |
| | 2009.09.15 | ලංකාදීප | ඉහත සිදුවීම සම්බන්ධව ප්‍රවෘත්තියකි. ප්‍රශ්න කිරීම සඳහා හාම්පුතුන්ව කැඳවයි. මෙම සිද්ධිය පිළිබඳ වැඩිපුර පරීක්ෂණ ඉදිරියට. |
| සියදිවි හානිකර ගැනීම් | 2009.07.23 | ලංකාදීප | ශිෂ්‍ය නායකයින් විසින් ජංගම දුරකථනය ලබාගත් නිසා කොළඹ පාසැලක දැරියක සියදිවි හානිකර ගනී. පාසැලේ වැසිකිළිය තුළ තම ටයිපටිය භාවිතාකර ගෙලවැළ දා සියදිවි නසාගැනීමට තැත් කිරීම පිළිබඳ ප්‍රවෘත්තියකි. |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| | 2009.07.27 | ලංකාදීප | රෝහලේ දී එම සිසුවියගේ මරණය පිළිබඳ ප්‍රවෘත්තිය |
| | 2009.07.27 | ලංකාදීප | මරණය සම්බන්ධව මහේස්ත්‍රාත්තුමාගේ ප්‍රශ්න කිරීම සම්බන්ධ ප්‍රවෘත්තිය |
| | 2009.07.09 | ලංකාදීප | අධ්‍යාපන අමාත්‍යාංශය, පාසැලේ විදුහල්පතිනියගෙන් පැහැදිලි කිරීමක් ඉල්ලීම සම්බන්ධ ප්‍රවෘත්තිය |
| | 2009.07.29 | දිවයින | සාක්ෂිකරුවන් උසාවියට කැඳවීම සම්බන්ධව ප්‍රවෘත්තිය |
| | 2009.08.02 | රාවය | පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් මරණයට පත්වුන සිසුවිය සම්බන්ධව පැතිර ගිය කටකතා පිළිබඳව විශේෂාංග ලිපිය; ඇයට නරක චරිතයක් තිබුණි; ජංගම දුරකථනයේ අසභ්‍ය ලිංගික වීඩියෝ දර්ශන තිබුණු බැවින් එය ඇගෙන් ගන්නා ලදී; ඇය එම අසභ්‍ය ලිංගික චිත්‍රපටවල සිටියා ය; ඇය අසාමාන්‍ය ජීවිතයක් ගෙන ගිය අතර, අධ්‍යාපනය පිළිබඳව උනන්දුවක් නොදැක්වූවා ය. |
| | 2009.08.02 | ලක්බිම | ඉහත සිදුවීම සම්බන්ධව පසුවිපරම් ලිපි. |
| | 2009.08.25 | ලංකාදීප | එම සිදුවීම සම්බන්ධයෙන් පසුවිපරම් ලිපි. |
| | 2009.09.03 | ලංකාදීප | |
| | 2009.09.16 | දිවයින | |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| අතුරු දහන්වීම්/ පැහැර ගැනීම් | 2009.06.30 | දිවයින | **''ගැහැණු ළමයෙකුට අතවර කරන ලද කාන්තාවක් අත්අඩංගුවට''**<br>20 හැවිරිදි කාන්තාවක විසින් 14 හැවිරිදි ගැහැණු ළමයෙකුට අතවරකර පැහැරගෙන යාමේ සිදුවීම, කටුනායක පදිංචි 20 හැවිරිදි ගැහැණු ළමයකු විසින් 14 හැවිරිදි ගැහැණු ළමයෙකුට ලිංගික අතවර සිදුකිරීම සම්බන්ධව ප්‍රවෘත්තියකි. පොලීසියේ ළමා හා කාන්තා අංශයට මෙම සිදුවීම වාර්තා වී ඇත. 20 හැවිරිදි තරුණ කාන්තාව, 14 හැවිරිදි ළමයාගේ සහෝදරියකගේ යහළුවකු වේ. වැඩිමහල් ගැහැණු ළමයා ඇයගේ යහළුවාගේ ගෙදර පැවති පියාගේ දානයකට රාත්‍රිය එහි ගතකරන ලද අතර, මෙම ළමයා පැහැරගෙන අනුරාධපුරයට ගොස් යෝගට් නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක රැකියාවක් ද සොයාගෙන ඇත. |
| | 2009.07.02 | ලක්බිම | **''ගැහැණු ළමයකුට හිංසා කරන ලද කාන්තාව රිමාන්ඩ් බාරයේ''**<br>14 හැවිරිදි කාන්තාවක් පිළිබඳ ප්‍රවෘත්තියකි. වැඩිමහල් ගැහැණු ළමයාට බාල ගැහැණු ළමයා හමු වී ඇත්තේ ඇයගේ ගෙදර පැවති පියාගේ දානයක දී ය. දින කිහිපයක්ම දෙදෙනාම එකම ඇඳෙහි නිදාගෙන තිබේ. එක් දිනක් පාසල් යන මුවාවෙන් වැඩිමහල් ළමයාත් සමඟ අනුරාධපුරයට ගොස් ඇත. මසක පමණ කාලයක් ඔවුන් රහසේම අනුරාධපුරයේ ජීවත් වී ඇත. වැඩිමහල් ගැහැණු ළමයා ඇයගේ මිතුරන් සමඟ සමලිංගික ක්‍රියාකාරකම්වල යෙදී සිටිය බව පරීක්ෂණවල දී අනාවරණය වී ඇත. ඊට ප්‍රථමයෙන් ඇයට පෙම්වතකු සිට ඇත. ඔහුගෙන් වෙන්වීමත් සමඟ ඇය සමලිංගික ක්‍රියාකාරකම්වලට යොමු වී ඇතැයි කියැවේ. ළමා හා කාන්තා කාර්යාංශයට මෙවැන්නක් වාර්තා වූ පළමු වතාව මෙය බව කියයි. |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| FTM | 2009.05.17 | ඉරිදා දිවයින | **"පිරිමි ලෙසට ඇඳගත් ගැහැණු සහ පිරිමි ලෙසට වෙස්වලාගත් ගැහැණු"** - මිත්‍ර ශ්‍රී කරුණානායක විසිනි. ස්ත්‍රී සමලිංගිකයින් පිළිබඳ භීතිකාවක් දනවන ලිපියකි. කතුවරයා එය මානසික සහ මනෝමය රෝග යක් ලෙසට හඳුන්වයි. ඔහු මානව විද්‍යාඥයෙක් ලෙසට තමාව හඳුන්වා ගන්නා අතර, කොල්ලන් ලෙසට හැසිරෙන ස්ත්‍රී සමලිංගිකයින් සහ ඔවුන්ගේ ජීවිත පිළිබඳව සමීපව අධ්‍යයනය කර ඇති බවත්, ඔහු සඳහන් කරයි. සියලුදෙනාම පතාලකරුවන් විසින් යොදාගන්නා නොනවත්වා දුම්පානය කරන පිරිසක් බව කියා සිටී. ළා බාල වයසේ පටන්ම කොල්ලන් සේ හැසිරෙන දියණියන් පිළිබඳව සොයා බලන ලෙසට දෙමාපියන්ට ලේඛකයා අවවාද කරයි. |
| FTM | 2009.01.03 | ලංකාදීප | **"වසර 20 ක් පිරිමියකු ලෙසට වෙස්වලාගෙන සිටි පුද්ගලයකු පොලීසියේ දී කාන්තාවක වෙයි."** අවුරුදු 20 ට අධික කාලයක් පිරිමියකු ලෙසට වෙස්වලාගෙන සිටි කාන්තාවක පිළිබඳ ප්‍රවෘත්තියකි. සුලු මංකොල්ලයක් සම්බන්ධයෙන් ඔහු අත්අඩංගුවට පත් වූ අතර, එහි දී ඇය කාන්තාවක බව අනාවරණය විය. ඇයගේ පිරිමි ඇඳුම් ඒ වෙලාවෙහිම උනා දමූ පොලීසිය ඇයට ගැහැණු ඇඳුම් අන්දවා ඇය ගැහැණියක බවට පත් කරන කළේය. මෙහිදී සිදුකරන ලද පර්යේෂණවල දී අනාවරණ වී ඇත්තේ ඇය සම්පූර්ණ කාන්තාවක ලෙසට උපත ලබා ඇති බවත් කිසිදු ලිංගික ප්‍රශ්නයක් නැති බවත් ය. |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| දැන්වීමකි | 2008.12.28 | ලක්බිම | **"සමලිංගිකත්වයට ඇබ්බැහිවීම"**<br>(ස්කෑන් පිටපත ඇත.)<br>ඔබ සමලිංගිකත්වයට ඇබ්බැහි වී ඇත් ද? විරුද්ධ ලිංගිකයින්ට ඔබ ප්‍රිය නොකරයි ද? මේ නිසා ඔබ පීඩා විඳිනවා ද? මෙයින් ගැලවීමට ඔබ කැමති ද? සමලිංගිකත්වය සම්පූර්ණයෙන් සුව කළ හැක. එය කිරීමට හැකි ලංකාවේ සිටින එකම සායනය අපයි. රෝග විනිශ්චය පළපුරුදු වෛද්‍යවරුන් සහ මනෝ වෛද්‍යවරුන් මගිනි.<br>ශ්‍රී සෙත් සායනය - 071-8303030 |
| පොදු | 2005.09.05 | ඉරිදා ලක්බිම | **"අන්තර්ජාල භාවිතය හේතුවෙන් අස්වාභාවික ක්‍රියාවල වර්ධනයක්"**<br>'අස්වාභාවික ක්‍රියා' වන්හි යෙදීම හේතුවෙන් අත්අඩංගුවට පත් වී ඇති පුද්ගලයන්ගේ වැඩිවීමක් ඇති බව කියවෙන ලිපියකි. පිරිමි දෙදෙනෙකු, ගැහැණු දෙදෙනෙකු හෝ පිරිමියෙකු, කාන්තාවක සහ සතෙකු අතර සිදුවන අස්වාභාවික ලිංගික ක්‍රියාකාරකම් හැඳින්වීමට මෙය යොදාගෙන ඇත. මෙම ලිපියට අනුව සමහර අවස්ථාවල දී පහත දක්වෙන දෑ එම ක්‍රියාකාරකම්වල දී භාවිතා කර ඇත. පිහි; කැපෙන ආයුධ; ලී පොලු; තුවක්කු; පිස්තෝල; ටී56 මැෂින් තුවක්කු; පුපුරණ ද්‍රව්‍ය 1995 සහ 2003 අතර 11 දෙනෙකු මරණයට පත් වී ඇත; 23 දෙනෙකු අස්වාභාවික ලිංගික ක්‍රියාකාරකම් හේතුවෙන් බරපතල තුවාල ලබා ඇත. |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| ද්විත්ව සියදිවි නසා ගැනීම් | 2005.07.22 | ලංකාදීප | **"ගම්පහ දී පාසැල් සිසුවියන් දෙදෙනෙකු දිවි හානි කරගනියි."** දීපිකා ප්‍රියදර්ශනී අල්විස් (15) සහ චානිකා චතුරංගි ප්‍රනාන්දු (15) ළමුන් දෙදෙනා එකිනෙකා බදාගෙන ඉදිරියට එන දුම්රියට පැන්නේ ය. මැරෙන අවස්ථාවේ දී දීපිකා ඇඳගෙන සිටියේ චානිකාගේ ඇඳුම් ය. රේල් පාර අබියස ඔවුන් දෙදෙනාම ඔවුන්ගේ පාසැල් නිල ඇඳුම්, ටයි පටි, සපත්තු සහ බෑග් තබා තිබුණි. දීපිකාට මාරුකර ගැනීමට ඇඳුමක් නොමැති නිසා ඇය චානිකාගේ ගෙදර ගොස් ඇඳුමක් ඇඳගෙන තිබූ බව කියැවේ. මෙසේ සිදුවීමට හේතු වූ කරුණු සම්බන්ධනේ දෙපාර්ශවයේම දෙමාපියෝ නොදන සිටියහ. |
| | 2005.07.24 | ඉරිදා ලංකාදීප | මේ සම්බන්ධව විශේෂාංග ලිපියක්. |
| FTM | 2005.05.11 | ලංකාදීප | පිරිමි වෙස්ගත් 16 හැවිරිදි අභිකුණ්ටික ස්ත්‍රිය මිනීමැරුමකට සැකපිට අත්අඩංගුවට. |
| සියදිවි නසා ගැනීම | 2005.05.19 | ලංකාදීප | වස බී එකම ගමේ යෙහෙළියන් දෙදෙනෙකු සියදිවි හානි කර ගනී. එක් අයෙකු 24 හැවිරිදි වන අතර අනෙකා 20 හැවිරිදි ය. |
| MTF | 2004.03.10 | ලංකාදීප | **"දඹුල්ල විහාරයේ දී පිරිමි ළමයා ගැහැණු ළමයකු වෙයි."** ලිංගික අපචාර සම්බන්ධයෙන් පිරිමි ළමයකු අත්අඩංගුවට ගන්නා ලදී. පසුව අනාවරණය වූ පරිදි ඔහු ගැහැණු ළමයකු වූ අතර, එසේ අවුරුදු 2 ක කාලයක් පිරිමි ළමයකු ලෙසට වෙස්වලාගෙන සිට ඇත. ඔහු 18 හැවිරිදි වන අතර, ගලවා ගැනීමේ හමුදාවට බාරදෙන ලදී. |
| ලිංගි-කත්වය (+) | 2004.12.12 | රාවය | කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම විසින් ලිංගික අයිතිවාසිකම් පිළිබඳව ලියන ලද පිටුවක ලිපියකි. |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| MTF | 2003.01.18 | ලංකාදීප | **"පිරිමි හමුදා නිලධාරියකු සේ වෙස්ගත් කාන්තා හමුදා නිලධාරියකට ව්‍යාජ හැඳුනුම්පතක් දීම සම්බන්ධයෙන් කොස්තාපල්වරිය අත්අඩංගුවට."** කොස්තාපල්වරියක සමඟ පැවැත් වූ යහලුකම නිසා හමුදා සෙබලියක සේ වෙස්වලාගත් කාන්තාවක් ඔහුගේ ස්ත්‍රී-පුරුෂභාවය 'ස්ත්‍රී' ලෙසට නම්කර ව්‍යාජ හැඳුනුම්පතක් ලබාගැනීමට තැත් කරයි. මෙම ගැහැණු හමුදා නිලධාරියා කුරුණෑගල දී තවත් හමුදා නිලධාරියකු හා සම්බන්ධකමක් පැවැත් වූ බවත්, ඔහුගේ 'බිරිඳ' ජීවත් වූ බවත් අනාවරණය විය. 'ඇය' ගමේ අවුරුදු උත්සවයේ ක්‍රීඩාවලට ද සහභාගි වී ඇත. (උදා: කාන්තා පා පැදි තරඟය, කුඹුරුවල ගොයම් පැල සිටුවීම) |
| MTF | 2003.07.20 | ඉරිදා ලංකාදීප | **"ගැහැණු වෙස්ගත් පිරිමියෙකු"** හෙරොයින් මත් ද්‍රව්‍ය ගනුදෙනුවක දී, රෝහිණී/නිමල් අත්අඩංගුවට පත්විය. පොලීසියේ දී ඔහු ඇත්ත කාන්තාවක නොවේ ය කියා ලැබූ හෝඩුවාවක් අනුව පොලිස් නිලධාරින් විසින් ඔහුගේ ඇඳුම් ගලවා පරීක්ෂා කරන ලදී. එහි දී ඇය පිරිමියකු බව හෙළි විය. වහාම ඔහුට පිරිමි ඇඳුම් ඇන්ද වූවේය. **ඔහුගේ කතාව:** තරුණ අවධියෙහි ඔහුට අමුත්තක් දනී ඇති අතර, නිතරම ලිංගික අතවරවලට ලක් වූ බව කියැවුණි. ඔහුගේ ගම අවිස්සාවේල්ල යි. වයස අවුරුදු 14 දී ඔහු යහලුවකුගේ මාර්ගයෙන් කොළඹට පැමිණියේ ය. එහි දී ඔහු ගැහැණු වෙස්ගත් අතර, සහෝදරියගේ නම වූ රෝහිණී යන්න තමා විසින් ද භාවිතා කරන ලදී. මුදල් උපයාගැනීම සඳහා ඔහු පිරිමි ගණිකාවක වූ අතර, හෙරොයින් භාවිතයට ඇබ්බැහි විය. මීට ඉහත දී මත්ද්‍රව්‍ය භාවිතයට සහ බෙදාහැරීමට එරෙහිව ඔහු අත්අඩංගුවට ගන්නා ලද අතර, අවුරුදු 4 1/2 ක්ම බන්ධනාගාර ගතව සිටින ලද අතර, |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| | | | ඔහුගේ වෙස්වලාගැනීම දිගටම පවත්වා ගැනීමට හැකි විය. ඔහු පරීක්ෂා කිරීම සඳහා සහ ඔහුගේ සත්‍ය ලිංගය සොයා ගැනීම සඳහා ඔහු වෛද්‍යවරයකු වෙතට යැවීමට පොලීසිය විසින් තීරණයකොට තිබේ. |
| MTF | 2003.05.31 | ලංකාදීප | ඇයගේ ලිංග මාරුව සහ ජාතික හැඳුනුම්පතෙහි 'ලිංගය' වෙනස් කිරීමට තැත් කිරීම. |
| | 2003.06.08 | ඉරිදා ලක්බිම | MTF පිළිබඳ විශේෂාංග ලිපිය. වෛද්‍ය සුභාෂ් නෙමින්ද සමරසිංහ, වෛද්‍ය සුභාෂිණී නෙමින්දි සමරසිංහ වූ සිදුවීම; තරුණයකු සේ ඔහු කොළඹ පාසැලක අධ්‍යාපනය ලබා කොළඹ විශ්ව විද්‍යාලයට ඇතුලු වී වෛද්‍ය විද්‍යාව හදෑරුවේය. පසුව ඔහු එඩින්බර්ග් හි රාජකීය වෛද්‍ය කමිටුවේ සාමාජිකයකුවීම සඳහා පිටත් විය. වෛද්‍ය විද්‍යාව ඉගෙන ගැනීම ඔහු ලැබූ වාසනාවක් බව කියැවේ. ඔහු නාරිවේදය සහ ප්‍රසවවේදය සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරයකු වූවේය. (ඔහු බදුල්ල මහ රෝහලේ වෛද්‍යවරයකි.) ඔක්ස්ෆෝඩ් විශ්ව විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබුවේ ය. බ්‍රිතාන්‍යයේ දී ලිංගය වෙනස් කිරීමේ ශල්‍යකර්මයක් කරගෙන තිබේ. ඔහුගේ සිද්ධිය පිළිබඳව ශ්‍රී ලංකා රජයට පහදා දී ඔහුගේ හැඳුනුම්පත ඔහුගේ වෙනස් වූ ලිංගයට එනම් ස්ත්‍රියක් ලෙසින් වෙනස් කිරීමට හැකියාවක් ලැබුණි. මෙම ලිපියෙහි තීරුවක ලිංගය වෙනස්වීම් ඇතිවන්නේ කෙසේ ද සහ ඒ පිළිබඳව විස්තර අඩංගු විය. මෙම ලිපිය වෛද්‍ය R.N.P. රාජපක්ෂ (වතු ක්ෂේත්‍රයේ ප්‍රසව සහ නාරිවෛද්‍ය විශේෂඥ) විසින් ලියා ඇත. |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| ද්විත්ව සියදිවි හානිකර ගැනීම | 2002.08.23 | දිවයින | තරුණ ගැහැණු ළමුන් දෙදෙනා එක්ව සියදිවි හානිකර ගනී. සුජානි හඳපාන්ගොඩ (18) මාතලේ පතිනිගොල්ලෙන් සහ ඉඩම්ගෙදර තාරකා (අනෝමා ලෙස ද හැඳින් වේ) (16) මාතලේ, මිරිස්සවෙල මාස 6 ට පෙර වැඩිහිටියන් විසින් සුජානි පුරුෂයෙකුට විවාහ කරදෙන ලදී. විවාහය අතර තුර දී ඇය තමා අසලට නොපැමිණි බව ඇයගේ සැමියා පවසයි. අගෝස්තු 21 වෙනි දින තරුණියන් දෙදෙනා නිවසෙන් පිට වී සාරියක් භාවිතාකර රබර් වත්තක දී ගෙල වැළදාගෙන තිබේ. ඔවුන් අසල වූ බෑගයක තිබී හමුවූ ලිපිය මගින් කියවුනේ "අපට එකට ජීවත්වීමට නොහැකි නිසා එකට මියයනවා" යනුවෙනි. |
| | 2002.08.23 | ලංකාදීප | ඉහත ප්‍රවෘත්තියම වේ. සියදිවි හානි කර ගැනීමේ ලිපිය පිළිබඳ සඳහන් වේ. නම් ගම් ද වෙනස් කර ඇත. සුනීතා හඳපාන්ගොඩ (20 හැවිරිදි) සහ අයි.ජී. අනෝමා (16 හැවිරිදි) |
| පොදු (+) | 2002.04.28 | දිනකර | අයිතිවාසිකම් රාමුවක් තුළ ස්ත්‍රී සමලිංගිකත්වය සහ සමලිංගිකත්වය පිළිබඳ ධනාත්මක පිටුවක් පුරා පළ වූ ලිපිය. WSG, IGLHRC, COJ සඳහන් කර ඇත. සුනිල් ගාමිණී මහතා විසින් ලියා ඇත. |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| FTM | 2001.03.26 | ලංකාදීප | **"ඉපදීමට පෙර ඇය හා ඇයගේ පවුලේ අය අතහැර දමා ගිය පියා සෙවීම සඳහා කාන්තාවක් පිරිමියකු සේ වෙස් මාරු කර ගනී."**<br>ගලගෙදර (කුරුණෑගල දිස්ත්‍රික්කයේ) සිදුවීමකි. වයස අවු.23 දී ඇයට කිසිදා හමු නොවුන පියා සෙවීමට යෑමේ ආශාව පිළිබඳව ඇය පැවසුවා ය. මේ පිළිබඳව ඇය සිය මවට පවසන විට ඇය ද කියා සිටියේ ඔහුව සොයා ගැනීමට නම් ඇයට පිරිමි වෙස් ගැනීමට සිදුවන බවයි. ඉන්පසුව ඇය තම උපන් ගම අතහැර රෙදි කර්මාන්ත ශාලාවක වැඩ කිරීමට පටන් ගත්තා ය. වැඩකරන අතරතුර ඇය තවත් තරුණියන් දෙදෙනෙකු සමග නිවසක නතර වී සිටි අතර ඔවුහු ඇයගේ 'පිරිමි' පෙනුම පිළිබඳව නිතරම පවසන ලද්දාහ. ඉන්පසුව පිරිමි වෙස් ගැනීමට ඇය තුළ වූ තිබූ කැමැත්ත නැවත ඉස්මතු වූ අතර, ඇය පිරිමියකු සේ ඇඳුම් ඇඳීමට සහ හැසිරීමට පටන් ගත්තා ය. ඇය ගෙදර ගොස් ඇයගේ මවට පවසන ලද්දේ ඇය<br>ලිංගික වශයෙන් පීඩාවකට පත්ව ඇති බව ය. එම දිනෙන් පසු ඇය තරුණයන් ආශ්‍රය කිරීමට පටන් ගත්තා ය, ක්‍රිකට් සෙල්ලම් කළා ය, ගස් නැග්ගාය, සිගරට් පානය කළා ය, ටික කලකට පසු, ඇයගේ පියා සෙවීමට ගිය පසු ඇයට ආගමික ආයතනයක් බලාගත්තෙකු හමු වී ඔහු සමඟ ජීවත්වීමට පටන් ගෙන ඇත. ඔහු සමඟ ජීවත්වන අතර තුර දී ඇය විසින් කාන්තා නොවන ක්‍රියාකාරකම් රාශියක් කරන ලදී. |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| | | | ඇයට, ඇයගේ මිතුරාගෙන් මෙය තවත් දුරට සැඟවීමට නොහැකි වූ විට, ඇයගේ ලිංගික අනන්‍යතාවය පිළිබඳව ඔහුට පවසා ඇත. ඒ පිළිබඳව කිසිවෙකුට නොකියන ලෙසත්, එසේ කිව්වොත් තමා සියදිවි හානි කරගන්නා බවත් ඔහුට කියා තිබේ. මෙම ප්‍රවෘත්තිය මව දැනගත් පසු ඇය පොලීසියට පැමිණිලි කරමින් කියා සිටියේ ලිංගික ප්‍රශ්නයක් තිබෙන තම 'පුතා' සමලිංගික පුරුෂයකුට හසු වී සිටින බවයි. ඉන්පසු, ඇයගේ 'පුතා' සහ ඔහු බලාගන්නා පොලීසියට විසින් කැඳවන ලදී. මෙම කාන්තාවගේ 'පුතා' වෛද්‍ය පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරන ලද අතර, එමගින් දැනගන්නට ලැබුණේ ඇය එවැනි ලිංගික ප්‍රශ්නයකින් පීඩා නොවිඳින බවත්, ඇයව දූෂණයකට ලක්ව ඇති බවත් ය. |
| සිය දිවිහානි/ අභිරහස් මරණ | 2001.11.05 | ලංකාදීප | වයස අවුරුදු 21 සහ 30 හැවිරිදි තරුණියන් දෙදෙනොගේ අභිරහස් මරණය - විශේෂාංග ලිපිය. ගාල්ල දිස්ත්‍රික්කයේ, දොඩංදූව මුහුදු වෙරළට රෙදි කඩකින් අත් බැඳ දැමූ නන්දනී (30) සහ ශානිකා (21) ගේ මළ සිරුරු ගොඩ ගසා තිබිය දී හමුවිය. පොලීසියට සහ පවුලේ අයට මෙම මරණ අභිරහසකි. මිනීමැරුමක, දූෂණයක හෝ ලිංගික අපචාරයක ලක්ෂණ නොවීය. ඔක්තෝබර් 16 වන දින දෙදෙනාම තම පවුලේ අයට කියා සිටියේ විනෝද චාරිකාවක් සඳහා මාතරට යන බවයි. දින 4 ට පසුව ද ඔවුන්ගෙන් කිසිදු පණිවුඩයක් නැති වූ විට දෙමාපියන් විසින් ඒ පිළිබඳව පොලීසියට දන්වන ලදී. |

| තේමාව | දිනය | පුවත්පත/ මාධ්‍ය ආයතනය | විස්තරය |
|---|---|---|---|
| | | | ඔවුන්ගේ සිරුරු දින කිහිපයකට පසුව හමුවී තිබේ. තරුණියන් දෙදෙනාම ඇඟලුම් කම්හලක රැකියාවෙහි නියුතු විය. නන්දනී සුපවයිසර්වරියක වශයෙන් රැකියාවෙහි නියුතුව ඇත. ඔවුන් ඉතාම සමීප මිතුරන් බව රැකියා ස්ථානයෙහි අනෙක් සේවක පිරිස් කියා සිටියහ. එක් අයෙකුට අසනීප වූ විට අනෙක් පුද්ගලයා ඇයව හොඳින් බලාගන්නා බවත්. කෑම දෙන බවත් මෙම සෙසු සේවක පිරිස් විසින් ප්‍රකාශ කරන ලදී. පොලීසිය ඔවුන් එකිනෙකාට ලියන ලද ලිපි සොයා ගන්නා ලද අතර, ඒවා පෙම් හසුන් ස්වරූපයක් ගන්නා ලද බන කියවුණි. ශානිකාගේ දෙමාපියන් පවසා සිටියේ ඇය නිතරම කොට කලිසම් අඳින බවයි. ඔවුන් ශාලිකා විවාහ කරදීම සඳහා සුදුසු මනමාලයකු සොයා දී ඇත. කාන්තාවන් දෙදෙනා පිළිබඳව වැඩිදුරට විස්තර සපයන ලෙසට මහජනයා ගෙන් ඉල්ලමින් මෙම ලිපිය නිමාකර ඇත. |
| FTM | 2001.01.28 | ඉරිදා ලක්බිම | **"පිරිමියකු සේ වෙස්වලාගත් කාන්තාවක් අවුරුදු 1 1/2 ක් ඇයගේ බිරිඳ සමඟ ජීවත් වෙයි."** වයස අවුරුදු 25 දී දේවින්ද්‍ර, බුද්ධිමා (13) විවාහ කරගනී. නීතියෙන් විවාහ වී නැති වුවද, එය විවාහයක් ලෙසට පවුලේ අය විසින් සහ අසල්වාසීන් විසින් පිළිගන්නා ලදී. |
| | 2001.02.04 | ඉරිදා ලක්බිම | පිටුවක් පුරා පළ වූ පසු විපරම් ලිපිය - විශේෂාංග ලිපිය. |
| | 2001.02.11 | ඉරිදා ලක්බිම | |